ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

2019 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ ගිණුම්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

දැක්ම

ගංවතුරින් තොර පරිසර හිතකාමී පරිසරයක් සහ දූෂණයෙන් තොර ජලාශ ඇතිකිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

ඉහළ අභිප්‍රේරණයක් සහිත ශ්‍රම බලකායක් මඟින් විශිෂ්ට කාර්ය සාධනයක් අත් පත් කර ගැනීමෙන්,

- ✓ *ජලාපවහනය වැඩි දියුණු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ගංවතුර කළමනාකරණ කාර්යයන්, ජලාපවහන උපදේශන කාර්යයන් සහ පහත් බිම් කළමනාකරණ කටයුතු*

- ✓ *යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගොඩකිරීමේ කාර්යයන් තුළින් ස්වයං තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීම සහ පවත්නා වත්කම්වලින් සහ නව ව්‍යාපාර අවස්ථාවලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම*

සඳහා ඉංජිනේරු හා කළමනාකරණ සේවා සැපයීම.

පටුන

	පිටු අංකය
සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවුඩය	**01**
ආයතනික තොරතුරු	**02**
අධ්‍යක්ෂ මණ්ඩලය	**03**
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	**04**
සංවිධාන ව්‍යුහය	**05**
මෙහෙයුම් සමාලෝචනය	**06**
මූල්‍ය සමාලෝචනය	**63**
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	**64**
විගණකාධිපති වාර්තාව	**65**
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	**79**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	**80**
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය	**81**
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	**82**
සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	**83**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**87**
සංස්ථාවේ මූල්‍ය විශේෂතා	**98**

සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවුඩය

2019 අප්‍රේල් 21 වන දින සිදුවූ බෙදජනක සිදුවීම් හේතුවෙන් රටේ ආර්ථික ප්‍රගතිය කෙරෙහි ඇති වූ බලපෑම සමඟින් 2019 වර්ෂය සත්‍ය වශයෙන්ම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අභියෝගාත්මක වර්ෂයක් විය. 2019 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයට පෙර පැවති දේශපාලන අවිනිශ්චිතතාවය හේතුවෙන් තවදුරටත් ආර්ථික ක්‍රියාකාරකම් සහ ආයතනික විශ්වාසය බලෑමට ලක් විය. පාස්කු ඉරිදා සිදුවීමෙන් ඇති වූ ආර්ථිකය කඩාවැටීම් තත්ත්වය හේතුවෙන් මූල්‍ය සේවා කර්මාන්තය පෙරමුණු කිහිපයකින් අභියෝගයට ලක් විය.

2019 වර්ෂය තුළ සංස්ථාවේ මුළු පිරිවැටුම රු. මිලියන 6538 ක් විය. (ඇළ මාර්ග නඩත්තු කිරීම සහ විශේෂ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද රු.මිලියන 1514ක භාණ්ඩාගාර අරමුදල් සහ වේරස් ගඟ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද රු.මිලියන 1272ක භාණ්ඩාගාර අරමුදල් ඇතුළුව) ඉඩම් විකිණීමෙන් ලැබෙන ආදායම, ගොඩකිරීමේ හා කැණීම් ව්‍යාපෘති, ඉදිකිරීම් ව්‍යාපෘති, අක්-වෙරළ වැලි විකිණීම සහ පොහොර ව්‍යාපෘතිය තුළින් ලැබුණු ආදායම මෙයට ඇතුළත් වේ.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2013 දී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය සඳහා සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 11,050 කි. ව්‍යාපෘතියේ මුළු ජල පෝෂක ප්‍රදේශය වර්ග කි.මී. 55.5 ක් පමණ වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පවතින ජලාපවහන ජාලය වැඩි දියුණු කිරීම මඟින් ගංවතුර අවම කිරීමයි. හරස් ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය කිරීම සමඟ ඇළ මාර්ගවල ජලය ගලා යෑමේ ධාරිතාව ඉහළ නැංවීම මඟින් 2019 වර්ෂය තුළ ගංවතුර අවම කිරීම සඳහා ව්‍යාපෘති අඛණ්ඩව සිදු කරන ලදී. මේ අතර ජලය රඳවා ගැනීමේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා වැව් සහ පොකුණු කිහිපයක් අර්ධ වශයෙන් නිම කර ඇත.

කොළඹ හා ඒ අවට ගංවතුර අවම කිරීම සඳහා ආරම්භ කරන ලද වැඩසටහන යටතේ, සංස්ථාව විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2018 වර්ෂය අවසන් වනවිට කොලොන්නාව වැසි ජල අපවහනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කොලොන්නාව පිහිටා ඇත්තේ කැලණි ගඟේ ගංවතුර තැනිතලාවේ අනාරක්ෂිත ප්‍රදේශය තුළය. කැළණි ගඟ පිටාර ගැලීම හේතුවෙන් මෙන්ම ජලාපවහන ද්‍රෝණියේ ජලය රඳවා ගැනීමේ, ගලා යෑමේ හා පිටතට යෑමේ ධාරිතාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ප්‍රදේශය ගංවතුරට ගොදුරු වේ. 2019 වර්ෂය තුළ බොහෝ බෝක්කුවල වැඩි දියුණු කිරීම් සිදු කර ඇත. මේ දක්වා සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු. මිලියන 226.6කි.

තවද, ගංවතුර අවම කිරීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කිරීමට සංස්ථාවට සිදු වනු ඇත. මෑත අතීතයේ විනාශකාරී ගංවතුර තත්ත්වයන්ට හේතු වූ ස්වාභාවික ජල ප්‍රවාහයන් අවහිර කරන අනවසර ව්‍යුහයන් සහ ඉඩම් ගොඩකිරීම් ඉවත් කරනු ලබන අතර අනාගතයේදී අනවසර ව්‍යුහයන් ඉදිකිරීමට අවකාශ නොලැබෙනු ඇත.

සංස්ථාවේ ආචාර ධර්ම රාමුව තුළ ඉංජිනේරු විශිෂ්ටත්වය සහ සම්පත් උපයෝගී කර ගනිමින් තිරසර, පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උපායමාර්ගික හවුල්කරුවෙකු ලෙස සංස්ථාව රටේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 2020 සඳහා සූදානම් වන මෙම අවස්ථාවේ, ලබා දෙන ලද වටිනා උපදෙස් හා අඛණ්ඩ සහයෝගය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ස්තූතිවන්ත වෙමි. ලබා දෙන ලද නොමද සහයෝගය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලයට සහ සියලුම සේවකයන්ට ස්තූති කිරීමටද මම මෙය අවස්ථාවක් කර ගනිමි. සමාලෝචිත වර්ෂය සාර්ථක කර ගැනීම සඳහා නන් අයුරින් උපකාර කළ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අනෙකුත් ආයතනවල නිලධාරීන්ට, අපගේ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්ට සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ට මාගේ කෘතඥතාවය පළ කරමි.

ඉංජි. ශ්‍රීමති සේනාධීර
සාමාන්‍යාධිකාරී
දිනය:2020.10.03

ආයතනික තොරතුරු

<u>නීතිමය තත්ත්වය</u>

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පෙර කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම්) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් සහ ඉන් පසුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස හඳුන්වනු ලැබූ) 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට මුළු දිවයිනම ආවරණය වන පරිදි එහි අධිකාරි බලය පුළුල් කරන ලදී. 2006 අංක 35 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩකිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමඟින් සංස්ථාව වෙත පවරා ඇත. තවද, 2019 අංක 11 දරන පනතින් සංස්ථාව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස නැවත නම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලය
අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ
රාජගිරිය.
දුරකථන අංකය: 2867369
ඊ-මේල්: mail@sllrdc.lk
වෙබ් අඩවිය: www.landdevelopment.lk

ප්‍රාදේශීය කාර්යාල

- <u>උතුරු කොළඹ</u>
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අවිස්සාවේල්ල පාර
  ඔරුගොඩවත්ත
  වැල්ලම්පිටිය
  දුරකථන අංකය :2532600

- <u>නැගෙනහිර කොළඹ</u>
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක. 28/10 ඒ කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය; 2863205

- <u>දකුණු කොළඹ</u>
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 19, ස්ටැෆෝඩ් පාර,
  කොළඹ 06
  දුරකථන අංකය: 259862

- <u>මුතුරාජවෙල</u>
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 123, කෙළවරපිටිය
  හැඳල, වත්තල.
  දුරකථන අංකය: 3193130

අනුබද්ධිත සමාගම්

- සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO)
  අංක 28/10ඒ, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය:2876608
  ඊ-මේල්: lrdcltd1@gmail.com

- එල්.ආර්.ඩී. සර්විසස් (පෞද්.) සමාගම
  අංක 28/10, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය. 2861948
  ඊ-මේල්: info@lrdcservices.com

විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව
බත්තරමුල්ල.

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව

නීති උපදේශකවරුන්
නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
අළුත්කඩේ
කොළඹ 12

අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර	කාල සීමාව
මේජර් ජනරාල්(විශ්‍රාමික) එම්ආර්ඩබ්ලිව් ද සොයිසා මහතා යුඑස්පී පීඑස්සී එම්එස්සී (ආරක්ෂක)	සභාපති ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	2019.12.06 සිට
රොෂාන් ගුණවර්ධන මහතා	සභාපති ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	2018.12.31 – 2019.11.21
පී ඒ කේ ගුණවර්ධන මහතා	උප සභාපති ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	2018.12.31 – 2019.12.01
ජේ සී වැලිගමගේ මෙය	භාණ්ඩාගාර නියෝජිත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය	2018.05.03 – 2020.12.01
ආචාර්ය ජගත් මුණසිංහ (නිල බලයෙන් පත් වූ සාමාජික)	අධ්‍යක්ෂ අධ්‍යක්ෂ ජනරාල් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව	2016.03.30 – 2020.01.16
එස් මෝහන්රාජ් මහතා	අධ්‍යක්ෂ අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	2017.11.02 – 2020.05.15
ඩී සජ්ජන ද සිල්වා මහතා	අධ්‍යක්ෂ වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය	2019.01.30 – 2019.12.02
ජී එම් ඩී බෝගම්මන මහතා	අධ්‍යක්ෂ ඉංජිනේරු	2018.08.16 – 2019.01.07
ආර් බී එම් ගුණවර්ධන මහතා	අධ්‍යක්ෂ ඉංජිනේරු	2019.01.30 – 2019.12.02

ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

01.	ඉංජි. එම්.ඒ.එස්.එම්.කේ. සේනාධීර මිය	-	සාමාන්‍යාධිකාරි
02.	ඉංජි. ඩබ්.ආර්.සී. ප්‍රනාන්දු මයා	-	අතිරේක සාමාන්‍යාධිකාරි - (සැලසුම් හා නිර්මාණ)
03.	ඉංජි. සී.බී. අමරසිංහ මයා		අතිරේක සාමාන්‍යාධිකාරි - (ක්‍රියාත්මක කිරීම්)
04.	ටී.බී. වන්ද්‍රසේකර මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන)
05.	ඉංජි. ඩබ්ලිව්.එච්. කීර්තිරත්න මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
06.	ජේ.ඒ.පී. කේ. ජයසිංහ මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
07.	ඉංජි. එස්. පී. මුතුමාල මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ගොඩකිරීම්)
08.	ඉංජි. ආර්.එම්.එන්.ඩී. රත්නායක මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
09.	ඉංජි. වයි.පී.සී. ද සිල්වා මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්)
10.	ආචාර්ය එන්.එස්. විජේරත්න මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තෙත් බිම් කළමනාකරණ)
11.	ආචාර්ය එස්.ඩී. ධර්මරත්න මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම් හා ගබඩා)
12.	ඉංජි. ආර්.එම්.එස්.සී. රත්නායක මයා		නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරියත හා යන්ත්‍රෝපකරණ)
13.	ඉංජි. ඕ.වී.ඩබ්.ආර්. ගුණතිලක මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන)
14.	හේමන්ත කමලසිරි මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉඩම් සහ අළෙවිකරණ)
15.	ඒ.එල්.ඒ.එස්.කේ. අඹේගොඩ මයා		වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන)
16.	එච්.කේ.කේ.ඩබ්. ඒකනායක මයා	-	ප්‍රධාන නීති නිලධාරි
17.	ඉංජි පී.එම්.පී. විජේරත්න මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
18.	ඉංජි. එස්.එන්. ගමගේ මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
19.	ඒ.බී.එන්. සහබන්දු මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)
20.	ඉංජි. එස්.ආර්.එම්. ප්‍රසාද් මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (පිරියත හා යන්ත්‍රෝපකරණ)
21.	ඉංජි. කේ.එම්.එන්.කේ. රණසිංහ මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්)
22.	ඉංජි. එම්.එම්.එම්. මවුලර් මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
23.	ඉංජි. එස්.එම්.පී.ඩී. සිරිවර්ධන මයා		වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරි (ජල අපවහන සහ ගොඩකිරීම්)
24.	ඉංජි. එන්.ඒ.ඒ.එස්.වී. නිශ්ශංක මෙය		සහකාර සාමාන්‍යාධිකාරි (සිවිල්)
25.	ඉංජි. එන්.පී.එස්. ද සිල්වා මයා		සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
26.	එල්. ත්‍රිමාවිතාන මයා		සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන)
27.	ඉංජි. පී. පී. විනීතා මිය		සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)

සංවිධාන ව්‍යුහය


CHAIRMAN
GENERAL MANAGER
SECRETARY TO THE BOARD
BOARD OF DIRECTORS
ADDITIONAL GENERAL MANAGER (Planning & Design)
ADDITIONAL GENERAL MANAGER (Implementation)
Senior Management Level
Middle Management level
Junior Management level
Associate Officer level
Management Assistant - Technical
Management Assistant - Non-technical
Primary level Skilled / semi skilled / un skilled

මෙහෙයුම් සමාලෝචනය

ජලාපවහන හා ගොඩකිරීමේ අංශය

භාණ්ඩාගාර අරමුදල් ව්‍යාපෘති ලැබූ ව්‍යාපෘති

1. ඇළ මාර්ග, ජලාශ සහ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම

2019 වර්ෂය තුළ භාණ්ඩාගාරය විසින් ඇළ මාර්ග, ජලාශ සහ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම සඳහා රු. මිලියන 409 ක් සහ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ජලාපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන් සහ ගංවතුර අවම කිරීමේ කාර්යයන් සඳහා රු. මිලියන 237 ක් වෙන් කරන ලදී.

ඇළ මාර්ග නඩත්තු කිරීම:

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) විසින් කොළඹ මහ නගර කලාපයේ ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 44 ක් සහ ද්විතියික ඇළ මාර්ග කි.මී. 52ක් නඩත්තු කරනු ලැබේ.

පහත සඳහන් ජලාශ සහ ඇවිදීමේ මංතීරු SLLDC විසින් නඩත්තු කරනු ලැබේ:

❖ **ජලාශ**

- දියවන්නා (දියත උයන) ජලාශය
- පාර්ලිමේන්තු ජලාශය
- බෙල්ලන්විල වැව
- තලවතුගොඩ ජලාශය
- රම්පලාවත්ත ජල රැඳවුම් පොකුණ

❖ **ඇවිදීමේ මංතීරු**

- දියත උයන
- ජපන් මිත්‍රත්ව මාර්ගය
- කිඹුලාවල
- මාලබේ
- බෙල්ලන්විල
- කටුබැද්ද
- නුගේගොඩ තෙත්බිම් උද්‍යානය
- බොරලැස්ගමුව "කෙළිමඩල"

❖ **අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන්:**

- කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ඇළ ඉවුරු වැඩි දියුණු කිරීම
- පැලියගොඩ පොම්පාගාරය වැඩි දියුණු කිරීම නඩත්තු කිරීම
- ජල රැඳවුම් පොකුණු නිර්මාණය කිරීම
- රොන් මඩ තැන්පත් වූ ඇළ මාර්ග සහ ජලාශ හැරීම
- ප්‍රධාන ජලාපවහන සැලැස්මක් ක්‍රියාවට නැංවීම



1.1. කොළඹ නගරය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග, කුඩා ඇළ මාර්ග සහ ද්විතීයික ඇළ මාර්ග නඩත්තු කිරීම

කොළඹ හා තදාසන්න ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ස්ථානීය ගංවතුර වැළැක්වීමයි. මෙම කාර්යයන් කොළඹ මහ නගර සභාව සහ අනෙකුත් අදාළ පාර්ශවකාර නියෝජිත ආයතනවල සහභාගිත්වයෙන් සිදු කරනු ලැබේ.

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් වේ,

- මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුරු නඩත්තු කිරීම සහ කැලෑව ඉද්ධ පවිත්‍ර කිරීම
- ඇළ මාර්ග හැරීම සහ හාරා ඉවත් කරනු ලබන දෑ ප්‍රවාහනය කිරීම
- ගේබියන් පෙට්ටි භාවිතා කරමින් ඇළ මාර්ග ආරක්ෂා කිරීම
- දියවළ සහ පැති කාණු පිරිසිදු කිරීම ආදිය.

අතින් පිරිසිදු කිරීමට අමතරව, ඇළ බැම්ම සහ ඒ අවට ප්‍රදේශ හැරීමට හා පිරිසිදු කිරීමට ඩ්‍රෙජර්, කැණීම් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර් සහ ට්‍රක් රථ වැනි බර යාන්ත්‍රික උපකරණ සංස්ථාව විසින් යොදවනු ලැබේ.

මෙහෙයුම් කටයුතු සඳහා SLLDC විසින් ඔරුගොඩවත්ත (කොළඹ උතුර), නාවල-කිරිමණ්ඩල මාවත (කොළඹ නැගෙනහිර) සහ කිරුලපන (කොළඹ දකුණ) යන ප්‍රාදේශීය කාර්යාල 03 ක් පවත්වාගෙන යනු ලැබේ.

1.1.a උතුරු කොළඹ



මහවත්ත ඇළ මාර්ගය



සෙබස්තියන් නැගෙනහිර වැව



සෙබස්තියන් දකුණ



උත්තරානන්ද මාවත

- **ප්‍රධාන ගැටලු**

කොළඹ උතුර ප්‍රදේශවල ඇළ මාර්ග ආසන්නයේ නේවාසික ජනගහනය බොහෝ විට අනෙක් ප්‍රදේශවලට වඩා වැඩි වේ. ඇළ මාර්ග අසල ජීවත් වන ජනතාව මනා අධ්‍යාපනයක් නොලැබූ පුද්ගලයන් වන අතර ඇළ මාර්ගයේ සෞන්දර්යාත්මක වටිනාකම පිළිබඳ අඩු දැනුමක් ඇති අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට වගකිව යුතු පළාත් පාලන ආයතන නිසි පරිදි කසළ එකතු කිරීමේ ක්‍රමයක් මෙම ප්‍රදේශවල ක්‍රියාත්මක කර නොමැත.

එම නිසා ඔවුන් පහසුව තකා ඝන අපද්‍රව්‍ය හා වැසිකිලි අපද්‍රව්‍ය ඇළ මාර්ගයට බැහැර කිරීම සිදු කරනු ලැබේ. ඇළ මාර්ගවල ඝන අපද්‍රව්‍ය එකතු කිරීම නඩත්තු කිරීම යටතේ සිදුවන ප්‍රධාන ක්‍රියාකාරකමකි. ජලයේ පවතින කසළ වෙන් කර ගැනීම හා එකතු කිරීම දුෂ්කර කාර්යයක් වන අතර එහිදී පිරිවැය අපතේ යෑම සහ ජල තලයට හා ඒවායේ ජෛව විවිධත්වයට හානි වීමද සිදු වේ.



අසල්වැසියන් විසින් ඇළ මාර්ගයට බැහැර කරන ලද ඝන අපද්‍රව්‍ය එකතු කිරීම



මල අපද්‍රව්‍ය ඇළ මාර්ගවලට බැහැර කිරීම

1.1.b නැගෙනහිර කොළඹ



හීන්-ඇළ ඇළ මාර්ගය



කෝට්ටේ ඇළ මාර්ගය

1.1.c දකුණු කොළඹ



වැල්ලවත්ත ඇළ මාර්ගය



දෙහිවල ඇළ මාර්ගය

2019 වර්ෂය තුළදී කොළඹ ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම සඳහා SLLDC සහභාගි වී ඇති අතර සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 259.45 කි.

1.2 හැමිල්ටන් ඇළ මාර්ගය නඩත්තු කිරීම

2019 වර්ෂය තුළ කැළණි ගඟ අන්තයේ සිට මීගමුව කලපුව දක්වා (දිග කි.මී. 14.3) සහ මීගමුව කලපුවේ සිට මහ ඔය අන්තය දක්වා (දිග කි.මී. 7.7) හැමිල්ටන් ඇළ මාර්ගයෙහි ක්‍රමානුකූල නඩත්තු කාර්යයන් SLLDC විසින් සිදු කර ඇත. නඩත්තු කාර්යයන් යටතේ පහත සඳහන් කාර්යයන් සිදු නර ඇත.

- මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුරු නඩත්තු කිරීම
- ඇළ මාර්ග හැරීමේ කාර්යයන් සහ හාරන ලද ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම
- ගේබියන් පෙට්ටි භාවිතා කර ඇළ ඉවුරු ආරක්ෂා කිරීම



එබැවින් 2019 වර්ෂය සඳහා සිදු කරන ලද නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 21.08 කි.

1.3 පාර්ලිමේන්තුව අවට වැව්/පොකුණු සහ ඒවායේ සම්බන්ධිත ජල පෝෂක ප්‍රදේශ නඩත්තු කිරීම

පාර්ලිමේන්තුව පවා ජලයෙන් යට වූ 2010 නොවැම්බර් මාසයේ ඇති වූ පෙර නොවූ විරූ ගංවතුරට විසඳුමක් ලෙස SLLDC විසින් ජල අපවහන යෝජනා කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. ගංවතුර ඇති වන අවස්ථාවලදී පාර්ලිමේන්තුව සහ චෝටර්ස් එජ්, දියවන්නා උද්‍යානය, රම්පලාවත්ත, තලවතුගොඩ වැනි අවට ප්‍රදේශ ජලයෙන් යටවීමෙන් ආරක්ෂා කර ගැනීම පිණිස භාණ්ඩාගාර අරමුදල් යටතේ මෙම ජලාපවහන පද්ධති නිරන්තරයෙන් නඩත්තු කරනු ලැබේ.

ඇළ මාර්ගවල නඩත්තු කාර්යයන් සඳහා පහත සඳහන් දෑ ඇතුලත් වේ,

- පෝෂක ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
- ජලාශ මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුරු, රක්ෂිත, මායිම් සළකුණු කර ඇති ඇවිදීමේ මංතීරු සහ විනෝදාත්මක ප්‍රදේශ නඩත්තු කිරීම.

- වැව්/පොකුණු හැරීමෙන් ගංවතුර රඳවා ගැනීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම
- වැව්/පොකුණු අනවසරයෙන් අත්පත් කර ගැනීම පාලනය කිරීම
- කිඹුලාවල කෘෂිකාර්මික ඉඩම් බවට පරිවර්තනය කිරීම

1.3. අ. චෝටර්ස් එජ් – දියවන්නා ජලාශය



1.3. ඇ. කිඹුලාවල



මායිම් වෙන්කර ඇති ඇවිදීමේ මංතීරු මඟින් වැව්/ පොකුණු අනවසරයෙන් අත් පත් කර ගැනීම පාලනය කිරීම

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ;

- පවතින ඇවිදීමේ මංතීරුවලින් අනවසර අත්පත් කර ගැනීම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලාශයන්හි ජලයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීම.

ගංවතුරෙන් ආරක්ෂා වීම තුළින් පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ සහ අවට ප්‍රදේශවල පදිංචිකරුවන්ට විශේෂයෙන් ප්‍රතිලාභ අත්වන අතර පොදුවේ ගත් කළ මුළු කොළඹ ප්‍රදේශයටම ප්‍රතිලාභ අත් වේ.

2019 වර්ෂය තුළ පාර්ලිමේන්තුව අවට සහ ඒ ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවල ඇති වැව්/පොකුණු නඩත්තු කටයුතු කාර්යයන් සඳහා වැය වූ මුළු පිරිවැය රු.මිලියන 43.63 කි.

1.4 බෙල්ලන්විල ප්‍රදේශයේ සූර්ය විදුලිබල ලාම්පු පද්ධති ඇතුළුව ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම

බෙල්ලන්විල ප්‍රදේශය ස්වභාවික තෙත්බිම් සහිත වඩාත් වැදගත් ප්‍රදේශවලින් එකක් වන අතර කොළඹ නගරයේ දකුණු කොටසට යාබදව පිහිටි සීග්‍රයෙන් දියුණුවන ප්‍රදේශයකි. වර්ෂා කාලයේදී මෙම ප්‍රදේශයේ නිරන්තරයෙන් ගංවතුර ඇති වේ. වෙරස් ගහ වැසි ජල අපවහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශයේ සමාජ සහ සංස්කෘතික පසුබිමෙහි වටිනාකම ඉහළ නැංවීම සඳහා වැවක් සහ කෘෂිකාර්මික ඉඩම් සමඟ ඇළ මාර්ග පද්ධතියක් ඉදිකිරීම වැනි දීර්ඝ කාලීන ගංවතුර වැළැක්වීමේ කාර්යයන් ක්‍රියාවට නංවන ලදී.

ජලය රඳවා තබා ගැනීමේ සීමාවේ මායිමක් ලෙස ජල අපවහන ක්‍රියාවට නැංවීම් සමඟ බෙල්ලන්විල ඇවිදින මංතීරු සහ බයිසිකල් ධාවන පථය සංවර්ධනය කර ඇත. ඇවිදීමේ මංතීරු සහ බයිසිකල් ධාවන පථයේ ප්‍රධාන අරමුණ වූයේ තවදුරටත් අනවසරයෙන් අත්පත් කර ගැනීම් වළක්වා ගැනීම වේ. ප්‍රධාන අරමුණට අමතරව ඇවිදීමේ මංතීරුවලින් අමතර ප්‍රතිලාභද මහජනතාවට හිමි වේ.

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් වේ,

- ඇවිදීමේ මංතීරු සහ පාපැදි මංතීරු නඩත්තු කිරීම
- ජලාශවල මතුපිට පිරිසිදු කිරීම
- හාත්පස හරිත පරිසරයක ස්වභාවයක් නිර්මාණය කිරීම සඳහා තණ පිඩලි ඇල්ලූ ප්‍රදේශය නඩත්තු කිරීම
- ගහ ඉහළ බෙල්ලන්විල කුරුලු පාරාදීසය සඳහා නිර්මාණය කර ඇති පරිසර සංවර්ධන නඩත්තු කිරීම සහ සුදුසු පරිසර සංවර්ධන නිර්මාණය කිරීම
- විනෝදාත්මක ස්ථාන නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම

SLLDC විසින් නිර්මාණය කරන ලද හරිත නගරයෙහි තිරසාරකත්වය සඳහා මෙම ගොඩනැඟිය හැකි ප්‍රදේශයේ වාර්ෂික නඩත්තු කටයුතු ඉතා වැදගත් වේ.



මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ;

- පවතින ඇවිදීමේ මංතීරුවලින් අනවසර අත්පත් කර ගැනීම් වැළැක්වීම
- පිරිසිදු ජලාශ, වාහන නැවැත්වීමේ ස්ථාන සහ ඇවිදීමේ මංතීරු මඟින් මෙම ප්‍රදේශයේ අවට ව්‍යායාම්වල යෙදීම සඳහා ජනතාව උනන්දු කිරීම තුළින් ජනතාවගේ සෞඛ්‍යය වැඩි දියුණු වීම.
- ජලාශයන්හි ජලයෙහි තත්ත්වය වැඩි දියුණු වීම.
- ගංවතුර කාලවලදී මාර්ගයේ පාංශු ඛාදනය වීම වැළකීම.
- සූර්ය විදුලිබල පද්ධතිය භාවිතා කිරීමෙන් පිරිවැය අවම වීම

එබැවින් කාර්යයන් සිදු කර ඇති අතර 2019 වර්ෂය සඳහා සිදු කර ඇති නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 39.03 කි.

1.4.a වැව් සහ ජලාශ නඩත්තු කිරීම



1.4. b ඇවිදීමේ මංතීරු සහ නාගරික භූමි අලංකරණ කාර්යයන්



1.5 සූර්ය විදුලිබල ලාම්පු පද්ධති ඇතුළුව ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම

වාණිජ අගනුවර සහ එහි තදාසන්න ප්‍රදේශ ආදර්ශ හරිත, පිරිසිදු සහ ජනතා හිතකාමී නගරයක් බවට සංවර්ධනය කිරීම සඳහා කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති ගණනාවක් සම්පූර්ණ කරන ලද අතර දියත උයන උද්‍යානය, නාවල තෙත්බිම් උද්‍යානය, ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගය සංවර්ධනය කිරීම, රම්පලාවත්ත වැව සහ කිඹුලාවල ප්‍රදේශය ඒවායින් කිහිපයකි.

රැලි නැගීම මගින් යාබද ප්‍රධාන මාර්ග සහ වෙනත් වැදගත් ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘති යටතේ නිර්මාණය කරන ලද ජපන් මිත්‍රත්ව මාර්ගය, වෝටර්ස් එජ්, කිඹුලාවල සහ චන්ද්‍රිකා කුමාරණතුංග මාවත වැනි ජල රැඳවුම් ප්‍රදේශ සඳහා පරිසර හිතකාමී තණ පිඩලි ඇල්ලූ ද්වතීයික ඉවුරු සැලසුම් හඳුන්වා දී ඇත. තවද අනවසරයෙන් අත් පත් කරගෙන ඇති ඉඩම් සඳහා ඇවිදීමේ මංතීරු හඳුන්වා දී ඇත.

මෙම උද්‍යාන නඩත්තු කිරීම SLLDC විසින් සිදු කර ඇත.

- ජලාශ නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම
- භාත්පස හරිත පරිසරයක ස්වභාවයක් නිර්මාණය කිරීම සඳහා තණ පිඩලි ඇල්ලූ ප්‍රදේශය නඩත්තු කිරීම
- සංවර්ධනය කරන ලද නාගරික භූමි අලංකරණ සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම (ඉවුරු ඔස්සේ ගස් සිටුවීම)
- සමාජ ක්‍රියාකාරකම් සඳහා ස්ථාන නිර්මාණය වීම (සෑම මට්ටමකම ජනතාව සඳහා පවුල් වශයෙන් නිදහස්ව හැසිරීමේ හැකියාව)
- සංචාරක කර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා බිහිවීම සහ දැකුම්කළු පරිසරයක් ඇති වීම.

1.5.a වෝටර්ස් එජ්



1.5.b කිඹුලාවල





ජපන් මිත්‍රත්ව ඇවිදීමේ මංතීරුව



කිඹුලාවල ඇවිදීමේ මංතීරුව

1.5.c නැගෙනහිර කොළඹ



පාගොඩ තෙත්බිම් උද්‍යානය

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ;

- පවතින ඇවිදීමේ මංතීරුවලින් අනවසර අත්පත් කර ගැනීම් වැළැක්වීම
- පිරිසිදු ජලාශ, වාහන නැවැත්වීමේ ස්ථාන සහ ඇවිදීමේ මංතීරු මඟින් මෙම ප්‍රදේශයේ අවට ව්‍යායාම්වල යෙදීම සඳහා ජනතාව උනන්දු කිරීම තුළින් ජනතාවගේ සෞඛ්‍යය වැඩි දියුණු වීම
- ජලාශයන්හි ජලයෙහි තත්ත්වය වැඩි දියුණු වීම.
- සූර්ය විදුලිබල පද්ධතිය භාවිතා කිරීමෙන් පිරිවැය අවම වීම

2019 වර්ෂය සඳහා සිදු කර ඇති නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 46.76 කි.

2. කොළඹ පුරවර ප්‍රදේශයේ පවතින ද්විතීයික ඇළ මාර්ග සංවර්ධනය, නාගරික භූමි සැකසීම සහ වැඩිදියුණු කිරීම සහ කාර්යාල නඩත්තු කිරීම (මෙම ඇළ මාර්ග කිසිදු ආයතනයකින් නඩත්තු කරනු නොලැබේ.)

කවර හෝ ආයතනයක විෂය පථය යටතට නොගැණෙන බොහෝ ද්විතීයක ඇළ මාර්ග කිසිදු ආයතනයක් විසින් නඩත්තු නොකර පවතී. වගකීමක් නොමැති වීම හේතුවෙන් මෙම කාර්යය සෑම ආයතනයකින්ම පැහැර හැර ඇත. ඇළ මාර්ගය පටු වීම සහ ඇළ මාර්ග සම්බන්ධතාවල පවතින අවහිරතාවයන් සුළු ගංවතුර තත්ත්වයන් ඇති වීම සඳහා හේතු වී ඇත. මෙම ගැටලුව වළක්වා ගැනීම සඳහා මෙම ද්විතීයික ඇළ මාර්ග වැඩි දියුණු කිරීම සහ සම්බන්ධ කිරීම අවශ්‍ය වේ. එබැවින් මෙම ද්විතීයික ඇළ මාර්ගද SLLDC විසින් නඩත්තු කරනු ලැබේ. පවතින ද්විතීයික ඇළ මාර්ග වැඩි දියුණු කිරීම හේතුවෙන් ගංවතුරෙන් තොර පරිසරයක් නිර්මාණය වී ඇත.

ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකරකම් පහත පරිදි වේ,

- ඇළ මාර්ග සහ ඒවායේ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම
- නඩත්තු කාර්ය සඳහා අවශ්‍ය ස්ථාන සඳහා ප්‍රවේශ මාර්ග ලබා දීම
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ මල අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම

මේ යටතේ කොළඹ මහනගර සභා ප්‍රදේශයේ, පෑලියගොඩ ප්‍රදේශයේ සහ කෝට්ටේ නගර සභා ප්‍රදේශයේ වැදගත් ද්විතීයික ඇළ මාර්ග කිහිපයක් නඩත්තු කරනු ලැබේ. ගංවතුර සඳහා වඩාත් සංවේදී ලෙස හඳුනාගෙන ඇති කොළඹ ප්‍රදේශයෙන් පිටත ඇළ මාර්ගද නඩත්තු කරනු ලැබේ.

මේ යටතේ කොළඹ මහනගර සභා ප්‍රදේශයේ ශ්‍රී වික්‍රම ඇළ මාර්ගය, වෙදමුල්ල වැව සහ පෑලියගොඩ ප්‍රදේශයේ අධිවේගී මාර්ග හරස් ඇළ මාර්ග සහ මුදුන් ඇළ මාර්ගයේ (KTU වැඩපොළ අවට) වැදගත් ද්විතීයික ඇළ මාර්ග කිහිපයක් නඩත්තු කරනු ලැබේ. තවද ගංවතුර සඳහා වඩාත් සංවේදී ලෙස හඳුනාගෙන ඇති කොළඹ ප්‍රදේශයෙන් පිටත ඇළ මාර්ගද නඩත්තු කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ;

- ප්‍රදේශයේ ඇති වන ස්ථානීය ගංවතුර හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතා වැළැක්වීම
- සමස්ත ඇළ මාර්ග පද්ධතියෙහි මනා සම්බන්ධතාවයක් නිර්මාණය කිරීම
- සමස්ත පරිසරය පිරිසිදුව සහ අලංකාරව තබා ගැනීම



අධිවේගී මාර්ග හරස් ඇළ මාර්ගය



ශ්‍රී වික්‍රම ඇළ මාර්ගය



වෙදමුල්ල වැව 1



වෙදමුල්ල වැව 2



KTU වැඩපොළ අවට ඇළ මාර්ග

ඒ අනුව මෙම ඇළ මාර්ග නඩත්තු කාර්යයන් සඳහා 2019 වර්ෂයේ මුළු පිරිවැය රු. මිලියන 29.05 කි.

3. ආපදා තත්ත්වයකදී ඉල්ලා සිටින විට පොදු ස්ථානවල ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ ගංවතුර සම්බන්ධ ගැටලු සඳහා පිළියම් යෙදීම

නිරන්තර ගංවතුර යනු ශ්‍රී ලංකාවේ ස්වාභාවික උපද්‍රවයන්හි වඩාත් විනාශකාරී ආකාරයයි. ජීවිත හානි හා දේපල හානි යන දෙකටම මෙය සත්‍යයකි. ස්වාභාවික උපද්‍රවයේ වඩාත් ප්‍රචලිත ස්වරූපයද එයයි. මෙම තත්ත්වය වළක්වා ගැනීම පිණිස සාමාන්‍ය ජනතාවට බලපාන ගැටලු සඳහා පිළියම් යෙදීමට SLLDC විසින් පියවර ගෙන ඇත.

පසුගිය වසරවලදී, සඳහම් මාවත ඇළ මාර්ගයේ සහ දහම්වෙළ ඇළ මාර්ගයේ කිඳ හි අවහිරතා ඉවත් කිරීමේ කාර්යයන්, ගංවතුර කාලයේදී කොලොන්නාව, පෑලියගොඩ ප්‍රදේශය සහ කිඹුලාවල ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම් වැනි බස්නාහිර පළාතේ පිහිටි පොදු ස්ථාන, සංගම් සහ ආගමික ස්ථාන ඔවුන්ගේ ස්ථානවල හා ඒ අවට ඇති ජලාපවහන ගැටලු විසඳීම සඳහා අපගේ ක්ෂණික සහාය ඉල්ලා සිටියේය.

පහත සඳහන් කාර්යයන් සඳහා ඉල්ලීම් සිදු කරන ලදී,

- ගංවතුර කාලවලදී ඇළ මාර්ගවල අවහිරතා පිරිසිදු කිරීම.
- ගංවතුර නිදහසේ ගලායෑමට හැකි වන අයුරින් අනවසර ව්‍යුහයන් ඉවත් කිරීම.
- ජලයෙන් බෝවන රෝග ආදිය අවම කිරීම සඳහා ඇළ මාර්ග පිරිසිදු කිරීම.

2019 වර්ෂය සඳහා මුළු පිරිවැය රු. මිලියන 2.24 කි.

- **අධික ගංවතුර කාලයේදී උතුරු කොළඹ ප්‍රාදේශීය කාර්යාලය විසින් ගනු ලැබූ පිළියම්**



- **පාර්ලිමේන්තු පරිශ්‍රයේ අධික ගංවතුර තත්ත්වයේදී නැගෙනහිර කොළඹ ප්‍රාදේශීය කාර්යාලය විසින් ගනු ලැබූ පිළියම්**



පාර්ලිමේන්තු පරිශ්‍රය වටා සකස් කරන ලද වැලි බාධක

4. කළු ඔය ද්‍රෝණියේ ඇළ මාර්ග නඩත්තු කිරීම

කළු ඔය ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා වැව 5කින් ආරම්භ වන අතර එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය කර අවසානයේ කැළණි ගඟෙන් අවසන් වේ. (ප්‍රධාන හා කුඩා ඇළ මාර්ග ඇතුළුව කිලෝමීටර 12 කට ආසන්න වේ)

- කැළණිය
- බියගම
- වත්තල
- ජා-ඇළ
- මහර

කළු ඔය ද්‍රෝණියේ නේවාසික හා කර්මාන්ත අංශයේ අබණ්ඩ වර්ධනයක් අත්කර ගෙන තිබේ. ඉඩම් මිල අඩු වීම හේතුවෙන් එය නව පදිංචිකරුවන් ආකර්ෂණය කරගෙන ඇත. කොළඹ ජනගහනය වර්ධනය වනවිට එය අනාගත නාගරික ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතා ප්‍රදේශයක් ලෙස දැන් ඉලක්ක කර ඇත. මෙම වේගවත් සංවර්ධනයත් සමඟ ස්වාභාවික උවදුරුවලට ලක් වීමේ අවදානම අවම කිරීම සඳහා වැසි ජල අපවහන ඇතුළු නාගරික යටිතල පහසුකම් කෙරෙහි වැඩි අවධානයක් අවශ්‍ය වේ.

SLLDC විසින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ගවල ඇළ මාර්ග හෑරීම, මඩ ඉවත් කිරීම සහ ඇළ ඉවුරු ආරක්ෂණය සිදු කරනු ලැබේ.

ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ,

- වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් ගංවතුර හානිය අවම කිරීම
- ගංවතුර අවදානම අඩු කිරීමෙන් (හෝ කළමනාකරණය කිරීමෙන්) ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- ප්‍රජාව සඳහා සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම
- සමාජ හා වාණිජ කටයුතුවලට සිදු වන බාධා අවම කිරීම
- පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය අවදානම අඩු කිරීම
- වඩාත් ආකර්ශනීය නාගරික පරිසරයක් නිර්මාණය කිරීම

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 19.76 කි.



කළු ඔය

5. ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් (ගේබියන් කාර්යයන්, පෝරු ටැඹ යෙදීම, RRM බිත්ති, RCC බිත්ති)

කොළඹ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ ජලාපවහන අවශ්‍යතා සපුරාලීම සඳහා ඇළ ඉවුරු පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් මුදල් වෙන් කර ඇත.

වර්ෂ 1992 සිට 1998 දක්වා කාල පරිච්ඡේදය තුළ කොළඹ හා ඒ අවට ඇළ මාර්ග පද්ධතිය ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආදිය සමඟින් සංවර්ධනය කරන ලදී. කෙසේවෙතත්, මහජනයා විසින් ඇති කරන ලද හේතු කිහිපයක් සහ ඇළ ඉවුරු ස්වාභාවික ලෙස බාදනය වීම හේතුවෙන් ඇළ ඉවුරුවල යම් කොටසක් හානියට ලක්ව ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ඇළ ඉවුරුවල බාදනය වීම හා කඩා වැටීම වළක්වා ගැනීම සඳහා මෙන්ම හැකි උපරිම පළල පවත්වා ගැනීම සඳහා කොළඹ උතුරු කලාපය, කොළඹ දකුණු කලාපය සහ කොළඹ නැගෙනහිර කලාපය සහ එහි තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ඇළ මාර්ග ඉවුරු ආරක්ෂා කිරීමට යෝජනා කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශවල පහත සඳහන් සංවර්ධන කටයුතු සිදු කර ඇත.

- SLLDC වැඩපොළ අසල සහ කිරිමණ්ඩල මාවත ක්‍රීඩා පිටිය අසල හීන් ඇළෙහි ගේබියන් බැම්ම ඉදිකිරීම
- බත්තරමුල්ල සුදස්සනාරාම විහාරයේ වැව වැඩිදියුණු කිරීමේ කාර්යයන්තු
- අත්තිඩිය වැව II ඔස්සේ කම්බි දැල් වැටක් ඉදිකිරීම
- කුඩා ක්‍රීඩා පිටිය අසල බඩෝවිට ඇළ ඔස්සේ කම්බි දැල් වැටක් ඉදිකිරීම

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 36.71 කි.



හීන්-ඇළ ඇළ මාර්ගයේ ගේබියන් තාප්ප ඉදි කිරීම



සුදර්ශනාරාම විහාරය අසල වැවෙහි මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්



අත්තිඩිය වැව II ඔස්සේ කම්බි දැල් වැට



බඩෝවිට ඇළ මාර්ගය ඔස්සේ කම්බි දැල් වැට

6. ඇළ මාර්ග සහ වැව ඔස්සේ පවතින නඩත්තු මාර්ගය පුනරුත්ථාපනය කිරීම

කොළඹ පූරවර කලාපයේ ඇළ මාර්ග ජාලය ඔස්සේ පවතින නඩත්තු මාර්ග SLLDC විසින් පුනරුත්ථාපනය කර ඇත.
නඩත්තු මාර්ග වැඩිදියුණු කිරීමෙන් පහත සඳහන් ප්‍රතිඵල සාක්ෂාත් කරගෙන ඇත.

- බර යන්ත්‍ර සූත්‍ර සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම
- ටිපර් රථ සහ ලොරි රථ සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දීම
- යන්ත්‍රසූත්‍ර යෙදවීම සහ නැවත ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දීම.
- ඇළ මාර්ග සහ ඒවායේ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම.
- ඇළ මාර්ගවලට අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම.

තවද, මාර්ග පුනරුත්ථාපනය කිරීම මඟින් කොළඹ නගරය තුළ නව මහහැරයෑමේ මාර්ග නිර්මාණය කරනු ඇති අතර එය වර්තමාන වාහන තදබදය අඩු කිරීමට උපකාරී වනු ඇත.
මෙම ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශවල පහත සඳහන් සංවර්ධන කාර්යයන් සිදු කර ඇත.

- ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ සිට ආදර්ශ ගොවිපොළ ඉඩම දක්වා හීන් ඇළ (RHS) ඔස්සේ ගේබියන් බැම්මේ යෝජිත වැඩිදියුණු කිරීමේ කාර්යයන්
- නාරාහේන්පිට - නාවල සහ කිරිමණ්ඩල මාවත අතර මාර්ගයේ යෝජිත බෝක්කුව පුළුල් කිරීම



2019 වර්ෂය සඳහා කරන ලද කාර්යයන්වල මූළු පිරිවැය රු. මිලියන 10.32 කි.



හීන් ඇළ ඔස්සේ ගේබියන් තාප්පයේ යෝජිත වැඩිදියුණු කිරීමේ කාර්යයන්



නාවල-නාරාහේන්පිට ලංකා වෝල්ටයිල් ආසන්නයේ පිහිටි බෝක්කුව පුළුල් කිරීම

7. ලුනාව ඇළ මාර්ග පද්ධතියේ N1, N1-iii, S1 සහ S2 ඇළ මාර්ග හැරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සහ ලුනාව වැව හා එහි අවට නාගරික භූමි අලංකරණ

උතුරින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයේ සිට දකුණින් මොරටුව නගර සභා බල ප්‍රදේශය දක්වා කිලෝ මීටර්

6.15 ක් ආවරණය කරමින් ලූනාව වැව කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු පසට වන්නට පිහිටා ඇත. කලපුව විනාශය කරා ගමන් කරමින් පවතින අවධියේදී 2000 වසරේ ජූලි මසදී අන්තර්ජාතික අරමුදල් සමඟින් රජය විසින් ලූනාව පාරිසරික වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය දියත් කරන ලදී.

යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයේ ලූනාව ඇළ මාර්ගය ප්‍රධාන ඇළ මාර්ගය වන අතර, උතුර සිට දකුණ දක්වා දිවෙන පහත් බිම් හරහා ගමන් කර ලූනාව වැව කරා ගලා බසී. ද්‍රෝණිය කුඩා ද්‍රෝණි විශාල සංඛ්‍යාවකින් සෑදී ඇති අතර ඒවායින් වැවෙහි බස්නාහිර සහ දකුණු දිශාවලින් වැසි ජලය සෘජුව වැවට කරා ගෙන එයි. අහුලාන දූම්රිය ස්ථානයට දකුණු දෙසින් පිහිටි දූම්රිය පාලම යටින් ලූනාව වැව මුහුදට සම්බන්ධ වේ.

SLLDC විසින් ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක නඩත්තු කාර්යයන් වාර්ෂිකව සිදු කරනු ලැබේ. කලපුවේ හා ඒ අවට සහ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක හැරීම සහ පුනරුත්ථාපන කටයුතු සමහරක්ද සිදු කළ යුතු වේ. ඒ අනුව සමාජ වගකීමක් ලෙස මහජනයාට ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීම සඳහා ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ පිරිසිදු කිරීමේ හා හැරීම් කටයුතු SLLDC විසින් සිදු කර ඇත

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල වන්නේ,

- ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය සඳහා නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පරිසරයක් නිර්මාණය කිරීම සහ වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් නගරයේ ගෞරවය ඉහළ මට්ටමක තබා ගැනීම.
- අධ්‍යාපනය ඇතුළු ආර්ථික හා සංස්කෘතික කටයුතු සඳහා බොහෝ විට බාධා ඇති වන ව්‍යාපෘති ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීම.
- නාගරික ප්‍රදේශයෙන් වැසි ජලය ලබා ගන්නා ඇළ මාර්ග සහ මුහුදු ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ප්‍රධාන ඇල පද්ධතියේ කොටසක් හැරීම, පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම මඟින් ප්‍රසන්න පරිසරයක් ඇති කිරීම.
- රොන්මඩ ඉවත් කිරීම මඟින් ඇළ මාර්ගයේ ජලය රැගෙන යාමේ ධාරිතාව වැඩි කිරීම.
- වැවට සහ ඇළ මාර්ග පද්ධතියට එක් වන අපද්‍රව්‍ය පාලනය කිරීම.
- ඇළ මාර්ග සහ කලපු සඳහා වෙන්කර ඇති භූමිය බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සහ එහි සිදු වන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම.

එබැවින් 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 19.18 කි.



S1 ඇළ මාර්ගය



S2 ඇළ මාර්ගය



N1 ඇළ මාර්ගය



N1 – iii ඇළ මාර්ගය

8. රාගම පිහිටි පොල්ගහවැව වැව සහ ඉහළ ජලාශය ඇතුළුව රාගම සහ අවට ජලාපවහන පද්ධතිය සහ ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ වැසි කාලයේදී වැසි ජලය එක්රැස් කිරීම සහ රඳවා ගැනීම සහ අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම සඳහා ජල රැඳවුම් ප්‍රදේශ වටා ඇවිදීමේ මංතීරු සකස් කිරීම සහ ජලය ගලා බැසීම වැඩි දියුණු කිරීම මගින් පරිසරය පිරිසිදුව තබා ගැනීම සඳහා වැව් සහ ඒ අවට ප්‍රදේශය නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීමයි.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කාර්යයන්, අවට ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සහ පවත්නා ඇළ මාර්ග වැඩිදියුණු කිරීම ආදිය වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී,

- පොල්ගහවැව ඔස්සේ යෝජිත කම්බි දැල් වැටක් ඉදිකිරීම.
- යන්ත්‍රසූත්‍ර භාවිතා කර තේවත්ත, බැසිලිකා වැව හැරීම, හාරා ඉවත් කරන ද්‍රව්‍ය භාවිතයෙන් ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීම, කොන්ක්‍රීට් ගැටි බැම්ම සකස් කිරීම සහ පොහොර තට්ටුවක් සහිතව ඉවුර ඔස්සේ තණ පිඬලි ඇල්ලීම (buffalo turf)
- බෙනඩික්ට් පාප් වහන්සේ මධ්‍යස්ථානයේ පොකුණ සඳහා කලිභූල (Cofferdam) සකස් කිරීම

• රාගම පේරලන්ද වැව හැරීම

ඒ අනුව 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 40.55 කි.



තේවත්ත බැසිලිකා වැව පුනරුත්ථාපනය කිරීම



රාගම, පේරලන්ද වැව පුනරුත්ථාපනය කිරීම

9. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (CKE) ඔස්සේ පැරණි ලන්දේසි ඇළ හා සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම

CKE අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී අවට ප්‍රදේශය දැඩි ලෙස ජලයෙන් යට විය. ගංවතුර අවදානම අවම කිරීම සහ අභ්‍යන්තර ජලය සම්බන්ධ ගැටලු අවම කිරීම සඳහා පසුකාලීනව පැරණි ලන්දේසි ඇළ මාර්ගය සහ සම්බන්ධිත ජලාශ වැඩිදියුණු කර වැසි ජලයට නිදහස් ප්‍රවාහයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇත.

ඒ අනුව පැරණි ලන්දේසි ඇළ මාර්ගය සහ සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම සඳහා SLLDC නිරන්තරයෙන් කටයුතු කර ඇති අතර 2019 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 15.95 කි.

10. පැලියගොඩ පවතින පොම්පාගාරය (PSP) වැඩි දියුණු කිරීම සහ එහි වාර්ෂික නඩත්තු කිරීම් සහ මෙහෙයුම්

කැලණි ගඟේ පහළ කොටසෙහි ඉහළ ගංවතුර මට්ටම්වලදී පැලියගොඩ ප්‍රදේශයේ වැසි ජලය පොම්ප කිරීම සඳහා පැලියගොඩ දැනට පවතින පොම්පාගාරය ඉදි කරන ලදී. එය මේ වනවිට SLLDC විසින් නඩත්තු කරනු ලබන සිරස් අක්ෂීය පොම්ප (විදුලියෙන් ධාවනය වන) 2 කින් සමන්විත වේ.

2019 අයවැය ප්‍රතිපාදන යටතේ, මේ වනවිට පවතින පැලියගොඩ පොම්පාගාරය සහ එයට ජලය ගලා එන ඇළ මාර්ග නිවැරදි කිරීම හා නඩත්තු කිරීම සඳහා SLLDC සහභාගි වී තිබේ.

මෙහි ප්‍රධාන අරමුණු වූයේ,

- පවතින පොම්පාගාරය සහ එහි පෝෂක ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම
- වාර්ෂික මෙහෙයුම් සහ නඩත්තු කාර්යයන්.

ඉහත ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 5.02 කි.



පොම්පාගාර සඳහා ජලය ගලා එන ඇළ මාර්ගය

11. කටුබැද්දෙහි ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ නාගරික භූමි අලංකරණ සංවර්ධන ව්‍යාපෘතිය

2018. මැයි 20 වැනි දින මෙම උද්‍යානය මහජනයාට විවෘත කෙරිණි. මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, වැවෙහි ධාරිතාව ඉහළ නැංවීම සහ අවට ප්‍රදේශය තවදුරටත් අනවසරයෙන් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා වීම, විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කටයුතු, නගර සංවර්ධන පිරවුම් සහ අවට සංවර්ධනයන් ආදිය හේතුවෙන් වෙනස්වීවලට ලක් වූ පවතින ඇළ මාර්ග පද්ධති සහ වැව් වැඩිදියුණු කිරීම යනාදියයි.

කටුබැද්ද වැව, වාහන නැවැත්වීමේ ප්‍රදේශය සහ වැව් බැම්ම ඔස්සේ ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම සහ පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ ඇළ මාර්ග පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම යනාදිය මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ,

- අවම අමුද්‍රව්‍ය (කළුගල් සහ වැලි) භාවිතයක් යටතේ තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශ මඟින් පරිසරයට හරිත පෙනුමක් ලබා දීම
- නාගරික භූමි අලංකරණ වැඩි දියුණු කිරීම (ඉවුර ඔස්සේ රුක් රෝපණය)
- සූර්ය ආලෝක පද්ධතිය ඇතුළුව නිර්මාණය කරන ලද අවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ස්ථාන නඩත්තු කිරීම.
- නිර්මාණය කරන ලද නව රැකියා අවස්ථා සහ දර්ශන සුන්දරත්වය පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම
- ඇළ මාර්ගවල නිදහස් ගලනයට පහසුකම් සැලසීම සඳහා පවතින ජල අපවහන පද්ධති වැඩි දියුණු කිරීම
- මහජනතාව සඳහා හරිත සහ ගංවතුරින් තොර පරිසරයක් නිර්මාණය කිරීම
- ප්‍රදේශයේ දේපලවල වාණිජ වටිනාකම ඉහළ නැංවීම

ඒ අනුව, SLLDC විසින් කටුබැද්ද ඇවිදීමේ මංතීරුවේ නඩත්තු කටයුතු සිදු කර ඇති අතර 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 9.29 කි.



කටුබැද්ද ඇවිදීමේ මංතීරුවේ නඩත්තු කාර්යයන්

12. බස්නාහිර පළාත තුළ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ ජලාපවහනය වැඩි දියුණු කිරීම

නිරන්තරයෙන් සිදුවන ගංවතුර හේතුවෙන් ඇති වන ජීවිත හානි හා දේපළ හානි අවම කිරීම සඳහා ජලාපවහන වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරන ලදී. එය ශ්‍රී ලංකාවේ ස්වාභාවික උපද්‍රවයන්හි වඩාත් විනාශකාරී ස්වරූපයයි.

ඉහත කාර්යයන් යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී:

- අඹතලේ ඇළ මාර්ගය හැරීම
- අංගොඩ මන්ඩාවිල වැව හැරීම
- කලපලුවාව, නෙළුම්පෙදෙස වගුරු බිම් ප්‍රදේශය වැඩි දියුණු කිරීම
- දියවන්නා වැව හැරීම (ජලය මත ගමන් කළ හැකි ගුවන් යානා නවතන ප්‍රදේශය)

ඒ අනුව, 2019 වර්ෂය සඳහා කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 43.05 කි.

13. කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත අපවහන වැඩි දියුණු කිරීමේ සහ නාගරික භූමි අලංකරණ ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ප්‍රධාන නගර සහ ස්ථානවල වැව් පුනරුත්ථාපනය කිරීම, රොන්මඩ ඉවත් කිරීම සහ අනවසරයෙන් අත්පත් කරගන්නන් විසින් සිදුකර ඇති නීතිවිරෝධී පිරවීම් හැරීම, වැව් බැම්ම ඔස්සේ ඇවිදීමේ මංතීරු ඉදිකිරීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ සංවර්ධනයට අදාළ ඇළ මාර්ග පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම යනාදියයි.

2019 වර්ෂය තුළදී, වස්කඩුව ප්‍රදේශය අවට පවතින ගංවතුර අවදානම විසඳීම සඳහා කළුතර මහා සහ කුඩා වස්කඩුව ප්‍රදේශය සඳහා සිරිනිවාස පාරේ සිට මෝය දක්වා ඉවුරු ආරක්ෂණ ඉදිකිරීමේ කාර්යයන් සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතියේ වෙනත් ප්‍රතිලාභ වන්නේ,

- නගර සංවර්ධනයේ වෙනස්වීම් හේතුවෙන් දැනට පවතින ඇළ මාර්ග හා වැව් වැඩි දියුණු කිරීම
- වැවේ ධාරිතාව වැඩි කිරීම
- අවට ප්‍රදේශය තවදුරටත් අනවසරයෙන් අත් පත් කර ගැනීමෙන් ආරක්ෂා කිරීම
- විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ජලාශ ආශ්‍රිත අලංකරණ කාර්යයන්

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 28.27 කි.



කළුතර මහා හා කුඩා වස්කඩුව ප්‍රදේශය සඳහා වැසි ජල අපවහන පද්ධතියක් යටතේ යෝජිත ගේබියන් ව්‍යුහය ඉදිකිරීම

14. පාර්ලිමේන්තු ඉහළ ජල පෝෂක ප්‍රදේශයක් වන බත්තරමුල්ල සහ අවට ප්‍රදේශයේ අපවහන සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ කාර්යයන්

හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩි දියුණු කිරීම මඟින් පාර්ලිමේන්තු පරිශ්‍රයේ සහ එහි අවට ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සහ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ පිහිටි තෙත් බිම් සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

ඉහත කාර්යය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සිදු කරන ලදී;

- බත්තරමුල්ල, පාලම්තුන හන්දිය වැව හැරීම
- කිඹුලාවල, සිළුමිණ විහාරය වැව හැරීම
- අකුරෙගොඩ පර්යන්ත ඇළ මාර්ගයෙහි මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්

මෙම ව්‍යාපෘතියේ වෙනත් ප්‍රතිලාභ වන්නේ;

- ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීමෙන් සහ නාගරික භූමි අලංකරණ මඟින් ගංවතුරෙන් තොර, පරිසර හිතකාමී හරිත පරිසරයක් ඇති කිරීම
- ඉඩම් ගොඩකිරීමේ ක්‍රියාකාරකම් සඳහා බලහත්කාරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලයෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම
- අපවහනය වැඩි දියුණු කිරීම
- නාගරික භූමි අලංකරණ

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු රු.මිලියන 1.13 කි.



පාලම්තුන හන්දිය වැව හැරීම



අකුරෙගොඩ මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්

සේවාදායක ව්‍යාපෘති

1. *පානදුර-ගලවත්ත නාගරික චතුරශ්‍රය සඳහා භූමි අලංකරණ කාර්යයන් නිර්මාණය කිරීම සහ ඉදිකිරීම*

සේවාදායකයා	: මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය	: 2018.11.10
ව්‍යාපෘති තත්ත්වය	: 2019.01.15 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය	: රු. මිලියන 88.29 (Con. සහ VAT හැර)

2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 61.64



2. පැලියගොඩ කසළ බැහැර කිරීමේ අංගනයේ ඉඩම් වැඩි දියුණු කිරීම

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
ආරම්භ කරන ලද දිනය : 2017.11.22
ව්‍යාපෘති තත්ත්වය : 2019.07.21දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 36.31
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 24.01



3. මාකුඹුර බහුවිධ ආකෘති මධ්‍යස්ථාන (MMC) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව (SLLDC) මාකුඹුර බහුවිධ ආකෘති මධ්‍යස්ථාන පරිශ්‍රයේ ඉඩම් වැඩි දියුණු කිරීමේ කාර්යයන්, ජලාපවහන වැඩි දියුණු කිරීමේ කාර්යයන් සහ භූමි අලංකරණ කාර්යයන් සැලසුම් කිරීම හා ඉදිකිරීම සඳහා සම්බන්ධ වී සිටී. ඒ අනුව, අපගේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ විශාල ධාරිතාවය සහ ඉඩම් හා ජලාපවහන වැඩි දියුණු කිරීමේ කටයුතු කරගෙන යාමේ ප්‍රධාන නිපුණතාවය සමඟින් මාකුඹුර MMC හි ඉහත සඳහන් උප ව්‍යාපෘති SLLDC විසින් ක්‍රියාත්මක කරන ලදී.





SLLDC විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල වැඩපොළ සැලැස්ම

3.1 රේඛීය උද්‍යාන ඇවිදීමේ මංතීරුව - මාකුඹුර අදියර I හි ඉඩම් සංවර්ධනය, ජලාපවහන වැඩිදියුණු කිරීම

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය

ආරම්භ කරන ලද දිනය : 2017.11.22
කාලය දීර්ඝ කිරීම : 2019.02.08
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 209.14
2019 දක්වා සිදු කර ඇති කාර්යයන්: රු. මිලියන 167.92

3.2 හයිලෙවල් මාර්ගය සහ ඩී ඩී කුලතුංග මාර්ගය අතර ජලාපවහන හා ගොඩකිරීම් - මාකුඹුර අදියර II

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
ආරම්භ කරන ලද දිනය : 2017.11.22
කාලය දීර්ඝ කිරීම : 2019.03.31
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 194.31
2019 දක්වා සිදු කර ඇති කාර්යයන්: රු. මිලියන 161.90

3.3 අමතර බස් රථ අංගනය සඳහා ඉඩම් සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ඉදිකිරීම - පැකේජය IV (මාකුඹුර බහුමාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය)

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2018.04.05
ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 66.26
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 46.39

3.4 අමතර බස් රථ අංගනය සහ පිවිසුම් මාර්ගය සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන් සැලසුම් කිරීම සහ ඉදිකිරීම - පැකේජය VIII (මාකුඹුර බහුමාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය)

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2018.11.26
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 82.81 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන්: රු. මිලියන 56.03

3.5 අමතර බස් රථ අංගනය සඳහා ඇස්ෆාල්ට් කාර්යයන් (පැකේජය V), බහුආකෘතික මධ්‍යස්ථානය, මාකුඹුර

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2019.01.18
සම්පූර්ණ කරන ලද දිනය : 2019.05.19 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 61.04 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 46.36

3.6 මාකුඹුර බහුආකෘතික මධ්‍යස්ථාන ප්‍රවේශ මාර්ගය සඳහා ඇස්ෆාල්ට් කාර්යයන්, පැති කාණු, දිය වළ (පැකේජය VI)

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2019.01.18
සම්පූර්ණ කරන ලද දිනය : 2019.05.19 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 78.07 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 48.62

3.7 කුඹුර බහුආකෘතික මධ්‍යස්ථාන ප්‍රවේශ මාර්ගය සඳහා ජල පෝෂක ප්‍රදේශවල සිට ගලා එන ජලය එක්රැස් කිරීම සඳහා මීටර් 5 දිගැති කොන්ක්‍රීට් කාණු (1mx0.9m), මීටර් 4 දිගැති ප්‍රවේශ 2ක් සහිත සතරැස් බොක්කු (1.5mx1.5m) සහ දියවල ඉදිකිරීම, ඉඩම් සංවර්ධන කාර්යයන් සහ ඇවිදීමේ මංතීරුව සඳහා ගල් ඇල්ලීම (පැකේජය IX)

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2019.01.18
සම්පූර්ණ කරන ලද දිනය : 2019.05.19දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 36.97 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 6.07

3.8 මාකුඹුර, බහුආකෘතික ප්‍රවාහන මධ්‍යස්ථානයේ අමතර බස් රථ අංගනය, ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම - පැකේජය VII

සේවාදායකයා : නාගරික සංවර්ධන සංසථකය (3K ව්‍යාපෘතිය)
ආරම්භ කරන ලද දිනය : 2018.02.05
ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 36.97 Mn (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 6.07



4. කෙරවළපිටිය භූවමාරුවෙහි යෝජිත ජලාපවහන වැඩි දියුණු කිරීමේ කාර්යයන්

සේවාදායකයා : මෙටලර්ජිකල් කෝපරේෂන් ඔෆ් චයිනා ලිමිටඩ් (OCH)
ආරම්භ කරන ලද දිනය : 2018.02.05
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 32.76
2019 දක්වා සිදු කර ඇති කාර්යයන්: රු. මිලියන 18.26



5. ඇඹිලිපිටිය කාවන්තිස්ස වැවේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය අදියර III

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.05.04
ව්‍යාපෘති තත්ත්වය : 2019.03.31 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 88.66 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 78.85

අදියර IV
සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.10.26
ව්‍යාපෘති තත්ත්වය : 2019.08.15 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 28.60 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 21.59



ඇඹිලිපිටියේ කාවන්තිස්ස වැව වැඩි දියුණු කිරීමේ කාර්යයන්

6. බෙරේ වැව මැදිහත්වීමේ ප්‍රදේශ සංවර්ධන සැලැස්ම යටතේ බටහිර බෙරේ වැව පිරිසිදු කිරීම (හැරීමේ කාර්යයන්)

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.06.22
ව්‍යාපෘති තත්ත්වය : 2019.03.22 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 74.32 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 74.53



නැගෙනහිර බෙරේ වැව පිරිසිදු කිරීම (හෑරීමේ කාර්යයන්)

7. බෙරේ වැව මැදිහත්වීමේ ප්‍රදේශ සංවර්ධන සැලැස්ම යටතේ බටහිර බෙරේ වැව පිරිසිදු කිරීම (හෑරීමේ කාර්යයන්)

සේවාදායකයා : මහානගර සහ ඛස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.06.22
ව්‍යාපෘති තත්ත්වය : 2019.02.24 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 54.54 (Con. *සහ* VAT *හැර*)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 47.58



8. කොළඹ නගරයේ ඇළ මාර්ග හෑරීම සහ නඩත්තු කිරීම

සේවාදායකයා : කොළඹ මහ නගර සභාව
ආරම්භ කරන ලද දිනය : 2018.08.01
ව්‍යාපෘති තත්ත්වය : 2019.08.01දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 26.66 (Con. *සහ* VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 24.73



ආරාමය ඇළ මාර්ගය



වරාය ප්‍රවේශ මාර්ග ඇළ මාර්ගය



මඩම්පිටිය ඇළ මාර්ගය



ස්ටෙඩියම්ගම ඇළ මාර්ගය



කිඹුලා-ඇළ ඇළ මාර්ගය



මාලිගාවත්ත ඇළ මාර්ගය (II)



මාලිගාවත්ත ඇළ මාර්ගය (I)

9. බෙරේ වැව – රේඛීය උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය (බස්නාහිර ඉවුර ඔස්සේ ඉවුරු ආරක්ෂණ බැම්ම ඉදිකිරීම)

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.07.30
කාලය දීර්ඝ කිරීම : 2019.12.31 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 154.24 (Con. සහ VAT හැර)
2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන්: රු. මිලියන 122.22



රේඛීය උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය

10. ගම්පහ යෝජිත "සියත" තෙත්බිම් උද්‍යානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම – අදියර I - පියවර II

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.09.09
ව්‍යාපෘති තත්ත්වය : මහජන විරෝධය හේතුවෙන් සේවාදායකයා විසින් තාවකාලිකව අත්හිටුවා ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 107.82 (Con. සහ VAT හැර)
2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 41.95



ගම්පහ යෝජිත "සියත" තෙත්බිම් උද්‍යානය ඉදිකිරීම

11. මාතර යෝජිත ගඟ ආසන්න සංවර්ධන කාර්යයන් සඳහා සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් කාර්යයන් - අදියර II

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.10.30
ව්‍යාපෘති තත්ත්වය : 2019.06.*21*දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 44.36 (Con. සහ VAT හැර)
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 27.11



මාතර සංවර්ධන කාර්යයන් – අදියර I

12. තලවතුගොඩ ප්‍රජා ගොඩනැගිල්ල සඳහා භූමි අලංකරණ කාර්යයන්

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ආරම්භ කරන ලද දිනය : 2018.09.09
ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 3.73 (Con. සහ VAT හැර)
2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 2.75

13. මොරගොඩ ඇළ මාර්ගය පුනරුත්ථාපනය සහ නිවැරදි කිරීම - ගාල්ල

සේවාදායකයා : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
ආරම්භ කරන ලද දිනය : 2018.07.17
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී

සම්පූර්ණ කරන ලද දිනය : 2019.09.18
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 628 (Con. සහ VAT හැර)
2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 41.95



ගාල්ල මොරගොඩ ඇළ මාර්ග ව්‍යාපෘතිය

14. පාර්ලිමේන්තු සංකීර්ණය වටා වූ රැඳවුම් බැම්මෙහි විනාශ වූ කොටස අලුත්වැඩියා කිරීම

සේවාදායකයා : ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ආරම්භ කරන ලද දිනය : 2019.11.03
ව්‍යාපෘති තත්ත්වය : 2020.01.03දින සම්පූර්ණ කරන ලදී

ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන27.00 (Con. සහ VAT හැර)
2019 වර්ෂය දක්වා සිදු කරන ලද කාර්යයන් : රු. මිලියන 12.15

ස්වයං ව්‍යාපෘති

1. මුතුරාජවෙල මීටර් 400ක ඉඩම් කිරුවක් සංවර්ධනය කිරීම

ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 308.02
2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 332.85



2. **කෙරවළපිටිය යෝජිත RCC කාණුව ඉදිකිරීම**

ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන75.08
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 69.18

3. කෙරවළපිටිය මංකීරු හතරක් සහිත මාර්ගය ඉදිකිරීම

ව්‍යාපෘති තත්ත්වය : 14.08.2019 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 65.09
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 66.30



4. **කෙරවළපිටිය වැලි ඇසුරුම් යන්ත්‍රාගාරය සඳහා යෝජිත සතරැස් බොක්කුව**

ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 28.15
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 15.74

5. කෙරවළපිටිය වැලි ඇසුරුම් යන්ත්‍රාගාරය සඳහා යෝජිත අභ්‍යන්තර මාර්ග සහ ප්‍රවේශ මාර්ග

ව්‍යාපෘති තත්ත්වය : 14.08.2019 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 55.01
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 70.86

6. කෙරවළපිටිය බැටරි වක්ත ඉඩම සඳහා යෝජිත මීටර් 10ක් පළල මාර්ගය

ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 7.88
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 7.30

7. කෙරවළපිටිය යෝජිත ගේබියන් ව්‍යුහය සහ කම්බි දැල් වැට

ව්‍යාපෘති තත්ත්වය : 30.07.2019 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 7.53
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 8.62



8. SLLDC සඳහා කෙරවළපිටිය යෝජිත මීටර් 8ක් පළල ප්‍රවේශ මාර්ගය

ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 25.95
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 25.18



9. කෙරවළපිටිය වැලි ඇසුරුම් යන්ත්‍රාගාරය සඳහා යෝජිත මාර්ග සංවර්ධනය

ව්‍යාපෘති තත්ත්වය : 06.08.2019 දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 7.25
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 7.25

10. පිරවීම සඳහා වෙන් කළ ඉඩමෙහි මඩ ස්ථරය මුහුදු වැලි යොදා ගනිමින් ඉවත් කිරීම - මීටර් 400

ව්‍යාපෘති තත්ත්වය : සම්පූර්ණ කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 15.82
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 3.25

11. වැලි ඇසුරුම් යන්ත්‍රාගාරයේ යෝජිත පිටුපස මීටර් 8ක් පළල ප්‍රවේශ මාර්ගය ඇස්ෆාල්ට් කිරීම සහ කෙරවළපිටිය පිහිටි පැටවීමේ අංගනය සඳහා මීටර් 4ක් පළල සේවා මාර්ගයක් ඉදි කිරීම

ව්‍යාපෘති තත්ත්වය : 09.11.2019දින සම්පූර්ණ කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 25.51
2019 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු. මිලියන 22.68

වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ සහ තදාසන්න නගරවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් සැලසුම් නොකළ ඉඩම් ගොඩකිරීම් සහ ඇළ මාර්ග අනවසරයෙන් අත් පත් කර ගැනීම් ඉහළ ගොස් ඇත. සෑම වසරකම පාහේ වර්ෂා කාලයේදී නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල සහ වේරහැර යන ප්‍රදේශවල ඇති වන දැවැන්ත ගංවතුර තත්ත්වය අත්විඳිමින් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහාය ඇතිව කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. අධ්‍යයනයේ නිර්දේශයන්ට අනුව, වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී දියත් කරන ලදී.

ඉහත සඳහන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් SLLDC විසින් ආරම්භ කිරීම සඳහා 2013 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ප්‍රධාන ගංවතුර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සම්පූර්ණ සැලසුම් කටයුතු සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඉදිකිරීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිශෝධනය කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 11,050 කි.

අරමුණු

පවතින ඇළ මාර්ග පද්ධතිය තවදුරටත් පුළුල් කිරීමෙන් ගංවතුර අවම කිරීම, ඇළ ඉවුරු ආරක්ෂණය, ජල රඳවුම් ප්‍රදේශය සංරක්ෂණය කිරීම සහ වැව් නිර්මාණය කිරීම, පවතින බෝක්කු සහ පාලම් වැඩි දියුණු කිරීම, නව ව්‍යුහ ඉදිකිරීම, අත්හැර දැමූ කුඹුරු නැවත වගා කිරීම ඉහළ නැංවීම, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ අත්තිඩිය කුරුළු පරාදීසය ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගංවතුර අවම කිරීම සඳහා ඉලක්ක කර ඇති බැවින්, ගංවතුර හානිය, මදුරුවන් මඟින් බෝ වන රෝග සහ මී උණ රෝගයෙන් අවම කිරීම මඟින් ප්‍රදේශවාසීන්ට සහ මුළු දිවයිනටම සහ ප්‍රතිලාභ අත් වේ. ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ප්‍රදේශයේ ඉඩම් වටිනාකම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් ගුරුත්වාකර්ෂණය යටතේ ගංවතුරෙන් තොර ඇළ මාර්ග පද්ධතියක් තැනීම සඳහා දේශීය ඉංජිනේරු තාක්ෂණික ධාරිතාව භාවිතා කරනු ලබන ජාතිය සඳහා කෙරෙන ආයෝජනයකි.

2019 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම දළ වශයෙන් මිලියන 7,058.68 කි.

ව්‍යාපෘති කටයුතු අබණ්ඩව සිදුවන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද කොටස්වලින් මහජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබේ.

ව්‍යාපෘතියේ ඵලදායී ජල පෝෂක ප්‍රදේශය

වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ජල පෝෂක ප්‍රදේශය වර්ග කිලෝමීටර් 55.5 පමණ වේ.



1 රූපය: ඵලදායී ජල පෝෂක ප්‍රදේශය

සම්පූර්ණ ජල පෝෂක ප්‍රදේශය කලාප හයකට බෙදා ඇති අතර මේ වනවිට ඉදිකිරීම් සිදු කරමින් පවතී.

1. 2019 වර්ෂය අවසානය වනවිට සම්පූර්ණ කර ඇති ඉදිකිරීම් කාර්යයන්

1.1 වැසි ජල අපවහනය වැඩි දියුණු කිරීම

ඇළ මාර්ග වැඩි දියුණු කිරීම





වාහන ගමන් කළ හැකි ඇස්ෆාල්ට් හෝ බොරළු නඩත්තු මාර්ගයක් සමඟ ආසන්න වශයෙන් කි.මී 6ක් දිග කොන්ක්‍රීට්, ගේබියන් සහ පෝරු ටැඹ සහිත ඉවුරු ආරක්ෂණ ඇළ මාර්ග වැඩිදියුණු කිරීම් සම්පූර්ණ කර ඇත. ප්‍රධාන ඇළට පාර්ශ්වීය ප්‍රවාහය සම්බන්ධ කිරීම සඳහා දළ වශයෙන් කි.මී. 10ක් පමණ දිග පාංශු පර්යන්ත ඇළ මාර්ග හාරා සකස් කර ඇත.

ව්‍යුහමය වැඩි දියුණු කිරීම



සූරියමල් මාවත පාලම



පැතිරිවක්ත පාලම

අලුතින් ඉදිකරන ලද ඇළ මාර්ග හා මාර්ග මට්ටමට ගැලපෙන පරිදි මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් අංක 7 ක්, බෝක්කු 12 ක් සහ වානේ පාද පාලම් 3 ක් ඉදිකරන ලදී.

ජල රැඳවුම් ප්‍රදේශ වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා හෙක්ටයාර 55 ක පමණ භූමි ප්‍රමාණයක් පොකුණු, වැව් සහ වගුරු බිම් ලෙස සංවර්ධනය වෙමින් පවතී.



මානෙල් මාවත වැව



සූරියමල් මාවත වැව



වේරහැර ජල රැඳවුම් ප්‍රදේශය

2. අත්හැර දැමූ කුඹුරු ඉඩම් නැවත වගා කිරීම





කෘෂිකාර්මික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා හෙක්ටයාර් 3.02 ක මුළු වගා බිම් ප්‍රමාණයක් වී වගා කළ ප්‍රදේශයක් ලෙස ද හෙක්ටයාර් 1.52 ක් බෝග වගා කළ ප්‍රදේශයක් ලෙස ද සංවර්ධනය කෙරේ.

3. විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සමඟින් පරිසරය වැඩි දියුණු කිරීමේ කාර්යයන්.

3.1 බෙල්ලන්විල ජල රැඳවුම් ප්‍රදේශය





හෙක්ටයාර 15.3 ක මුළු භූමි ප්‍රමාණයක් පරිසරය වැඩි දියුණු කිරීම සහ ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සමඟ බෙල්ලන්විල ජල රැඳවුම් ප්‍රදේශය ලෙස සංවර්ධනය කෙරේ. මෙමඟින් ඉඩම් පරිහරණය ප්‍රශස්ත වන අතර නාගරික ප්‍රජාවට රේඛීය උද්‍යාන ලෙස පහසුකම් සැලසෙනු ඇත. මෙම කාර්යයට වාහන නැවැත්වීමේ ස්ථාන, වතුර මල්, ඇවිදීමේ මංතීරු, සාප්පු හා ආහාර වෙළඳසැල් සහිත ළමා ක්‍රීඩා පිටි, ව්‍යායාම මංතීරු, පාපැදි මංතීරු ආදිය ඇතුළත් වේ.

3.2 කෙලිමඩළ විවේක උද්‍යානය

හෙක්ටයාර් 1.9 ක මුළු භූමි ප්‍රමාණය කෙලිමඩල විවේක උද්‍යානය විශේෂයෙන් නිර්මාණය කර ඇත්තේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා ය. විවේක උද්‍යානය වාහන නැවැත්වීමේ ස්ථාන, වතුර මල, ඇවිදීමේ මංතීරු, සාප්පු සහ ආහාර වෙළඳසැල් සහ ළමා ක්‍රීඩා පිටිවලින් සමන්විත වේ. ඉඩම් පරිහරණය ප්‍රශස්ත කිරීම සහ නාගරික ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා මෙය යෝජනා කරන ලදී. මුළු වියදම රු. මිලියන 400 කි.



පර්යේෂණ සහ සැලසුම් අංශය

උපදේශන සේවාවන්

රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන සඳහා වැසි ජල අපවහන සැලසුම්, ගොඩකිරීමේ ව්‍යාපෘති, ගොඩනැගිලි හා පාලම් සඳහා ගෘහ නිර්මාණාත්මක සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් පිළිබඳ උපදේශන සේවාවන් සංස්ථාව විසින් භාර ගනු ලැබේ.

ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය

ඉංජිනේරු ද්‍රව්‍ය පරීක්ෂණාගාරය (EMT පරීක්ෂණාගාරය) SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය යටතේ ක්‍රියාත්මක වේ. පස්, කොන්ක්‍රීට් (නැවුම් හා ඝන වූ), සමස්ත (සිහින් සහ රළු) සහ ජලය දක්වා විවිධ ද්‍රව්‍ය පරීක්ෂණ සිදු කිරීමට එයට හැකියාව ඇත.

එපමණක් නොව, භ්‍රමණ (දෙවුම් මිහිවිදමන), පිරිගැටුම හෝ අතින් හෑරීම වැනි ක්‍රම උපයෝගී කරගනිමින් EMT පරීක්ෂණාගාරය විසින් මිහිවිදමන පරීක්ෂණ සිදු කරනු ලැබේ. EMT පරීක්ෂණාගාරය YWE D45 භ්‍රමණ විදුම් යන්ත්‍රයකින් සහ DANDO 2000 පිරිගැටුම් විදුම් යන්ත්‍රයකින් සමන්විත වේ.

EMT පරීක්ෂණාගාර ඉතිහාසයේ වැඩිම ආදායම වූ රු. මිලියන 31 ක් 2019 දී වාර්තා විය. SLLDC විසින් සිදු කරන ලද විවිධ ව්‍යාපෘති සඳහා EMT පරීක්ෂණාගාරය සහාය ලබා දී ඇති අතර ඒවා කිහිපයක් පහත දැක්වේ.

- GCFC & EI ව්‍යාපෘතිය
- මුතුරාජවෙල යෝජිත ප්‍රාදේශීය කාර්යාලය
- වෙරළට ඔබ්බෙන් වැලි හෑරීමේ ව්‍යාපෘතිය
- දික්ඕවිට මුහුදු ජල අපවාන සඳහා IEER
- මාකුඹුර සංවර්ධන ව්‍යාපෘතිය
- දියවන්නා ජලාශයේ ජල තත්ත්ව අධීක්ෂණය
- හෝමාගම ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහන
- රාගම ජල පෙරටු සංවර්ධන ව්‍යාපෘතිය
- කෙරවළපිටිය වැලි ඇසුරුම් ගොඩනැගිල්ලට යෝජිත පාලම සහ ප්‍රවේශ මාර්ගය
- පැලියගොඩ කසළ බැහැර කිරීමේ අංගනයේ ඉඩම් වැඩිදියුණු කිරීම
- SLLDC ප්‍රධාන කාර්යාලය සඳහා යෝජිත නව ගොඩනැගිල්ල
- නිරිතදිග බෙරේ වැවෙහි යෝජිත කැණීම් කටයුතු
- CEB සඳහා මුතුරාජවෙල ඉඩම් සංවර්ධනය පිළිබඳ පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව සකස් කිරීම සඳහා ජල තත්ත්ව අධීක්ෂණය
- ඔලියමුල්ල යෝජිත පොම්පාගාරය
- දියසරු උද්‍යානයේ තෙත්බිම් මධ්‍යස්ථානය

තවද, SLS 1397:2010 අනුව ක්ලෝරයිඩ් ප්‍රමාණය සහ සිප්පි කටු ප්‍රමාණය අධීක්ෂණය කිරීම මෙන් වෙරළබඩ වැලිවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා EMT පරීක්ෂණාගාරය විශාල කාර්යභාරයක් ඉටු කරයි.

<u>ගෘහනිර්මාණ ඒකකය</u>

මෙම ඒකකය SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය යටතේ ස්ථාපිත කර ඇත. ගොඩනැඟිලි ව්‍යාපෘති සහ භූමි අලංකරණ කාර්යයන්වලදී ගෘහනිර්මාණික්මක සැලසුම් සකස් කිරීම මෙම ඒකකය මඟින් සිදු කෙරේ.

<u>ප්‍රමාණ සමීක්ෂණ අංශය</u>

මෙම අංශය SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය යටතේ ස්ථාපිත කර ඇත SLLDC හි ප්‍රධාන ව්‍යාපෘති සඳහා සේවා සපයන ප්‍රමාණ සමීක්ෂණ ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් ආවරණය කිරීම සඳහා එය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ප්‍රමාණ සමීක්ෂණ අංශය විසින් බාහිර හා අභ්‍යන්තර ව්‍යාපෘති සඳහා සේවා සැපයීමෙන් සාමාන්‍යයෙන් රු.මිලියන 58.9 ක් උපයා ගෙන ඇත.

භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය විසින් හසුරවනු ලබන භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා ජලාපවහන සැලසුම්, පර්යේෂණ හා සැලසුම් අංශය විසින් සකස් කර ඇත. වැසි ජල අපවහන සැලසුම්, භූ දර්ශන ඇඳීම් සහ ඇස්තමේන්තු සකස් කිරීම මෙම අංශයට භාර දී ඇත.

1. ප්‍රධාන ජල අපවහන සැලසුම් සකස් කිරීම (පිටත ප්‍රදේශය)

2019 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය-රු. මිලියන 7
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම - රු. මිලියන 7

ගංවතුර අවම කිරීම සඳහා දත්ත එක්රැස් කිරීම, සමීක්ෂණ කටයුතු සහ කොළඹ සහ පිටත ප්‍රදේශය සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. ප්‍රධාන ජලාපවහන යෝජනා දෙකක් සම්පූර්ණ කර ඇත. එක් යෝජනාවක් අත්හිටුවා ඇති අතර තවත් යෝජනා හතරක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘති හය පහත වගුවේ දක්වා ඇත.

අංක 1 වගුව ජලාපවහන යෝජනා

අංකය	ව්‍යාපෘතිය	සටහන්
1	කොස්වත්ත ප්‍රදේශය සඳහා නගර මලාපවහන “ .”ධාන සැලැස්මප්‍ර (JICA(	සංකල්පීය සැලසුම සම්පූර්ණ කර ඇත. සවිස්තරාත්මක සැලසුම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණ අනුමැතිය අපේක්ෂිතය
2	බත්තරමුල්ල, පොල්දූව පාර සහ සුභූතිපුර ජලාපවහන අධ්‍යයනය සමාලෝචනය කිරීම..	පොල්දූව ව්‍යාපෘතිය RDA සහ රේබිය අමාත්‍යාංශයේ මග පෙන්වීම සමඟ ඉදිරියට සිදු කරනු ලැබේ. කිලෝමීටර 1 ක් සම්පූර්ණ කර ඇත.
3	කොස්වත්ත UDA ප්‍රධාන සැලැස්ම සමාලෝචනය කිරීම	සම්පූර්ණකර ඇත
4	විද්‍යා පාරේ දැනට පවතින ඇළ පද්ධතිය ඔස්සේ මැනුම් කටයුතු.	සම්පූර්ණකර ඇත
5	බිදුණු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය	සංකල්පීය සැලසුම සම්පූර්ණයි. NPD අනුමැතිය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යොමු කර ඇත .
6	මහා සහ කුඩා වස්කඩුව ප්‍රදේශය සඳහා වැසි ජල අපවහන පද්ධතිය	ජලාපවහන සැලැස්ම සහ පිරිවැය ඇස්තමේන්තුව සකස් කර ඇත .2019 දී ඇති වූ අධික ගංවතුරෙන් පසු ජලාපවහන සැලැස්ම සමාලෝචනය කරමින් පවතී.

2. මොරටුව රත්මලාන උප ද්‍රෝණියේ සවිස්තරාත්මක ජලාපවහන අධ්‍යයනය

මොරටුව - රත්මලාන උප ද්‍රෝණිය පිහිටා ඇත්තේ වේරළු ගඟ ද්‍රෝණියේ බටහිර කොටසේ ය. උප ද්‍රෝණියේ විශාලත්වය වර්ග කි.මී. 8.1 කි. කඳවල සහ තෙලවල අතර මධ්‍ය ප්‍රදේශය ඉතා ජනාකීර්ණ නේවාසික ප්‍රදේශ සහ කාර්මික සංකීර්ණවලින් සමන්විත වේ. ජලාපවහන පද්ධතියක් නොමැති වීම සහ භූ විෂමතා අවනිරතා හේතුවෙන් පහත් බිම්වල ජලාපවහන තත්ත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය. නාගරීකරණය හේතුවෙන් ඉහළ ගොස් ඇති මතු පිට ගැලීමට සාර්ථකව මුහුණ දීම සඳහා මොරටුව - රත්මලාන උප ද්‍රෝණිවල ප්‍රධාන ඇළ මාර්ගය සහ ප්‍රධාන අතුරු ඇළ මාර්ග වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ද්‍රෝණිවල ඇති වන ගංවතුර හානිය අවම කිරීම සඳහා එය ක්‍රියාවට නැංවීමට නියමිතය.

ජල විද්‍යාත්මක හා හයිඩ්‍රොලික් දත්ත මෙන්ම සමීක්ෂණ දත්ත එකතු කිරීම 2016 සහ 2017 වර්ෂවලදී දියත් කරන ලද අතර උප ද්‍රෝණියේ 1 සඳහා එය බොහෝ දුරට අවසන් වී ඇත. උප ද්‍රෝණිය 1 සඳහා සංකල්පීය සැලසුම් සකස් කරමින් පවතී.

2018 වර්ෂයේදී, උප ද්‍රෝණියේ 1 හි ජලාපවහන වැඩි දියුණු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සහ උප ද්‍රෝණියේ 2 සහ 3 සමාලෝචනය කිරීමට (පොම්පාගාරය හැර) සහ තෝරාගත් ප්‍රධාන ඇළ මාර්ගවල සවිස්තරාත්මක සැලසුම් සම්පූර්ණ කිරීමට සංස්ථාව සැලසුම් කරන ලදී. උප ද්‍රෝණියේ 1 සඳහා ජලාපවහන යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර හඳුනාගත් ප්‍රධාන ඇළ මාර්ගය සඳහා පවුල් කිහිපයක් නැවත ස්ථානගත කළ යුතුය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අවට පරිසරය වැඩිදියුණු කිරීම තුළින් අධ්‍යයන ප්‍රදේශය තුළ ජලාපවහන ජාලය හා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

2016.08.29 දිනැති අංක NPD/UDA/201/6/PP/20 ලිපියෙහි නිර්දේශයට අනුව විදේශීය අරමුදල් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට NPD විසින් අනුමැතිය ලබා දී ඇත. මේ අතර 2003 වසරේදී සිදු කරන ලද **"කොළඹ පුරවර කලාපය සඳහා වූ වැසි ජල අපවහන සැලැස්ම"** සමාලෝචනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා JICA විශේෂඥ කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේය. සාකච්ඡාවලින් පසුව 2018 වර්ෂය තුළ SLLDC සමඟ සම්බන්ධීකරණයෙන් සමස්ත මොරටුව, රත්මලාන උප ද්‍රෝණියේ ජලාපවහන අධ්‍යයනය සමාලෝචනය කිරීමට ඔවුන් එකඟ විය. මූලික පිරිවැය හාණ්ඩාගාර අරමුදල් හරහා වියදම් කිරීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. එබැවින් සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා වියදම ලෙස රු.මිලියන 30 ක් වෙන් කරන ලදී. JICA කණ්ඩායමේ පැමිණීම ප්‍රමාද වීම හේතුවෙන් SLLDC විසින් මෙම හාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කර කඳවල පාර හරහා බෝක්කුව විශාල කර අවහිරතාවය ඉවත් කිරීමට
තීරණය කළේය. එම ස්ථානයේ මිහිවිදමන විමර්ශනය සහ බෝක්කුව සැලසුම් කිරීම අවසන් කරන ලදී.

3. පැලියගොඩ මුදුන් ඇළ උප ද්‍රෝණියේ සවිස්තර ජලාපවහන අධ්‍යයනය

2019 වර්ෂය සඳහා හාණ්ඩාගාර ප්‍රතිපාදනය– රු.මිලියන 3
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම– රු.මිලියන 3

පැලියගොඩ සහ මුදුන් අළ යනු කැලණි ගංගා ද්‍රෝණියේ පහළින් පිහිටා ඇති උප ද්‍රෝණි දෙකකි. ජලාපවහන පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම සහ සැලසුම් නොකළ නාගරීකරණය හේතුවෙන් මෙම ද්‍රෝණි දෙක නිරන්තරයෙන් ගංවතුරට ලක් වේ.

එබැවින් ද්‍රෝණියේ ගංවතුර බලපෑමට පිළියම් යෙදීම සඳහා ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කර ඇත. ඉහත අධ්‍යයනයට සමගාමීව ඔලියමුල්ල පිහිටි ද්‍රෝණියේ පිටවානෙහි පොම්පාගාරයක් ඉදිකිරීමට සහ ආශ්‍රිත ජලාපවහන ජාලය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත.

2017 වර්ෂයේ දී අත්කර ගත් ඉලක්ක වූයේ භූ විද්‍යාත්මක හා භූ තාක්ෂණික සමීක්ෂණය, පවත්නා ඇළ මාර්ග පද්ධතිය ඇගයීම සහ හයිඩ්‍රොලික් ආකෘතිය පිහිටුවීමයි.

සමීක්ෂණය අතරතුරදී මහ හැරුණු අධ්‍යයනයට අදාළ ක්ෂේත්‍ර දත්ත කිහිපයක් එකතු කරන ලදී.

2018 වර්ෂයේදී හයිඩ්‍රොලික් මොඩල සැකසුම අවස්ථා කිහිපයක් සහ විවිධ ප්‍රතිලාභ කාලයන් සඳහා සියුම්ව සීරු මාරු කර ඇත. ලබාගත් ප්‍රතිඵල අනුව ජලවිද්‍යාව හා හයිඩ්‍රොලික් අධ්‍යයන වාර්තාව සකස් කිරීම ආරම්භ කරන ලදී.

4. අත්තනගලු ඔය සහ ජා-ඇළ ද්‍රෝණිවල මූලික අධ්‍යයනය

2019 වර්ෂය සඳහා හාණ්ඩාගාර ප්‍රතිපාදනය– රු.මිලියන 1
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම– රු.මිලියන 1

අත්තනගලු ඔය ද්‍රෝණියේ ගංවතුරට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රධාන ගංගාවලින් (අත්තනගලු ඔය, උරුවල් ඔය, දඬුගම් ඔය ජා-ඇළ) පිටාර ගැලීම, මුතුරාජවෙල වගුර අවට පහත් බිම්වල ස්වාභාවික ජලාපවහන දුෂ්කරතා සහ වැසි ජල අපවහන පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම බව හඳුනාගෙන ඇත.

අනාගත සැලසුම් සඳහා තෝරාගත් උප ද්‍රෝණිවල සමීක්ෂණ කටයුතු සිදු කර ඇත.

5. මුල්ලේරියාව ප්‍රධාන සැලැස්මේ ජල අපවහන වැඩි දියුණු කිරීමේ කාර්යයන්

2019 වර්ෂය සඳහා හාණ්ඩාගාර ප්‍රතිපාදනය– රු.මිලියන 0.60
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම– රු.මිලියන 0.60

ව්‍යාපෘති ප්‍රදේශය කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා තුළ පිහිටා ඇති අතර එය උතුරට අවිස්සාවේල්ල මාර්ගයෙන් මායිම්ව ඇත, දකුණු මායිමේ අඹතලේ ජල පවිත්‍රාගාරය සහ පොම්පාගාරය පිහිටා ඇති අතර ව්‍යාපෘති ප්‍රදේශයේ නැගෙනහිර මායිමේ මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇළ මාර්ගය පිහිටා ඇත. ගංවතුර ගැටලු අවම කිරීම සහ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් සමඟ ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මුල්ලේරියාව වැව සහ ඒ අවට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට SLLDC අදහස් කළේය

UDA විසින් මෙම ව්‍යාපෘතිය SLLDC සමඟ ආරම්භ කරන ලදී. අදියර I හි යෝජනාව නැවත ඉදිරිපත් කරන ලෙස UDA, SLLDC වෙතින් ඉල්ලා සිටියේය. සංශෝධිත ව්‍යාපෘති යෝජනාව NPD අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.



රූපය 1. ගංවතුර පවතින අවස්ථාවක්



රූපය 2. යෝජිත ජලාපවහන සැලැස්ම

6. පිළියන්දල නගර සංවර්ධන ප්‍රදේශයේ ජල අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යය

2019 වර්ෂය සඳහා හාණ්ඩාගාර ප්‍රතිපාදනය– රු.මිලියන 3
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම– රු.මිලියන 3

පිළියන්දල නගරය කොළඹ පරිපාලන ප්‍රදේශය තුළ පිහිටි තදාසන්න නගරවලින් එකකි. එබැවින් එය සංවර්ධනය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. පවතින නගරය දැනටමත් තදබදයෙන් පිරී ඇත. එබැවින් අතහැර දමා ඇති කුඹුරු ඉඩමක් සංවර්ධනය කර බස් නැවතුම්පොළ, වෙළඳපොළ යනාදිය එම ස්ථානයට ගෙන යාමෙන් නගරය පුළුල් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇත. කොළඹ-හොරණ මාර්ගයේ රථවාහන තදබදය වළක්වා ගැනීමට සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි ජාලියගොඩ සිට කැස්බෑව හන්දිය දක්වා දිවෙන මහහැරයෑමේ මාර්ගයක් දැනටමත් ඉදිකර ඇත.

මේ වනවිට මහහැරයෑමේ මාර්ගයද සහ පිළියන්දල නගරයද ඇතුළුව පුරවා ඇති භූමි ප්‍රමාණය අක්කර 40 ක් පමණ වේ. ස්ථානීය ගංවතුර අවම කිරීම සහ මහහැරයෑමේ මාර්ගය දෙපස නීති විරෝධී ඉඩම් පිරවීම වැළැක්වීම පිණිස ඉහත ඉඩම් පිරවීම පියවීම සඳහා සහ ජල අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා මීටර් 10 ක ඇළ සහ රැඳවුම් ප්‍රදේශයක් හැරීමට යෝජිතය.

2019 - 2021 කාලය සඳහා රු. මිලියන 993ක මුළු පිරිවැය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. සවිස්තරාත්මක සැලසුම් කටයුතු ආරම්භ කර ඇති අතර බෝක්කු ඉදිකිරීම සහ බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීම සඳහා RDA සහ UDA සමඟ සම්බන්ධීකරණය කරමින් පවතී.

මැනුම් කටයුතු අවසන් කර ඇති අතර ස්ථාන පරීක්ෂාවන් කිහිපයක් සිදු කර සංකල්පීය ජලාපවහන කළමනාකරණ සැලැස්ම සකස් කරන ලදී. ගහ පහළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

7. ජල මට්ටම සහ මුදා හැරීමේ මිනුම්

2019 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය– රු.මිලියන 8.5
2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම– රු.මිලියන 8.52

පර්යේෂණ සහ සැලසුම් අංශයේ ප්‍රධාන විෂය පථය වන්නේ ජල විද්‍යාත්මක හා ජල ගතික අධ්‍යයන සිදු කිරීම සහ ජලාපවහන සැලසුම් සකස් කිරීමයි. මෙම සන්දර්භය තුළ, සංඛ්‍යාත්මක ආකෘතිකරණ ක්‍රමවේදය ක්‍රමාංකනය හා සත්‍යාපනය කිරීම සඳහා ජල විද්‍යාත්මක දත්ත එකතු කිරීම සහ ජල ගතික දත්ත එකතු කිරීම අත්‍යවශ්‍ය වේ.

වගු අංක 1 හි දක්වා ඇති පරිදි හඳුනාගත් ද්‍රෝණි හතක ඇළ මාර්ග පද්ධතියේ ස්ථාන 134 කදී ජල මට්ටම් දත්ත අතින් එකතු කරනු ලැබේ.

වර්තමානයේදී, SLLDC ක්‍රමයෙන් ස්වයංක්‍රීය ජල මට්ටම් මිනුම් ස්ථාපිත කිරීමට පියවර ගනිමින් සිටින අතර ඒ අනුව අනාගතයේදී වඩාත් විශ්වාසදායක දත්ත ලබා ගැනීමට හැකි වනු ඇත.

වගු අංක 2 ජල මට්ටම මැනීමේ ස්ථාන

කේතය	ද්‍රෝණිය	ස්ථාන සංඛ්‍යාව	මේ වනවිට සකස් කරන	2018	2019	2020	2021
B – 1	බොල්ගොඩ ද්‍රෝණිය	36	4	-	√	√	√
J – 2	ජා-ඇළ ද්‍රෝණිය	14	4	√	√	-	-
M -3	මුදුන් ඇළ ද්‍රෝණිය	18	13	√	-	-	-
K - 4	කළු ඔය ද්‍රෝණිය	16	16	-	-	-	-
G – 5	මහ කොළඹ ද්‍රෝණිය	34	22	-	-	√	√
Ko-6	කොලොන්නාව ද්‍රෝණිය	13	1	√	√	-	-
Be- 7	බරව ද්‍රෝණිය	03	-	√	-	-	√
	එකතුව	134	60				

2 වන වගුවට අනුව මෙම ක්‍රමය සංවර්ධනය කිරීමට (2018 - 2021 දක්වා කාල පරිච්ඡේදය) සහ අතින් මිනුම් ගැනීමේ ක්‍රමය ස්වයංක්‍රීයව යාවත්කාලීන වන කියවීමේ ක්‍රමයට පරිවර්තනය කිරීමට සංස්ථාව සැලසුම් කරයි.

2003 වර්ෂයේදී සකස් කරන ලද කොළඹ පුරවර කලාපය සඳහා වැසි ජල අපවහන සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා SLLDC සහ JICA හි විශේෂඥ කණ්ඩායම අතර 2017 දෙසැම්බර් මාසයේදී ගිවිසුමක් අත්සන් කරන ලදී.
එබැවින්, ඉහළ නිරවද්‍යතාවයකින් යුත් වැඩි දත්ත ප්‍රමාණයක් එකතු කර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. ඒ අනුව රු.මිලියන 6ක් පමණ වැය කර උපකරණ කිහිපයක් සහ ස්වයංක්‍රීය ජල මට්ටමේ දත්ත ලඝුගර කිහිපයක් මිලදී ගැනීමට සංස්ථාව තීරණය කරන ලදී.

හානියට පත් මිනුම් මධ්‍යස්ථානවල අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ.

වගු අංක 3 ප්‍රගතියේ සාරාංශය

කේතය	ද්‍රෝණිය	ස්ථාන සංඛ්‍යාව	මේ වනවිට සකස් කරන	හානිය	2018 නව	2018 අලුත්වැඩියා	2019 නව	2019 අලුත්වැඩියා	2019 ස්වයංක්‍රීය මට්ටම
B-1	බොල්ගොඩ ද්‍රෝණිය	40	11	20	5	2	5	4	4
1-2	ජා-ඇළ ද්‍රෝණිය	17	11	2	8	3	7	4	2
M-3	මුදුන් ඇළ ද්‍රෝණිය	18	13	1	0	5	0	5	2
K-4	කළු ඔය ද්‍රෝණිය	16	14	1	0	5	0	4	3
G-5	මහ කොළඹ ද්‍රෝණිය	35	32	1	1	27	1	9	1
KO-6	කොලොන්නාව ද්‍රෝණිය	13	12	0	0	1	0	2	0
BR-7	බරව ද්‍රෝණිය	3	0	0	0	0	0	0	0
	මුළු ස්ථාන	142	93	25	14	43	14	43	12

සේවාදායක ව්‍යාපෘති

1. දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (ESEP) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම

2018 වර්ෂයේදී ESEP සියලු අදියර සඳහා ජලවිද්‍යාත්මක අධ්‍යයන සමාලෝචනය කිරීම සංස්ථාව විසින් සම්පූර්ණ කර ඇත. කෙසේවෙතත්, වරින් වර ස්ථානීය පරීක්ෂා කිරීම් 2019 වර්ෂයේ ද සිදු කර ඇත. 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 0.29 කි.

2. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ජල විද්‍යා අධ්‍යයනය

2017 වර්ෂයේදී සංස්ථාව රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ ජල විද්‍යා අධ්‍යයනය සඳහා උපදේශන සේවා භාර ගන්නා ලදී. අධිවේගී මාර්ගය කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර මුළු දිග කි.මී. 74.0 කි. කාර්යයේ විෂය පථයට ජල විද්‍යාත්මක හා ජල ගතික අධ්‍යයන සිදු කිරීම සහ ඉහළ ගංවතුර මට්ටම් සමඟ හරස් වාසුහවල මාන ලබා දීම ඇතුළත් වේ. ආරම්භයේදී උපදේශනයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15.18 ක් විය. ජල විද්‍යාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සමාලෝචනය කිරීමේ සිට සවිස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනයක් සිදු කිරීම දක්වා විෂය පථය වෙනස් වීම හේතුවෙන් එය සංශෝධනය කරන ලදී. උපදේශනයේ නව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 48.6 කි. කෙසේවෙතත්, ටෙන්ඩර් ක්‍රියාවලිය හරහා බාහිරින් ලබා ගන්නා බැවින් සමීක්ෂණ කාර්යයන්තුවල පිරිවැය වෙනස් විය හැක. මෙය අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද අතර RDA විසින් ගෙවීම් අනුමත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් හදිසි සමීක්ෂණ කටයුතු පමණක් සිදු කරන ලදී. 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 2.5 කි.



රූපය 3. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය

3. මාවනැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය – අදියර II

සේවාදායකයා : මාවනැල්ල ප්‍රා.ලේකම් කාර්යාලය / නාගරික සංවර්ධන අධිකාරිය
අරමුදල් ප්‍රභවය : මාවනැල්ල ප්‍රා.ලේකම් කාර්යාලය / නාගරික සංවර්ධන අධිකාරිය
කාණ්ඩය : සේවාදායක ව්‍යාපෘති/ උපදේශන කාර්යය
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව: රු.මිලියන 3.6 (බදු හැර)

මෙම උපදේශනයේ විෂය පථය වනුයේ නාගරික සංවර්ධන අධිකාරිය යෝජිත මාවනැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැසි ජල අපවහන සැලැස්මක් සකස් කිරීමයි.

2019 වර්ෂය අවසන් වන විට කාර්යයෙන් 90% ක් අවසන් කර ඇත. පිරිවැය ඇස්තමේන්තු සකස් කරමින් පවතී.

ඉහත කාර්යය සඳහා මුළු උපදේශන ගාස්තුව බදු හැර රු. මිලියන 3.6 කි.



රූපය 4. මාවනැල්ල නගර සංවර්ධනය

4. ලොජිස්ටික්ස් සහ ව්‍යාපාර උද්‍යාන ව්‍යාපෘතියේ සහ ඒ අවට ඉඩම් ප්‍රදේශයේ ජල විද්‍යාත්මක හා ජලාපවහන අධ්‍යයනය (LPB) - ඒකල

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය, ජල සැපයුම් සහ නිවාස පහසුකම්
අරමුදල් ප්‍රභවය : නාගරික සංවර්ධන අධිකාරිය ,ජල සැපයුම් සහ නිවාස පහසුකම්, ගගනනගර (Aero city) සංවර්ධන ව්‍යාපෘතිය
කාණ්ඩය : සේවාදායක ව්‍යාපෘති/ උපදේශන කාර්යය
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව: රු.මිලියන 2.87 (බදු සහ අවිනිශ්චිතතා හැර)

මෙම ව්‍යාපෘතිය ලොජිස්ටික් සහ ව්‍යාපාර උද්‍යාන, තෙත්බිම්/විනෝද උද්‍යානය සහ ඒකල නගරය අවට අත්තනගලු ඔය ද්‍රෝණියේ නේවාසික සංවර්ධනය යන ප්‍රධාන ව්‍යාපෘති තුනක් ක්‍රියාවට නැංවීමෙන් සමන්විත වේ. ව්‍යාපෘති ප්‍රදේශයේ නාගරික ජලාපවහන තත්ත්වය තක්සේරු කිරීම සහ එම සංවර්ධනය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ජල විද්‍යාත්මක හා ජල ගතික බලපෑම් ඇගයීම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන වැඩි දියුණු කිරීම් සඳහා ශක්‍යතා මට්ටමේ සැලසුම්, තාක්ෂණික සැලසුම් සහ ප්‍රමාණ පත්‍ර (BOQ), යෝජිත වැඩිදියුණු කිරීම් පිළිබඳ සමාජ-ආර්ථික බලපෑම් ඇගයීම්වලින් සමන්විත වේ. ඒ අනුව SLLDC විසින් අධ්‍යයනය සිදු කර ගිවිසුමට අනුව එය සම්පූර්ණ කරන ලදී.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කටයුතුවල වටිනාකම රු. මිලියන 2.56 කි.



රූපය 5. ලොජිස්ටික් සහ ව්‍යාපාර උද්‍යානයෙහි සැලැස්ම



රූපය 6. තෙත් බිම් උද්‍යානයේ සැලැස්ම

5. බටහිර මහහැර යෑමේ මාර්ගය සහ මහේන්වක්ත තාක්ෂණ නගරය (හෝමාගම) වෙත පිවිසෙන මාර්ග සම්බන්ධ ජලාපවහන පිළිබඳ උපදේශන කාර්යයන්

ව්‍යාපෘති යෝජකයා : බස්නාහිර කලාප තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය
සේවාදායකයා : මාර්ග සංවර්ධන අධිකාරිය
කාණ්ඩය : සේවාදායක ව්‍යාපෘති/ උපදේශන කාර්යය
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව : රු.මිලියන 1.58

හරස් ජලාපවහන අවශ්‍යතාවය, මාර්ග පැති කාණු සහ අවර ජල ඇළ මාර්ග ධාරිතාව තීරණය කිරීම, සැලසුම් ගංවතුර මට්ටම් සැපයීම සහ මාර්ග නිම කිරීමේ මට්ටම් තීරණය කිරීම සඳහා යෝජිත මාර්ග ජාලය සඳහා ජල විද්‍යාත්මක හා ජල ගතික අධ්‍යයන සිදු කිරීම මෙම උපදේශනය වේ. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීම පරිදි පහත වගුවේ දක්වා ඇති

මාර්ග ජාලයෙන් 50% ක් ආවරණය කරමින් 2019 දී අධ්‍යයනය අවසන් කරන ලදී.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම රු. 0.75කි.

වගු අංක 4 මාර්ග කොටසෙහි විස්තර

ස්ථානය පිළිබඳ විස්තර	තාක්ෂණ නගර ව්‍යාපෘති **ID**	දම්වැල් සංඛ්‍යාව	**ප්‍රගතිය**
SLT ජාතික දත්ත මධ්‍යස්ථානයේ සිට NSBM විශ්වවිද්‍යාලය දක්වා දාම්පේ-පිටිපාන පාර	B කොටස	0+570 to 1+610	නිම කර ඇත
SLT ජාතික දත්ත මධ්‍යස්ථානයේ සිට NCS පරිශ්‍රය දක්වා යෝජිත බස්නාහිර මහාමාර්ග යෑමේ මාර්ගය	C කොටස	0+000 to 0+500	නිම කර ඇත
වලව්වත්ත හන්දියේ සිට දියගම හන්දිය දක්වා යෝජිත බස්නාහිර මහාමාර්ග යෑමේ මාර්ගය		0+000 to 1+150	හරස් ජලාපවහන ව්‍යුහ විස්තර සපයා ඇත. මාර්ගය දෙපස කාණු සැලසුම් කිරීම සිදු කරමින්ස පවතී
NSBM සිට UOC පරිශ්‍රය දක්වා යෝජිත මාර්ගය	D කොටස	1+600 to 2+330	නිම කර ඇත



රූපය 7. තාක්ෂණ නගරයේ සැලැස්ම

6. පිළියන්දල - මහරගම මාර්ග ව්‍යාපෘතියේ පුනරුත්ථාපන සහ පරිසර වැඩිදියුණු කිරීම

සේවාදායකයා : මාර්ග සංවර්ධන අධිකාරිය
කාණ්ඩය : සේවාදායක ව්‍යාපෘති/ උපදේශන කාර්යය
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව : රු.මිලියන 4.5

මෙම උපදේශනයේ අරමුණ වන්නේ පිළියන්දල සිට මහරගම දක්වා මාර්ගය සඳහා අවශ්‍ය හරස් ජලාපවහන තීරණය කිරීමයි. සංස්ථාව පුළුල් ජලාපවහන අධ්‍යයන සිදු කර ඇති අතර අවශ්ය හරස් ජලාපවහන අවශ්‍යතා සේවාදායකයාට ලබා දී ඇත. කාර්යයෙන් 80% අවසන් කර ඇත.

2019 වර්ෂය සඳහා කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම රු. මිලියන 3.6 කි.

7. වගවත්ත හන්දියේ සිට වගවත්ත කාර්මික කලාපයේ ප්‍රධාන පිවිසුම දක්වා මාර්ගය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනය

සේවාදායකයා : මාර්ග සංවර්ධන අධිකාරිය
කාණ්ඩය : සේවාදායක ව්‍යාපෘති/ උපදේශන කාර්යය
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව : රු. මිලියන 2.25 (බදු සහ අවිනිශ්චිතතා හැර)

හරස් ජලාපවහන ව්‍යුහ ධාරිතාව, මාර්ග පැති කාණු සහ අවර ජල ඇළ මාර්ග ධාරිතාව සැපයීම සහ මාර්ග නිම කිරීමේ මට්ටම් තීරණය කිරීම සඳහා සැලසුම් ගංවතුර මට්ටම් සැපයීම ඇතුළුව මාර්ගයේ කිලෝමීටර් 2.5 ක දුරක් වැඩි දියුණු කිරීම සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනය පැවැත්වීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. මේ වනවිට සේවාදායකයාගේ අවශ්‍යතාවය අනුව දම්වැල් 1 + 620 සිට 2 + 580 දක්වා මාර්ග කොටසක හරස් මාර්ග ජලාපවහන ව්‍යුහයන්, මාර්ග පැති කාණු සහ ජලය බැස යෑමේ ඇළ මාර්ග විස්තර ලබා දී ඇත. එපමණක් නොව, සම්පූර්ණ මාර්ග කොටස සඳහා වර්ෂ 25 ක ප්‍රතිලාභ කාල පරිච්ඡේදයක් සඳහා ඉහළ ගංවතුර මට්ටම් (HFL) ලබා දී ඇත. කාර්යයෙන් 50% ක් අවසන් කර ඇත.

2019 වර්ෂය සඳහා කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම රු. මිලියන 1.29 කි.



රූපය 8. වගවත්ත මාර්ගයේ සැලැස්ම



රූපය 9. වර්ෂ 25ක ප්‍රතිලාභ කාල පරිච්ඡේදයක් සඳහා ජල ගැලීම් සිතියම

8. සුබිත පුරවර ව්‍යාපෘති

සංස්ථාව විසින් මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන පහත සඳහන් සුබිත පුරවර නගර සංවර්ධන වැඩසටහනේ අධීක්ෂණය සහ ව්‍යාපෘති කළමනාකරණය ඇතුළු ඒකාබද්ධ උපදේශන සේවාවක් සිදු කරනු ලැබේ. ව්‍යාපෘති පහත පරිදි වේ. කාර්යය සඳහා ඒකාබද්ධ ගාස්තුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 6% කි.

8.1 "සුබිත පුරවර" යටතේ සැලසුම් සහ ඉදිකිරීම් කාර්යයන්වල ප්‍රගතිය ("සියත උයන" - ගම්පහ)

සේවාදායකයා : UDA (සුබිත පුරවර වැඩසටහන)
අරමුදල් නියෝජිතායතනය : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ඉංජිනේරුවරයා : ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ගෘහනිර්මාණ ශිල්පියා : නාගරික සංවර්ධන අධිකාරිය
ප්‍රධාන කොන්ත්‍රාත්කරු : ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය :

අදියර 1 සඳහා

- අදියර 1 - රු.මිලියන 8.06 (බදු සහ අවිනිශ්චිතතා ඇතුළුව)

- අදියර 2 - රු.මිලියන 41.95
  (බදු සහ අවිනිශ්චිතතා ඇතුළුව)
- අදියර 3 - රු. මිලියන 124.35
  (බදු සහ අවිනිශ්චිතතා ඇතුළුව)

මුළු ව්‍යාපෘති කාල සීමාව : වර්ෂ 3
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව : ක්‍රියාවට නැංවීමේ පිරිවැයෙන් 3%

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගම්පහ බණ්ඩාරනායක පාසල ඉදිරිපිට අතහැර දමා ඇති කුඹුරු ඉඩමෙහි නාගරික තෙත්බිම් උද්‍යානයක් සංවර්ධනය කිරීමයි. ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඇති අතර UDA විසින් අත්පත් කරගත් ප්‍රදේශය සඳහා වැසි ජල අපවහන සැලැස්ම සකස් කර ඇත. පළමු අදියරෙහි සවිස්තරාත්මක සැලසුම් UDA වෙත ඉදිරිපත් කර ඇති අතර ව්‍යාපෘතිය අදියර අනුව ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතියේ උපදේශන ගාස්තුව ව්‍යාපෘති පිරිවැයෙන් 3% කි.



රූපය 10. වැසි ජල අපවහන සැලැස්ම

8.2 කාවන්තිස්සවැව නාගරික උද්‍යානය ව්‍යාපෘතිය. අදියර – III සහ IV

සේවාදායකයා : UDA (සුබිත පුරවර වැඩසටහන)
අරමුදල් නියෝජිතායතනය : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ඉංජිනේරුවරයා : SLLDC
ගෘහනිර්මාණ ශිල්පියා : UDA
ප්‍රධාන කොන්ත්‍රාත්කරු : SLLDC
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව:
අදියර – III = රු. මිලියන 93.1
අදියර – IV = රු. මිලියන 30.4
කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය :
02.05.2018 සිට 30.04. 2019

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 1.92

ඇඹිලිපිටිය කවන්තිස්ස වැව මහජනයා සඳහා නාගරික උද්‍යානයක් ලෙස පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් UDA විසින් සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය විසින් සිදු කරන ලද අතර ජලාපවහන හා උපදේශන කටයුතු පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් සිදු කරන ලදී.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 1.92



රූපය 11 කාවන්තිස්සවැව සඳහා ජලාපවහන සැලැස්ම

8.3 මහනුවර ශ්‍රී දළදා මාළිගාව සඳහා යටිතල පහසුකම්, අදියර – III

සේවාදායකයා : මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශකයා : SLLDC
ගෘහනිර්මාණ ශිල්පියා : UDA
කොන්ත්‍රාත්කරු : මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම(CESL)
කොන්ත්‍රාත් මුදල : රු. මිලියන 45.5
කොන්ත්‍රාත් කාල සීමාව : දින 270
ආරම්භ කළ දිනය : 19.08.2018
නිම කිරීමට අපේක්ෂිත දිනය : 18.04.2019
සත්‍ය වශයෙන් නිම කළ දිනය : 30.06.2019
සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල : රු.මිලියන 50.7

ශ්‍රී දළදා මාළිගාව පරිශ්‍රයේ සිදුරු සහිත නල ජලාපවහන පද්ධතියක් සහ කුණාටු ජල ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. ස්ථානීය පරීක්ෂාවේදී මාළිගාව වටා ඇති ප්‍රමාණවත් නොවන ජලාපවහන පද්ධතිය හඳුනාගන්නා ලදී. සමහර ජලාපවහන මාර්ග දිය අගල වෙත හරවා ඇති අතර, දිය අගලෙහි සම්බන්ධක ස්ථානයේ දැඩි ලෙස රොන්මඩ එක්රැස් වී ඇත. ඉහත ගැටළු නිරාකරණය කිරීම සඳහා SLLDC විසින් ජලාපවහන පද්ධතියක් ඇතුළු ප්‍රධාන ජලාපවහන සැලැස්මක් සකස් කරන ලදී.

සේවාදායකයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව මහ මළුව ප්‍රදේශයට නව ජල විදින ක්‍රමයක් සහ තණ තිල්ලක් හඳුන්වා දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය 2019 ජූනි මස 30 දින සම්පූර්ණ කරන ලදී.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 3.1



රූපය12. මාළිගාව පරිශ්‍රයේ ජල විදින



රූපය 13. කුඹඹ බෝක්කු ඉදිකිරීම

8.4 මහනුවර ශ්‍රී දළදා මාළිගාව සඳහා යටිතල පහසුකම්, අදියර – IV

සේවාදායකයා	: මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශකයා	: SLLDC
ගෘහනිර්මාණ ශිල්පියා	: UDA
කොන්ත්‍රාත්කරු	: මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (CESL)
කොන්ත්‍රාත් මුදල	: රු. මිලියන 27.3
කොන්ත්‍රාත් කාල සීමාව	: දින 270
ආරම්භ කළ දිනය	: 20.06.2019
නිම කිරීමට අපේක්ෂිත දිනය: 17.10.2019	
සත්‍ය වශයෙන් නිම කළ දිනය	: 30.12.2019
සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල	: රු. මිලියන 21.7

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ පුරාවිද්‍යාත්මක අංගයන්ගේ වටිනාකම ආරක්ෂා කරමින් ජලාපවහන යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමයි. මෙම උපදේශනය යටතේ සංස්ථාව විසින් පරිශ්‍රයේ ජලය එක්රැස් වීමට ඉඩ නොදී පරිශ්‍රය තුළ එකතු වන වැසි ජලය දිය අගල වෙත ගලා යෑමට සඳහා ජලාපවහන පද්ධතිය ප්‍රතිනිර්මාණය කරන ලදී.

දළදා මාළිගාව පරිශ්‍රයේ ජල විදින පද්ධතිය සඳහා පොම්පාගාරයක් සහ ළිඳක් ඉදිකිරීම සහ ප්‍රභූ පිවිසුම් දොරටුව අසල බෝක්කු ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. 2019 අප්‍රේල් ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් සේවාදායකයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව අතිරේක වැඩ කිහිපයක් කළ යුතුව තිබුණි. සේවාදායකයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව මෙම කොන්ත්‍රාත්තුව සඳහා උඩවත්ත වනාන්තර ප්‍රදේශයේ අතුරගුළු ගල් ඇල්ලීම සහ බිම් සැකසීම ඇතුළත් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 30 දින සම්පූර්ණ කරන ලදී.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 1.36



රූපය 14. ජල විදින පද්ධතිය සඳහා පොම්පාගාරය



රූපය 15. ජල විදින පද්ධතිය සඳහා ජලය පොම්ප කරන ළිඳ

9. තල්දූව මහජන පොළ සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ස්ථානීය ගංවතුර අවම කිරීම සඳහා නිසි ජලාපවහන කළමනාකරණ සැලැස්මක් ඇතුළුව සතිපොළ ප්‍රදේශයේ කොටසක් සංවර්ධනය කිරීමයි.

සේවාදායකයා	: මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශකයා	: SLLDC
ව්‍යාපෘති පිරිවැය	: රු. මිලියන 45.707 (VAT හැර)
කොන්ත්‍රාත්කරු	: වීරසූරිය බිල්ඩර්ස්
කොන්ත්‍රාත් කාල සීමාව	: දින 180
ආරම්භ කළ දිනය	: 26.07.2018
2019වර්ෂය අවසානයේදී ප්‍රගතිය: නිම කර ඇත	

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 0.32



රූපය 16. තල්දූව පොළ අවට ප්‍රදේශය සඳහා ජලාපවහන සැලැස්ම



රූපය 17. පොළ ප්‍රදේශය සඳහා භූමිය සැකසීම

10. අත්තිඩිය ළමා නිවාසය සඳහා යෝජික නව ගොඩනැගිල්ල - අදියර I

සේවාදායකයා	: නාගරික සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන සහ නිවාස පහසුකම්
උපදේශකයා	: SLLDC
කොන්ත්‍රාත්කරු	: GPD ඉංජිනියරින් (පෞද්.) සමාගම

කොන්ත්‍රාත් මුදල : රු. මිලියන 54.95 (VAT හැර)
සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල : රු. මිලියන 55.08 (VAT හැර)
කොන්ත්‍රාත් කාල සීමාව : දින 270
ආරම්භ කළ දිනය : 22.05.2018
නිම කිරීමට අපේක්ෂිත දිනය : 17.02.2019
සත්‍ය වශයෙන් නිම කළ දිනය : 05.12.2019
2019 වර්ෂය අවසානයේදී ප්‍රගතිය: නිම කර ඇත

RCC ව්‍යුහයන් සහ දැව වහළ සහිත ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. එක් ගොඩනැගිල්ලක් මහල් දෙකකින් යුක්ත වන අතර සෑම මහලකම සාමාන්‍ය බිම් ප්‍රමාණය වර්ග මීටර් 355 කි. අනෙක් ගොඩනැගිල්ල වර්ග මීටර් 68 ක බිම් ප්‍රමාණයකින් යුත් තනි මහල් ගොඩනැගිල්ලකි.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 0.98



රූපය 18.

11. රාගම, වල්පොල පිහිටි කිතුදාන පුබුදුව ජාතික මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම අදියර –III

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන සහ නිවාස පහසුකම්
උපදේශකයා : SLLDC
කොන්ත්‍රාත්කරු : JSM කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්.) සමාගම
මුල් කොන්ත්‍රාත් මුදල : රු.මිලියන 20.67 (VAT හැර)
කොන්ත්‍රාත් කාලය : දින180
ආරම්භ කළ දිනය: 09.08. 2018
2019 වර්ෂය අවසානයේදී ප්‍රගතිය – 99%

නවාතැන් ගොඩනැගිලි ඉදිකිරීම සහ ගොඩනැගිලි ප්‍රදේශය අවට වැසි ජල අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතිට යටතේ සිදු කෙරේ. නවාතැන් ගොඩනැගිල්ල වහළ ටෙරසයක් සහිත RCC තනි තට්ටු ගොඩනැගිල්ලකි. ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වර්ග අඩි 2500 කි.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 0.62

- **නාගරික සංවර්ධන අධිකාරිය සඳහා උපදේශන කාර්යයන්**

පහත සඳහන් ව්‍යාපෘතිවල ගොඩනැගිලි සහ පාලම් සඳහා වැසි ජල අපවහන සැලසුම් සහ වැසි ජල අපවහන ප්‍රධාන සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම. කාර්යය සඳහා උපදේශන ගාස්තුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 3% කි.

12. යෝජිත බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය, අදියර -I

නාගරික සංවර්ධන අධිකාරිය විසින් බොරලැස්ගමුව වැව පුනරුත්ථාපනය කිරීම සඳහා සැලැස්මක් සකස් කර ඇත. අරමුදල් පැවතීම අනුව ව්‍යාපෘතියේ පළමු අදියර I , අදියර II සහ අදියර III වශයෙන් ගේබියන් බැම් යොදා ඉවුරු ආරක්ෂා කිරීමට යෝජනා කරන ලදී.

ව්‍යාපෘති පිරිවැය : රු.මිලියන 68.4
කොන්ත්‍රාත්කරු : SF කන්ස්ට්‍රක්ෂන්ස්
කොන්ත්‍රාත් කාල සීමාව: 01.08.2018 සිට 31.01.2019

2019 වර්ෂය සඳහා අදියර I, II & III වෙනුවෙන් සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 8.83



රූපය 19. වැව ඉවුර සඳහා ගේබියන් බැම්ම ඉදිකිරීම



රූපය 20. වැවෙහි ඉවුරු පිරවීම

13. මාකුඹුර නාගරික සංවර්ධන කාර්යයන්

සේවාදායකයා : UDA සහ 3K ව්‍යාපෘතිය
උපදේශකයා : SLLDC පර්යේෂණ සහ සැලසුම් ඒකකය
කොන්ත්‍රාත්කරු : SLLDC ජලාපවහන සහ ගොඩකිරීම් ඒකකය
මුළු ව්‍යාපෘති පිරිවැය : රු. මිලියන 1.003
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව : ක්‍රියාවට නැංවීමේ පිරිවැයෙන් 3%

මාකුඹුර අන්තර් නුවමාරු නගර සංවර්ධන ව්‍යාපෘතිය මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අංගයකි. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ බස් රථ නැවතුම්පළක් සහ බස් හා දුම්රිය සේවය එකිනෙක හා සම්බන්ධ වී ඒකාබද්ධ මහාමාර්ග ප්‍රවාහන ජාලයක් නිර්මාණය වන බහුආකෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා දැනට පවතින කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීමයි. දක්ෂිණ අධිවේගී මාර්ගය කොට්ටාව පිවිසුමේ සිට කොළඹ දෙසට මීටර් 300 ක් දුරින් MMC පිහිටා ඇති අතර බස්නාහිර පළාතේ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථාන 3 ක් එනම් කඩවත, කඩුවෙල සහ කොට්ටාව සම්බන්ධ කරන පිටත වටරවුම් අධිවේගී මාර්ගයද (OCH) ආසන්නයේ පිහිටා. නගර සංවර්ධනය සඳහා හඳුනාගත් ස්ථානය හයිලෙවල් මාර්ගය දෙපස හෙක්ටයාර 8.6 ක (අක්කර 21) අත්හැර දැමූ තෙත් බිමක් (වී වගාවක්) වන අතර, කැලණි වැලි දුම්රිය මාර්ගයද භූමියේ බටහිර සීමාවේ කොටසක් පසෙකින් වැටී ඇත. මාකුඹුර කොට්ටාව නගර මායිමේ සිට කි.මී. 1.2 පමණ දුරින් පිහිටා ඇත. කොට්ටාව නගරයෙන් ආරම්භ වන පළාත්බද බස් මාර්ග 7 ක් ඇති අතර බොහෝ අන්තර් පළාත් බස් රථද මෙම මාර්ගයෙන් ගමන් කරයි. අරමුදල් පැවතීම අනුව මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයකින් සිදු කර ඇත.

SLLDCහි ප්‍රධාන කාර්යය වන්නේ ඉඩම් පිරවීම සහ අනාගතයේදී ගංවතුර වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශයේ ජල අපවහන පද්ධතියක් නිර්මාණය කිරීමයි.

SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් මාකුඹුර බහුආකෘතික මධ්‍යස්ථානය (MMC) සඳහා ඉඩම් සංවර්ධනය හා ජලාපවහන වැඩි දියුණු කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම ඇතුළු සැලසුම් හා උපදේශන සේවාවක් හාර ගෙන ඇත. වර්ෂ 25 ක ඉදිරි කාලපරිච්ඡේදයක් සලකා බලන ලද අතර, රඳවා තබා ගැනීමේ ජලය උඩුගං ප්‍රදේශය තුළ ගබඩා කර හයිලෙවල් මාර්ගය හරහා බෝක්කු දෙකක් මඟින් ගලායාම පාලනය කිරීමට තීරණය විය.

2019 වර්ෂය සඳහා සිදු කරන ලද උපදේශන කාර්යයන්වල වටිනාකම – රු. මිලියන 8.78



රූපය21. වැඩබිමෙහි සමස්ත දර්ශනය



රූපය 22.



රූපය 23. MMC ව්‍යාපෘතියේ බෝක්කු සහ කාණු ඉදිකිරීම



රූපය 24. මාකුඹුර බහුආකෘතික මධ්‍යස්ථාන සඳහා ජලඅපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන සැලැස්ම

14. කුඩා සහ මහ වස්කඩුව ප්‍රදේශය සඳහා යෝජිත ජල අපවහන වැඩි දියුණු කිරීමේ සැලැස්ම

සේවාදායකයා : දිස්ත්‍රික් ලේකම් - කළුතර
සැලසුම් සහ ඉදිකිරීම : SLLDC
ව්‍යාපෘති පිරිවැය : රු.මිලියන 314

වස්කඩුව ප්‍රදේශයේ ඇති වූ ගංවතුර ගැටලුව විසඳීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කළ ඉල්ලීම මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා සලකා බලන ප්‍රදේශය වර්ග කිලෝමීටර 1.15 ක් පමණ වන අතර නැගෙනහිරින් ගාලු පාරෙන් සහ බටහිරින් මුහුදෙන්ද දුම්රිය ස්ථාන අංක 1 සිට ආබෘාධ මාවත දක්වා මායිම් වේ. සෑම වසරකම දරුණු ගංවතුර තත්ත්වයන් මඟින් මෙම ප්‍රදේශයට බලපෑම් එල්ල වේ.

මීට අමතරව, මානාගල ඇළ මාර්ගය මුහුදට වැටෙන මෝයෙහි වැලි කඳු සෑදීමේ සෑදීමේ ගැටලුවක් ද විය. SLLDC වැලි කඳු සෑදීම වළක්වා ගැනීම සඳහා විශේෂ අපවාන සැලැස්මක් යෝජනා කළ අතර වෙරළ ඉංජිනේරු ඒකකයේ අනුමැතිය ලබා ගත්තේය. යටිගඟ ඔස්සේ ජලය ගලා යෑම ඉහළ නැංවීම සඳහා දුම්රිය මාර්ගය ඔස්සේ හරස් වාහනයන් ඉදිකිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ස්වයං ව්‍යාපෘති

1. ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මුතුරාජවෙල පිහිටි අක්කර 100ක ඉඩමක් සංවර්ධනය කිරීම

රට බලශක්ති අර්බුදයකට මුහුණ දී සිටින අතර වර්තමාන ඉල්ලුම සපුරාලීම සඳහා තවත් විදුලි බලාගාර පිහිටුවීමේ අවශ්‍යතාවයක් පවතී. එබැවින් ගල් අඟුරු හෝ ඩීසල් වැනි ප්‍රභවයන්ට වඩා පරිසර හිතකාමී බැවින් ද්‍රව ස්වාභාවික වායු (LNG) දැවුම් බලාගාරයක් ඉදිකිරීමට තීරණය විය. කාමර උෂ්ණත්වයේ දී වායුමය ස්වරූපයෙන් පවතින LNG නැව් මඟින් ප්‍රවාහනය කිරීම සඳහා ද්‍රව ස්වරූපයට පරිවර්තනය කළ යුතුය. LNG ගොඩ බෑමෙන් පසු එය වායුමය ආකාරයෙන් ගබඩා කර නල මාර්ගයෙන් අවශ්‍ය බලාගාර වෙත ප්‍රවාහනය කෙරේ. මෙම ගබඩා ඒකකය පාවෙන ගබඩා නැවත වායු බවට පත් කිරීමේ ඒකකය (FSRU) ලෙස හැඳින්වෙන අතර එය සාමාන්‍යයෙන් ඉදිකර ඇත්තේ බත්තලක් මතය. FSRU ඉදිකිරීමේ පිරිවැය ඉතා ඉහළ බැවින්, යෝජිත විදුලි බලාගාර සඳහා සහ කැළණිතිස්ස සහ කෙරවලපිටියේ දැනට පවතින විදුලි බලාගාර සඳහා මෙම එකම FSRU භාවිතා කිරීමට පහසුකම් සැලසීම සඳහා කොළඹ වරායට ආසන්නයේ LNG දැවුම් බලාගාර දෙක ස්ථාපිත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) අක්කර 100 ක ඉඩමක් සොයමින් සිටියේය. තවද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන පැටවීමේ මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ බටහිර කලාපයේ ය.

මේ සඳහා මුතුරාවෙල වගුරු බිමෙහි අක්කර 100 ක භූමි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. මෙම ඉඩම කට්ටි 2 කින් සමන්විත වේ. අක්කර 55.9කින් සමන්විත කට්ටි අංක I, SLLDC ට අයත්

වන අතර අක්කර 40.7 කින් සහ සමන්විත වන කට්ටි අංක II වත්තල ප්‍රාදේශීය ලේකම්වරයාගේ භාරකාරිත්වය යටතේ පවතී. විදුලි බලාගාර පිහිටුවීම සඳහා මෙම ඉඩම් CEB වෙත කල්බදු දීමට කැබිනට් තීරණයක් (06.02.2019 දිනැති කැබිනට් සංදේශ අංක 19/0223/113/006) ගෙන ඇත. කොන්ත්‍රාත්කරු ලෙස කට්ටි අංක I SLLDC විසින් සංවර්ධනය කරනු ඇත. කට්ටි අංක II SLLDC විසින් සංවර්ධනය කර ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත CEB වෙත කල්බදු දෙනු ලැබේ.

ඉහත ව්‍යාපෘතියේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව (EIA) සකස් කිරීම SLLDC විසින් භාර ගන්නා ලදී. ජල විද්‍යාත්මක අධ්‍යයනය සහ පරිසරවිද්‍යාත්මක අධ්‍යයනය SLLDC විසින් එහි කාර්ය මණ්ඩලය මඟින් සිදු කරන ලද අතර සමාජ විද්‍යා කොටස බාහිරට ලබා දෙන ලදී. මෙම අධ්‍යයනය සඳහා ක්‍රියාත්මක කරන ජල විද්‍යා ආකෘති වන්නේ HEC RAS, HEC HMS, MIKE11, MIKE 21 සහ MIKE FLOOD ය. 26/2/2020 දින CEB සමඟ පැවති රැස්වීමේදී එකඟ වූ පරිදි පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව සකස් කිරීමේ පිරිවැය වන රු. මිලියන 11 CEB සහ SLLDC විසින් ඉඩම් ප්‍රමාණය අනුව අනුපාතිකව බෙදා ගනු ඇත. 2019 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයේ වටිනාකම පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව සකස් කිරීම සඳහා රු.මිලියන 3කි.

භාරන ලද අක්වෙරළ වැලි භාවිතයෙන් ඉඩම් පිරවීම සිදු කිරීමට සැලසුම් කර ඇත.



රූපය 25. මුතුරාජවෙල ඉඩම සඳහා ජලාපවහන කළමනාකරණ සැලැස්ම

2. රජයේ සේවකයන් සඳහා මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ රාගම මුල් ඉඩම් හිමියන් සඳහා පාරිතෝෂික යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම්, නේවාසික සහ වාණිජ සංවර්ධනය සඳහා නම් කර ඇති රාගම පිහිටි හෙක්ටයාර 20.93 (අක්කර 51.7 පමණ) ඉඩමක් මේ වනවිට SLLDC සතු වේ. එබැවින් නගරයට ආසන්න බව සැලකිල්ලට ගනිමින් නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා මෙම ස්ථානය බෙහෙවින් සුදුසු ය. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ඉහත සඳහන් ඉඩම තුළ අක්කර 4.5 ක භූමි ප්‍රමාණයක මූලික යටිතල පහසුකම් ඇතුළුව බහුකුළුණුවල සභාධිපත්‍ය ස්වරූපයෙන් අවම වශයෙන් නිවාස ඒකක 400 කින් සමන්විත රජයේ සේවකයන් සඳහා මධ්‍යම ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට SLLDC විසින් යෝජනා කරන ලදී.

ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පිහිටි ඉහත සඳහන් ඉඩම 2008 දී සංවර්ධන කටයුතු සඳහා SLLDC විසින් අත්පත් කරගත් ඉඩමකි. තවද, සංවර්ධනයෙන් පසු කාර්මික, වාණිජ, නිවාස හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා එම ඉඩම වෙන් කිරීමට SLLDC වෙත බලය ඇත.

මෙම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භයේ සිටම, යෝජිත සංවර්ධනය සඳහා ස්වකීය ඉඩම් පරිත්‍යාග කළ මුල් ඉඩම් හිමියන් (ඔවුන්ගෙන් වැඩි දෙනෙක් තවමත් නිවාස නොමැති අය වේ), ප්‍රතිලාභවලින් අවම වශයෙන් කොටසක් ඔවුන් සමඟ බෙදා ගන්නා ලෙස SLLDC වෙතින් ඉල්ලා සිටියේය. ඒ අනුව, මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා එක් එක් ඉඩම් හිමියන් පරිත්‍යාග කර ඇති ඉඩම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් සමානුපාතිකව අලුතින් ඉදිකරන ලද නිවසක හිමිකාරිත්වය ලබා දීමේ පාරිතෝෂික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට SLLDC අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කළේය.
ඒ අනුව පහත පරිදි වෙන වෙනම නිවාස ව්‍යාපෘති දෙකක් සැලසුම් කරන ලදී.

- පාරිතෝෂික යෝජනා ක්‍රමය සඳහා නිවාස ව්‍යාපෘතිය
- මධ්‍යම ආදායම් රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ව්‍යාපෘතිය

2019 වර්ෂයේ සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම;

- ගෘහනිර්මාණාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ පාරිතෝෂික යෝජනා ක්‍රමය සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම – රු. මිලියන 1.0
- ගෘහනිර්මාණාත්මක සැලසුම්, නිවාස ඒකක 400 කින් සමන්විත මහල් 15 ක සභාධිපත්‍ය කුළුණුවල මූලික ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම– රු. මිලියන 9.0 (මධ්‍යම ආදායම් රාජ්‍ය සේවකයන් සඳහා)



රූපය 26. මධ්‍යම ආදායම් රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ව්‍යාපෘතිය



රූපය 27. සැලැස්ම - පාරිතෝෂික යෝජනා ක්‍රමය සඳහා නිවාස ව්‍යාපෘතිය



රූපය 28. පාරිතෝෂික යෝජනා ක්‍රමය සඳහා නිවාස ව්‍යාපෘතිය

තෙත් බිම් කළමනාකරණ අංශය

දියසරු උද්‍යානය

දියසරු යනු වගුරු බිමක් වන අතර එහි අලංකාරයට හානියක් නොවන පරිදි 2013 දී උද්‍යානයක් බවට පරිවර්තනය කරන ලදී. තෙත්බිම් ආශ්‍රිත CEPA (සන්නිවේදනය, අධ්‍යාපනය, සහභාගිත්වය සහ දැනුම්වත්භාවය) ක්‍රියාකාරකම් සහ දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා සංචාරක ගමනාන්තයක් සපයන තෙත්බිම් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන කොළඹ නගරයේ ප්‍රධානතම ආකර්ශනීය ස්ථානයක් බවට දියසරු උද්‍යානය පත්ව ඇත. තෙත් බිමක් වන මෙම උද්‍යානය වගුරු පැළෑටිවලට සහ ක්ෂීරපායින්, කුරුල්ලන්, සමනලුන්, මසුන්, උභයජීවීන්, උරගයින්, බත්කුරන්, කිඹුලන් සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති කළෑ බළලුන් වැනි සත්තයන්ට වාසස්ථාන සපයයි. දියසරු උද්‍යානය අක්කර 65 ක වගුරු බිමක් ආවරණය කරමින් පවතින අතර අධ්‍යයන මධ්‍යස්ථානය, විවෘත අධ්‍යයන ප්‍රදේශය, පුවරු ඇවිදීම, සමනල උද්‍යානය, ළමා පොකුණ, ඇළ මාර්ග, පක්ෂි නැරඹුම් කුළුණ, පොරොත්තු මධ්‍යස්ථානය (විවේක කුටිය), භූගත ජල ළිං, කෘෂිකාර්මික ප්‍රදේශය, විද්‍යාගාරය, කාර්යාලය, ටිකට් කවුන්ටරය, වාහන නැවතුම් ස්ථානය, ගබඩා කාමරය සහ කම්කරු නිවහන යන අංගවලින් සමන්විත වේ.





විශේෂ අවස්ථා

දියසරු උද්‍යානය විවිධ කණ්ඩායම් සඳහා නාගරික තෙත්බිම් සංරක්ෂණය පිළිබඳව 2019 දී බොහෝ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වූ අතර ඒවා ප්‍රධාන වශයෙන් සොබාදහම සමඟ මිනිසුන් සම්බන්ධ කිරීම සඳහා නිර්මාණය කරන ලදී. 2019 ලෝක තෙත්බිම් දිනයට උද්‍යානය විශාල කාර්යභාරයක් ඉටු කළේය; ප්‍රදර්ශන, ගස් සිටුවීමේ වැඩසටහනක් සහ තෙත්බිම් පොළක් පැවැත්වීමෙන් SLLDC විසින් සැමරුම් වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. එපමණක් නොව මහාචාර්ය දේවක වීරකෝන් මහතා විසින් තෙත්බිම් පිළිබඳ දේශනයක් පැවැත්වූ අතර ඒ සමඟම කොළඹ තෙත්බිම් නගරය නාගරික සංවර්ධන අධිකාරියට යටතට පත් කරන ලදී. දියසරු උද්‍යානයේදී SLLDC තෙත්බිම් කළමනාකරණ අංශයේ සාමාජිකයන් අලුත් අවුරුදු උත්සවය සැමරිය. 2019 ඔක්තෝම්බර් මාසයේදී දියසරු උද්‍යානය දින 7 ක් පාසල් ළමුන් සමඟ ළමා දින වැඩසටහන සමරනු ලැබීය. මීට අමතරව, උද්‍යානය විසින් තවත් බොහෝ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී, ඥානවන්ත භාවිතය සහ තිරසර නාගරික තෙත්බිම් කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය සහ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා සුරක්ෂි වැඩසටහන උදාහරණ ලෙස ගත හැක.

එපමණක් නොව, තෙත්බිම් සති අන්ත වැඩසටහන මඟින් ළමුන් සහ වැඩිහිටියන් සඳහා මාසයේ සෑම තෙවන සතියකම විශේෂ තේමාවක් සහිත වැඩසටහනක් පවත්වයි. මෙම වැඩසටහන් හරහා විශාල ආගන්තුක ප්‍රජාවක් උද්‍යානය සමඟ සම්බන්ධ වී ඇත. තවද, මෙම උද්‍යානය බාහිර පාර්ශවයන් විසින් සොබාදහමේ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලදී.



ජාත්‍යන්තරකරණය

ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම සඳහා දියසරු උද්‍යානයට 2019 වසර වැදගත් වසරක් විය. රැම්සාර් (RAMSAR) සම්මුතිය මඟින් දකුණු කොරියාවේ පවත්වන ලද වට මේස සාකච්ඡාවකට නගර නගරාධිපතිවරුන් 18 දෙනෙකු සමඟ SLLDC හි තෙත්බිම් කළමනාකරණ අංශයේ සාමාජිකයන් සහභාගි විය. වර්ෂය තුළ බොහෝ ජාත්‍යන්තර නියෝජිත කණ්ඩායම් පැමිණි අතර නිදසුනක් වශයෙන් 2019 ඔක්තෝබර් මාසයේදී නගර උද්‍යාන පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා කොරියානු ජනරජයේ සන්වයොන් නගරයේ උප නගරාධිපතිවරයා පැමිණියේය.



ඉදිකිරීම් සහ නඩත්තු කාර්යයන්

වාසස්ථාන වැඩි දියුණු කිරීම, නරඹන්නන්ගේ ආකර්ශණට ලක් වන ප්‍රදේශ සහ නව ඉදිකිරීම් ඇතුළත් නරඹන්නන් ආකර්ෂණය කර ගැනීම, අමුත්තන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම උද්‍යාන නඩත්තු කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා නව භෞතික අංග රැසක් උද්‍යානය විසින් හඳුන්වා දෙන ලදී. මෙම ලක්ෂණ වන්නේ; උද්‍යානයේ තණ පිඩැලි ඇල්ලූ ප්‍රදේශ වැඩි කිරීම, නව සපුෂ්පක ප්‍රදේශ, නව ආවේණික තෙත්බිම් පැල 500 ක් සිටුවීම, කුරුල්ලන්ගේ වාසස්ථාන වැඩි දියුණු කිරීම, පැල තවාන වැඩි දියුණු කිරීම (2000ක් දක්වා) ගෙවත්ත සහ ඇවිදීමේ මංතීරු, සපත්තු පාලම්, විවේක ගැනීමේ කුටි, අධ්‍යයන මධ්‍යස්ථාන නඩත්තු කිරීම වේ. තවද, දිනපතා කම්කරුවන් විසින් ඇවිදීමේ මංතීරු පිරිසිදු කිරීම සහ සතියකට වරක් ඔවුන් විසින් පඳුරු කැපීම, තණකොළ කැපීම සහ ඇළ මාර්ග අතින් පිරිසිදු කිරීම සිදු කරනු ලැබේ. තවද, 2019 දී ආරම්භ කරන ලද ප්‍රධාන ඉදිකිරීම් කිහිපයක් විය; එනම් නව ටිකට්පත් කවුන්ටරය ඉදිකිරීම, කම්බි දැල් සවි කිරීම (කිඹුලන්ගෙන් ආරක්ෂා වීම සඳහා), කුරුලු නැරඹුම් කුළුණේ අත් වැට අලුත්වැඩියා කිරීම සහ දූපත් අංක 2හි පාලම නැවත ඉදිකිරීම වේ.



සංවර්ධනය

2019 වර්ෂයේදී උද්‍යානයෙ ආදායම දළ වශයෙන් රු. මිලියන 9.7 ක් වූ අතර එය වසර 6 ක් තුළ උද්‍යානයේ සංවර්ධනය පෙන්නුම් කරයි. වර්තමානයේ දියසරු උද්‍යානය ළමුන්, තරුණයන් සහ වැඩිහිටියන් මෙන්ම විදේශිකයන් අතරද ඉතා ජනප්‍රිය වී ඇති අතර එය හොඳින් සංවර්ධනය වූ උද්‍යානයක් බවට පත් වෙමින් පවතී. දියසරු උද්‍යානය පිළිබඳව බොහෝ රූපවාහිනී වාර්තා වැඩසටහන් විකාශනය විය.බොහෝ රූපවාහිනී වාර්තා චිත්‍රපට ද විය. ඊට අමතරව, උද්‍යාන ෆේස්බුක් පිටුව උද්‍යානයේ ප්‍රධාන අළෙවිකරණ මෙවලමක් විය.







තෙත්බිම් සංරක්ෂණය හා පහත් බිම් සංවර්ධනය සඳහා වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

මෙම වැඩසටහන 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර එය වාර්ෂික වැඩසටහනක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ, පහත් බිම් සංරක්ෂණය සහ තෙත්බිම් ඥානවන්ත භාවිතය සම්බන්ධයෙන් මහජනතාව මෙන්ම ඉඩම් සංවර්ධනය කිරීමට අදාළ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමයි. මේ වර්ෂයේදී ලෝක තෙත්බිම් දිනය, ලෝක ජල දිනය ආදිය සඳහා විශේෂ අනුස්මරණයන් සිදු කරන ලදී. රු. මිලියන 5.9 ක මුළු පිරිවැයක් දරමින් තෙත්බිම් සංරක්ෂණය සඳහා සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් 21 ක් පවත්වන ලදී.



කළු ඔය ද්‍රෝණියේ තෝරාගත් ප්‍රදේශයක ජලාපවහනය වැඩි දියුණු කිරීම සහ කළු ඔය ශක්‍යතා අධ්‍යයනය මඟින් යෝජනා කරන ලද ගංවතුර අවම කිරීමේ විකල්පයන් විස්තර කිරීම

දැනට පවතින ජලාපවහන පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රාගම වෛද්‍ය පීඨය ප්‍රදේශය ආසන්නයේ නිරන්තරයෙන් ස්ථානීය ගංවතුර ඇති වේ. එබැවින් ගංවතුර අවම කිරීම සඳහා පවත්නා ව්‍යුහයන් පුනරුත්ථාපනය කිරීම හා පවතින ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.



2019 වර්ෂයේදී ප්‍රධාන ව්‍යාපෘති මඟින් අවධානය යොමු නොකරන ලද රාගම, නෙලුම් මාවතෙහි ස්ථානීය ගංවතුර අවම කිරීම සැලසුම් සකස් කර ඇති අතර එය වර්ෂයේ අග භාගයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කර බෝක්කු සහ මාර්ග පැති කාණු සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරන ලදී. සැලසුම් වාර්තාව NPD අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. NPD අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2020 වර්ෂයේදී කාර්යයන් ආරම්භ කිරීමට නියමිතය.



කොළඹ ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහන (CWQM)

අහස උසට නැගුනු තට්ටු නිවාස ගොඩනැගිලි සංඛ්‍යාවෙහි වැඩි වීම සමඟින් කොළඹ නගරය වේගයෙන් නාගරීකරණය වෙමින් පවතී. ගෘහස්ථ/කාර්මික අප-ජල එකතු කිරීම හා පිරිපහදු කිරීම සඳහා නිසි නල පද්ධතියක් නොමැති විට මෙම වාසස්ථානවලින් උත්පාදනය වන අප-ජලය අවසානයේ ඇළ මාර්ගයට මුදා හරිනු ඇත. මෙය දැනටමත් නරක අතට හැරෙමින් පවතින තත්වයකට දායක වන සැලකිය යුතු සාධකයකි. මෙම නව දූෂණ බොහෝමයක් පාලනය කර නොමැති අතර ජල පෝෂක ප්‍රදේශය තුළ ජලයේ ගුණාත්මක ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන දැනුමක් නොමැති විට, මෙම ගැටලුව හේතුවෙන් අඛණ්ඩව විශාල ආර්ථික හා සමාජීය පිරිවැයක් දැරීමට සිදු වනු ඇතග. මෙම වටිනා සම්පත අහිමි වී මඟින් කොළඹ ප්‍රදේශයට ඇති වන බලපෑම විශාල විය හැකිය.



SLLDC ඇළ මාර්ග සම්බන්ධයෙන් අධිකරණ බලයක් ඇති අතර ඒවායේ සාමාන්‍ය නඩත්තු කටයුතු, මූලික වශයෙන් වැසි ජලය ගලා බැසීම සහ දූෂණයෙන් තොර ජල මාර්ග නඩත්තු කිරීම සඳහා වගකිව යුතු වේ. දූෂණය පැන නගින ඇළ මාර්ග ජල පෝෂක ප්‍රදේශයන්හි අධිකරණ බලය නියෝජිත ආයතන කිහිපයකට පැවරී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් SLLDC වෙත සෘජු පාලනයක් නොමැත. කොළඹ මහ නගර සීමාවේ ඇළ මාර්ග ජාලයේ ස්ථාන 24 ක පරාමිති ගණනාවක් සඳහා SLLDC විසින් 1995 සිට මාසික ජල තත්ත්ව පරීක්ෂණ පවත්වනු ලැබුවද, පරීක්ෂා කිරීම සඳහා ජලය ලබා ගන්නා ඇළ මාර්ග මෙන්ම ජල පෝෂක මට්ටමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගත් කළමනාකරණ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සඳහා දත්ත සැකසීම හෝ භාවිතා කිරීමක් සිදු නොවේ.



එබැවින්, වැඩිවන දූෂණය හා ඒ ආශ්‍රිත බලපෑම් අවම කිරීම සඳහා, කොළඹ මහ නගර සීමාව සඳහා දීර්ඝ කාලීන තිරසර ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ඒ අනුව, CWQM වැඩසටහන පියවර හයකින් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත, එනම්

(1) භවුල්කාරිත්වයන් ගොඩනැගීම,
(2) ගැටලු හඳුනාගැනීම සඳහා කොළඹ ජල පෝෂක ප්‍රදේශ විස්තර කිරීම,
(3) ඉලක්ක තබා ගැනීම සහ ගැටලු හඳුනා ගැනීම,
(4) ක්‍රියාවට නැංවීමේ වැඩසටහනක් සැලසුම් කිරීම,
(5) සැලැස්ම ක්‍රියාවට නැංවීම,
(6) ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ වෙනස්කම් සිදු කිරීම.



මෙම ගැටලුවේ සංකීර්ණතාවය සැලකිල්ලට ගනිමින් සමස්ත ජල පෝෂකයේ ජලයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සඳහා විස්තීර්ණ, දිගුකාලීන සැලැස්මක් තිබීම වැදගත්ය. පරිසර දූෂණ ප්‍රභවයන් ලක්ෂ්‍ය ප්‍රභවයන් සහ ලක්ෂ්‍ය නොවන ප්‍රභවයන් විය හැකි අතර දූෂණයට හේතු හා ඒ ආශ්‍රිත බලපෑම් අවම සිට දරුණු දක්වා මෙන්ම උග්‍ර සිට නිදන්ගත දක්වා වෙනස් විය හැකිය. එබැවින්, දූෂිත ජලාශවල ජලයේගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කිරීමට මෙන්ම අනෙකුත් ජලාශවල ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට තිරසර රාමුවක් සැපයීමට මෙම සැලැස්මට හැකි වනු ඇත.

ඇළ මාර්ග ජාලය ඔස්සේ සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් දූෂණ ප්‍රභවයන් හඳුනා ගැනීමට හැකි වී ඇති අතර ඇළ මාර්ගවලට ඇතුළු වන සෑම ජල මාර්ගයකම ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කර ඇත. එකතු කරන ලද දත්ත ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන සංවර්ධනය කිරීම සඳහා ඇගයීමට ලක් කරමින් පවතී.



අභ්‍යන්තර ජල ප්‍රවාහන ව්‍යාපෘතිය (IWT)

අභ්‍යන්තර ජල මාර්ග මගී ප්‍රවාහනය ක්‍රියාත්මක කිරීම සඳහා මහානගර ප්‍රවාහන ප්‍රධාන සැලැස්ම යටතේ ජල මාර්ග තුනක් හඳුනාගෙන ඇත.

- (IW1) ඇළ මාර්ගය ඔස්සේ වැල්ලවත්ත සිට බත්තරමුල්ල දක්වා

- (IW2) බේරේ වැව හරහා කොළඹ කොටුව සිට යූනියන් පෙදෙස දක්වා
- (IW3) කැළණි ගඟ ඔස්සේ මට්ටක්කුලිය සිට හංවැල්ල දක්වා

ප්‍රධාන සැලැස්ම මත පදනම්ව, පළමු ජල මාර්ග දෙක සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ උපරිම වාහන තදබදය පවතින අවස්ථාවල ප්‍රවාහන කොරිඩෝවල ඇති වාහන තදබදය අවම කිරීම සඳහා මගී ප්‍රවාහනය සඳහා අභ්‍යන්තර ජල මාර්ග භාවිතා කිරීම සහ ජලය පදනම් කරගත් විනෝදාස්වාද ක්‍රියාකාරකම් හරහා ස්වයං තිරසර ඇළ මාර්ග ජාලයක් සඳහා ආදායමක් උපයා ගැනීමයි.

බේරේ වැව හරහා කොළඹ කොටුව සිට යූනියන් පෙදෙස දක්වා

නියමු ව්‍යාපෘතිය බේරේ වැවෙන් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර, ඒ අනුව සුවපහසු, ගිලී යා නොහැකි, මගීන් 50 දෙනෙකුට ගමන් කළ හැකි, වායුසමනය කළ බෝට්ටු දෙකක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහයෝගය ඇතිව ඉදිකරන ලදී. බෝට්ටුව හැසිරවීම සහ ගලවා ගැනීමේ පහසුකම් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ඇතිව මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය නියමු ව්‍යාපෘතියක් ලෙස 2019 අගෝස්තු 22 වන දින ආරම්භ කරන ලදී. වාහන තදබදය උපරිම වේලාවන්හිදී, උදේ 7.30 සිට 9.30 දක්වා සහ සවස 3.30 සිට 6.30 දක්වා කොටුවේ සිට යූනියන් පෙදෙසට මගීන් ප්‍රවාහනය සඳහා බෝට්ටු මඟින් පහසුකම් සපයන අතර අමතර කාලයේදී විනෝදාත්මක කටයුතු සඳහා බෝට්ටු භාවිතා කර එමඟින් පද්ධතියට ආදායමක් ලබා ගනු ලැබේ.



- **ව්‍යාපෘතියේ නම:**
  අභ්‍යන්තර ජල ප්‍රවාහන ව්‍යාපෘතිය (IWT)
- **ව්‍යාපෘතියේ විෂය පථය:**
  රථ වාහන තදබදය අවම කිරීම සඳහා වෙනත් ප්‍රවාහන මාදිලි සම්බන්ධ කරමින් බේරේ වැව ඔස්සේ මගී යාත්‍රා ක්‍රියාත්මක කිරීම සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් තුළින් ආදායම් උත්පාදනය කරන අතරම ජලාශය ඥානාන්විතව භාවිතා කිරීම
- **ආරම්භ කළ දිනය:** 2019 අගෝස්තු 22
- **ව්‍යාපෘති ආදායම:** රු.මිලියන 100
- **2020 සහ ඉන් ඔබ්බට යෝජිත සැලසුම්:**

2020:
- IW හි මගී ප්‍රවාහනය හඳුන්වා දීම (වැල්ලවත්ත සිට බත්තරමුල්ල දක්වා)
- බේරේ වැව සඳහා තිරසර ජලය පදනම් කරගත් විනෝදාස්වාද ක්‍රියාකාරකම් සහ පරිසර-සංචාරක ව්‍යාපාරය හඳුන්වා දීම

2020 න් ඔබ්බට:
- බේරේ වැවෙහි ස්ථිර ජැටි ඉදිකිරීම
- බේරේ වැව සඳහා වතුර මල් සහ සෞන්දර්යාත්මකව ප්‍රසන්න අයිතම හඳුන්වාදීම
- ඊ-කාඩ් පද්ධති සහ සුහුරු මෙහෙයුම් පහසුකම් භාවිතා කිරීම

- අපේක්ෂාවන්, ප්‍රශ්න සහ ගැටලු:
- බේරේ වැවේ ජලයේ අයහපත් තත්ත්වය
- පහසුකම් සේවාවන් සඳහා ඉඩම් නොමැති වීම
- බේරේ වැවෙහි හිමිකාරිත්වය පිළිබඳ ගැටලු

තෙත් බිම් බලහත්කාරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීමේ ව්‍යාපෘතිය – අදියර I – ගොතටුව ප්‍රදේශය

කොලොන්නාව වගුරු බිමෙහි අත්පත් කරගත් ඉඩම් මායිම වටා ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීම

හැඳින්වීම

කොළඹ ජල පෝෂක ප්‍රදේශය තුළ ප්‍රධාන වගුරු බිම් හතරක අත්පත් කර ගත් ඉඩම්වල මායිම් නැවත විවෘත කිරීමේ ව්‍යාපෘතියෙන් පසුව, වගුරු බිම් පර්යන්තය අවට ජනතාව විසින් අනවසරයෙන් අත් පත් කර ගැනීම හේතුවෙන් අත්පත් කරගත් ඉඩම් ප්‍රමාණය ඉතා වේගයෙන් අහිමි වන බව හඳුනාගත හැකිය. මෙම ගැටලුවට විසඳුමක් ලෙස, ජලය රඳවා ගැනීමේ ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් මායිම ඔස්සේ ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීමට අපි තීරණය කළෙමු. මෙහි පළමු අදියර ලෙස අංක PP CO 7415 දරන මූලික සැලැස්මේ නිරූපණය කර ඇති කොලොන්නාව වගුරු බිම තෝරා ගන්නා ලදී.

පර්යන්තයේ මුළු දිග මීටර් 4000.

2019 වර්ෂයේ ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය 2019 අප්‍රේල් මාසයේ ආරම්භ කළ බැවින් පහත සඳහන් අයිතම වසර අවසානය වනවිට අවසන් කරන ලදී.

කාර්යයේ විෂය පථය	2019 නොවැම්බර් දක්වා ප්‍රගතිය	සිදු කර ඇති කාර්යයන් (රු.)
වගුර කැණීම සහ ඇම්පිබියස් යන්ත්‍රයක් මඟින් කැණීම කරන ලද ද්‍රව්‍ය භාවිතයෙන් ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීම	මායිම ගැටලු ඇති ස්ථාන කිහිපයක් හැර (මීටර් 1150) සම්පූර්ණ කරන ලදි	12,286,452.26
පිටතින් ගෙන එන සුන්බුන් භාවිතයෙන් ඇවිදීමේ මංතීරුව සකස් කිරීම	කාර්යයන් සිදු කරමින් පවතී (මීටර් 76 ක දිගක් සම්පූර්ණ කර ඇත)	
මායිම රේඛාව ඔස්සේ පෙර-සවි 450 x 450 mm U කාණු සකස් කිරීම	-	
මීටර් 100 ක පරතරයකින් දිය වලවල් ඉදිකිරීම සහ ජලය ඇළ මාර්ගයට බැහැර කිරීම සඳහා කුඹ සකස් කිරීම	-	
පෞද්ගලික ඉඩම් සහ රජයට පවරා ගත් ඉඩම් වෙන් කිරීම සඳහා කම්බි දැල් වැටක් සවි කිරීම	-	

බියගම, පට්ටිවිල වගුරු බිම් ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය සංවර්ධනය කිරීම

සේවාදායකයා : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ප්‍රධාන අරමුණ වන්නේ බියගම WTP හි ඵලදායී ජල පිරිපහදු කිරීමක් සහතික කිරීම සඳහා පට්ටිවිල තෙත්බිමෙහි ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමයි.

කැළණි ගඟ දකුණු ඉවුරේ ජල පවිත්‍රාගාරය (බියගම ජල පවිත්‍රාගාරය) යනු ගම්පහ දිස්ත්‍රික්කයට ආරක්ෂිත පානීය ජලය සැපයීමේ අරමුණින් සැලසුම් කරන ලද එවැනි එක් ජල පිරිපහදු යන්ත්‍රාගාරයකි.

බියගම ජල පවිත්‍රාගාරයට ජලය ලබා ගන්නා ස්ථානයට වඩාත් ඉහළින් පිහිටි පට්ටිවිල ඇළ මාර්ගයෙන් ගලා එන දූෂිත ජලය ප්‍රතිකාර සඳහා ජල භාවිතා කරනු ලබන ජලයේ ගුණාත්මකභාවය අයහපත් කරනු ලබන එවැනි එක් ප්‍රධාන ජල දූෂණ ප්‍රභවයක් වේ. දූෂිත ජලයට සමාජ, ආර්ථික හා ජීව විද්‍යාත්මක පරිසරයට විවිධ අහිතකර බලපෑම් ඇති කළ හැකිය. පට්ටිවිල ඇළ මාර්ගයෙහි අධික තෙල් දූෂණය වීම හා කාබනික දූෂණය වීම ජල පිරිපහදු ක්‍රියාවලිය අසාර්ථක වීමට හේතු විය හැකිය.

එබැවින්, පට්ටිවිල ඇළ මාර්ගයෙහි සහ යාබද තෙත් බිමෙහි ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිණිස වගුරු බිම්වල ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා පට්ටිවිල ඇළ මාර්ගයෙහි සහ යාබද වගුරු බිම්වල පවත්නා තත්ත්වය ඇගයීම සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් යෝජනා කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති ප්‍රදේශය



ක්‍රමවේදය



ජල අපවහන යෝජනාව



කොන්ත්‍රාත් මුදල: රු. 27,371,410.00
2019.12.31 දක්වා ප්‍රගතිය: රු. 6,087,477.00

ඇළ මාර්ග පුනරුත්ථාපන කාර්යයන්



පරිසරය වැඩි දියුණු කිරීමේ අධ්‍යයනය (ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීම)



පළාත් මට්ටමින් බලාත්මක කිරීමේ ඒකක ස්ථාපිත කිරීම

2006 අංක 35 දරන සංශෝධිත පනතේ දෙවන වගන්තිය යටතේ පළාත් මට්ටමින් පහත් බිම්, වගුරු බිම්, මඩ වගුරු, නිසරු වැනි ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමත් සමඟ නීති විරෝධී ඉඩම් පිරවීම, ඇළ මාර්ග හා අභ්‍යන්තර ජලාශ දූෂණය කිරීම සහ ප්‍රකාශිත ඇළ රක්ෂිත සහ ජල රැඳවුම් ප්‍රදේශ තුළ අනවසර ඉදිකිරීම්වලට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා SLLDC බලාත්මක වී ඇත.

SLLDC පනත යටතේ නීති විරෝධී ඉඩම් පිරවීම, ඇළ මාර්ග හා අභ්‍යන්තර ජලාශ දූෂණය කිරීම සහ ප්‍රකාශිත ඇළ මාර්ග රක්ෂිත සහ ජල රැඳවුම් ප්‍රදේශ තුළ අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට SLLDC වෙත බලය පවරන ලදී.

කළ යුතු කාර්යයන්වල විෂය පථය හා ධාරිතාවය සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර ඒ හේතුවෙන් සංස්ථාවේ ආයතනික ධාරිතාවය පුළුල් කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. අනවසර පිරවුම් ස්ථාන, ඉඩම් පිරවීමේ ස්ථාන පරීක්ෂා කිරීම සිදු කළ යුතුය

අනවසර පිරවුම් ස්ථාන, ඉඩම් පිරවීමේ ස්ථාන පරීක්ෂා කිරීම සිදු කළ යුතුය

දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා සහ පළාත් සභාවල රැස්වීම් සඳහා සංස්ථාව සහභාගි විය යුතුය.

මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාර්මාර්ග දෙපාර්තමේන්තුව ආදියෙහි පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල රැස්වීම්වලට සංස්ථාවට සහභාගි විය යුතුය

විශේෂ ව්‍යාපෘති අංශය

විශේෂ ව්‍යාපෘති අංශය විසින් වැඩි වශයෙන් ජලවිද්‍යාත්මක/ද්‍රාව විද්‍යාත්මක කාර්යයන් සඳහා ඇඳීම්, පිරිවැය ඇස්තමේන්තු, ලංසු ලියවිලි සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම කළමනාකරණය කිරීම/අධීක්ෂණය කිරීම වැනි ක්‍රියාකාරකම් භාරගනු ලැබේ. 2019 වර්ෂය තුළදී භාරගත් කාර්යයන් පහත පරිදි කාණ්ඩගත කළ හැක;

- විදේශ අරමුදල් ලැබූ ව්‍යාපෘති

1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකුව විසින් මූල්‍යාධාර ලබා දී ඇත)

- භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතිය සඳහා ජලාපවහන අධ්‍යයනය

විදේශ අරමුදල් ලැබූ ව්‍යාපෘති

1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ නගරය තුළ සහ අවට ගංවතුර ඇතිවීම වර්ෂ ගණනාවක සිදු සිදු වෙමින් පවතින අතර එමඟින් සැළකිය යුතු ආර්ථික පසුබෑමක් සහ මහජනතාවගෙන් විශාල කොටසක් සඳහා සමාජ දුෂ්කරතා ඇති කරයි.

කොළඹ ජල ද්‍රෝණියෙහි ගංවතුර පාලනය, යටිතලවසුහ සහ අපවහන කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම මෙන්ම යටිතලවසුහ නඩත්තු කිරීම සඳහා සහ සේවාවන් ලබාදීම සඳහා කොළඹ පුරවර ප්‍රදේශයේ මධ්‍යම රජයේ සහ පළාත් පාලන ආයතනවල හැකියාවන් ඉහළ නැංවීම MCUDP මඟින් අරමුණු කර ඇත.

MCUDP හි සංඝටක දෙකක් ඇත;

1 වැනි සංඝටකය: ගංවතුර සහ අපවහන කළමනාකරණය

2 වැනි සංඝටකය: තිරසර පුරවර සහ පළාත් යටිතලවසුහ සහ සේවාවන් සැපයීම සඳහා ආයතන ශක්තිමත් කිරීම සහ ක්‍රියාවට නැංවීමේ සහාය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) යටතේ ක්‍රියාවට නංවන ලද ප්‍රධාන සංඝටකය වන්නේ ගංවතුර සහ අපවහන කළමනාකරණයයි. කොළඹ පුරවර කලාපයේ අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා තීරණාත්මක යැයි හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ගංවතුර සහ අපවහන කළමනාකරණ යටිතලවසුහ පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මෙමඟින් සහාය ලබා දෙනු ඇත. පවතින අපවහන පද්ධතියේ පිටවාන ධාරිතාවය වැඩි දියුණු කිරීම, නව හැරවුම් ඇළ මාර්ග සහ වැසි ජල පොම්පාගාර හඳුන්වාදීම සඳහා මෙමඟින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලබන අතර ගංවතුර හා ජලාපවහන කළමනාකරණ සංරචකයේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ SLLDC වේ.

SLLDC විසින් MCUDP යටතේ සිදු කරන ලද උප ව්‍යාපෘතිවල ලැයිස්තුවක් පහත දක්වා ඇත.

අංකය	උප ව්‍යාපෘතිය
Completed	
1	දෙහිවල ඇළ මාර්ගය
2	ප්‍රධාන අපවාන සහ මෝදර උමඟ
3	ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය
4	තලංගම වැව හැරීම
5	වැල්ලවත්ත ඇළ මාර්ගය
6	MED - II සඳහා වැඩිදියුණු කිරීම්
7	MED - I සඳහා වැඩිදියුණු කිරීම්
8	ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය
9	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම – II යෝජනා ක්‍රමය
සිදු කරමින් පවතී	
10	MED - III සඳහා වැඩිදියුණු කිරීම්
11	ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම
12	නව මෝදර සහ ටොරින්ටන් උමං මාර්ගය
13	ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය ඉදිකිරීම
14	අඹතලේ පොම්පාගාරය
15	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම – III යෝජනා ක්‍රමය
16	තත්‍යකාල ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (RTC) සැපයීම සහ සවිකිරීම
17	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම – I යෝජනා ක්‍රමය
18	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම – යෝජනා ක්‍රමය IV
19	ජලයේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා දෝර ගේට්ටු සැලසුම් කිරීම සහ ස්ථාපිත කිරීම

සම්පූර්ණ කළ උප ව්‍යාපෘති (2019 වර්ෂයට පෙර)

1.1. දෙහිවල ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් සිදු කිරීම

ව්‍යාපෘති වටිනාකම : රු. 128,205,449.45
ආරම්භ කළ දිනය : 20.05.2013
සම්පූර්ණ කළ දිනය : 27.02.2015

- මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;
- ඇළ ඉවුරු ආරක්ෂණය
- නඩත්තු සහ මෙහෙයුම් මාර්ග සහ පැති කාණු පුනරුත්ථාපනය කිරීම
- ඇළ මාර්ග පත්ලෙන් මතුවී ඇති ගල් ආදිය ඉවත් කිරීම



1.2. අලුත් මාවත බෝක්කුව, මෝදර සතරැස් අපවාන, මෝදර උමං මාර්ගය, මතු බිල ඉදිකිරීම සම්පූර්ණ කිරීම, මෝදර මෝය අසල ඇළ ඉවුරු වැඩි දියුණු කිරීම සහ ප්‍රධාන ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්

ව්‍යාපෘති වටිනාකම : රු.342,438,294.31
ආරම්භ කළ දිනය : 27.11.2012
සම්පූර්ණ කළ දිනය : 31.10.2014

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- අලුත් මාවත බෝක්කුව නැවත ඉදිකිරීම
- උමං පිවිසුම පුනරුත්ථාපනය කිරීම
- මුහුදු බිහිදොර පුනරුත්ථාපනය කිරීම

- සතරැස් කාණු පිරිසිදු කිරීම
- ඇළ මාර්ගය හැරීම





1.3. ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්

ව්‍යාපෘති වටිනාකම : රු.194,965,674.59
ආරම්භ කළ දිනය : 27.10.2014
සම්පූර්ණ කළ දිනය : 20.06.2016

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- නඩත්තු සහ මෙහෙයුම් මාර්ග සහ පැති කාණු ඉදිකිරීම
- ඇළ මාර්ගය හැරීම



1.4. ගාලු පාර පාලම අසලදී වැල්ලවත්ත ඇළ මාර්ගයේ ජලය ගලා බැසීම වැඩි දියුණු කිරීම

ව්‍යාපෘති වටිනාකම : රු.111,570,072.22
ආරම්භ කළ දිනය : 21.07.2016
සම්පූර්ණ කළ දිනය : 27.11.2017

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- පෝරු ටැඹ සහ කුළු වැසීම
- පස් තට්ටුව ඉවත් කිරීම
- ඇළ මාර්ගය හැරීම



1.5. තලංගම වැව හැරීම

ව්‍යාපෘති වටිනාකම : රු.107,283,697.70
ආරම්භ කළ දිනය : 2016 සැප්තැම්බර්
සම්පූර්ණ කළ දිනය : 31.08.2017

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- වෙල් ආනා ගස් ඉවත් කිරීම
- වෙල් ආනා ගස්වල මුල් ඉවත් කිරීම
- ජලය යට හැරීම
- ඉවත් කළ සහ හාරන ලද ද්‍රව්‍ය බැහැර කිරීම



1.6. මාදිවෙල නැගෙනහිර හැරවුම සඳහා වැඩි දියුණු කිරීම අදියර II.

ව්‍යාපෘති වටිනාකම : රු. 106,798,220.87
ආරම්භ කළ දිනය : 16.12.2016
සම්පූර්ණ කළ දිනය : 04.12.2018

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ගේබියන් සහ රිනෝ මෙට්‍රස් යොදා ඇළ ඉවුරු ආරක්ෂා කිරීම
- නඩත්තු සහ මෙහෙයුම් මාර්ග සහ පැති කාණු ඉදිකිරීම
- පාර්ශ්වීය කාණු සඳහා දියඇලි ආකාරයේ ගලා බැසීමේ ව්‍යුහ ඉදිකිරීම
- ඇළ මාර්ගය හැරීම





2019 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද උප ව්‍යාපෘති

1.7. ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය සඳහා ඇළ ඉවුරු ආරක්ෂණ ඉදිකිරීම

ව්‍යාපෘති වටිනාකම : රු.322,500,102.88
ආරම්භ කළ දිනය : 22.05.2017
සම්පූර්ණ කළ දිනය : 29.01.2019

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ගේබියන් සහ පෝරු ටැඹ යොදා ඇළ ඉවුරු ආරක්ෂා කිරීම
- මෙහෙයුම් හා නඩත්තු මාර්ග, ඇවිදීමේ මංතීරු සහ පැනි කාණු ඉදිකිරීම
- ඇළ මාර්ගය හැරීම

1.8. මාදිවෙල නැගෙනහිර හැරවුම සඳහා වාඩි දියණු කිරීම : අදියර –I

ව්‍යාපෘති වටිනාකම : රු. 167,873,795.03
ආරම්භ කළ දිනය : 10.10.2016
සම්පූර්ණ කළ දිනය : 31.01.2019

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- නඩත්තු සහ මෙහෙයුම් මාර්ග සහ පැනි කාණු ඉදිකිරීම
- ගේට්ටු පද්ධතියක් සහිතව නව බෝක්කු පද්ධතියක් ඉදිකිරීම
- සපත්තු පාලම මුදුන් කිරීම
- නව ගලා බැසීමේ ව්‍යුහයක් ඉදිකිරීම
- අවහිරයක් ලෙස ක්‍රියා කරන පවතින ගලා බැසීමේ ව්‍යුහය ඉවත් කිරීම
- ඇළ මාර්ගය හැරීම

ව්‍යාපෘති ප්‍රදේශය



කාර්යයන් සිදු කරමින්



1.9. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම් යෝජනා ක්‍රමය – අදියර II

කොන්ත්‍රාත්කරු : Edward & Christie
කොන්ත්‍රාත් වටිනාකම : රු. 282,740,936.50
ආරම්භ කළ දිනය : 27.12.2017
සම්පූර්ණ කළ දිනය : 15.10.2019

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- මෙහෙයුම් හා නඩත්තු මාර්ග සහ පැනි කාණු සමඟ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- හරස් සතරැස් බෝක්කු සහ කුඹහ බෝක්කු ඉදිකිරීම
- ඇළ මාර්ගය හැරීම



සිදු කරමින් පවතින උප ව්‍යාපෘති

1.10. මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය සඳහා වැඩි දියුණු කිරීම : අදියර -III

කොන්ත්‍රාත්කරු : E & C කොමුති JV
කොන්ත්‍රාත් වටිනාකම : රු. 344,577,482.70
ආරම්භ කළ දිනය : 11.01.2017
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 අප්‍රේල්

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ප්‍රධාන ගංවතුර ගේට්ටු ව්‍යූහයේ පත් ගේට්ටු පුනරුත්ථාපනය කිරීම
- නව ගංවතුර ගේට්ටු ව්‍යූහය සහ ද්විතීයික ඇළ මාර්ගය සඳහා නව ගේට්ටු සවි කිරීම
- නඩත්තු හා මෙෙහයුම් මාර්ග සමඟ පැති කාණු සමඟ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- NWS&DB ට අයත් ජල නල මුදුන් කිරීම සහ නව නල මාර්ග උපස්ථම්භක ව්‍යූහයක් ඉදිකිරීම
- ජලය බැස යෑම සඳහා ප්‍රධාන බාධකයක් ලෙස ක්‍රියා කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගේට්ටු ව්‍යූහය ඉවත් කිරීම
- ලෝලෙවල් පාලමෙහි සඳහා අමතර ප්‍රවේශයක් විවෘත කිරීම

ව්‍යාපෘති ප්‍රදේශය





1.11. ශාන්ත සෙබස්තියන් උතුරු දියඟළු ගේට්ටු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු : වයිනා ජියෝ- ඉන්ජිනියරින් කෝපරේෂන්
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩො. 9,766,653.08 + ශ්‍රීලරු 473,212,403.68
ආරම්භ කළ දිනය : 01.06.2017
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය: 2020 මාර්තු
පොම්ප කිරීමේ ධාරිතාවය : 30 m3/s, ධාරිතාවය 6m3/s වන පොම්ප 5කින් සමන්විත වේ

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ගේට්ටු ව්‍යූහ ඉදිකිරීම සහ නව සිරස් ගේට්ටු සවි කිරීම
- ජලය බැස යෑම සඳහා ප්‍රධාන අවහිරතාවයක් වී ඇති පවතින ගේට්ටු ව්‍යූහය ඉවත් කිරීම
- නව පොම්පාගාරයක් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් අවශ්‍ය උපකරණ සමඟ පොම්ප සවි කිරීම
- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම





1.12. ටොරින්ටන් උමඟ සහ නව මෝදර උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු : වයිනා පෙට්‍රෝලියම් පයිප්ලයින් ඉන්ජිනියරින් කම්පන් ලිමිටඩ්
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩො. 32,098,189 + ශ්‍රීලරු 246,060,603.00
ආරම්භ කළ දිනය : 30.05.2018
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 අගෝස්තු
නව මෝදර උමඟ : පරිධිය 3 m, දිග 700 m සහ ධාරිතාවය 15 m3/s.
ටොරින්ටන් උමඟ : ප්‍රධාන උමඟෙහි පරිධිය 3 m කි (දිග 1100 m), ප්‍රධාන සහ ද්විතීයික උමං මාර්ගවලින් (පරිධිය 1.2 m – 2.0 m; දිග 2500 m) සමන්විත පද්ධතියක් පවතී. එහි ධාරිතාවය 32 m3/s

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ,

- ඇතුල්වන කාණුව ඉදිකිරීම
- ලැබීමේ පතුවළ ඉදිකිරීම
- පිටවන කාණුව ඉදිකිරීම
- උමං හැරීම
- මනුවළ ඉදිකිරීම





1.13. අඹතලේ පොම්පාගාරය සැලසුම් කිරීම ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු : සැල්කන් ඉංජිනියරින් බර්හැඩ්
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩො.මිලියන 5.85 + ශ්‍රීලරු.මිලියන1,181.53
ආරම්භ කළ දිනය : 03.09.2018
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 ජූලි
පොම්ප කිරීමේ ධාරිතාවය : 20 m3/s, ධාරිතාවය 4m3/s වන පොම්ප 5කින් සමන්විත වේ

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ගේට්ටු ව්‍යුහය සඳහා නව සිරස් ගේට්ටු සවි කිරීම
- නව පොම්පාගාරයන් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් විද්‍යුත්-යාන්ත්‍රික උපකරණ සහිත නව පොම්ප සවි කිරීම
- ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්

1.14. ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු : චයිනා ජියෝ-ඉන්ජිනියරින් කෝපරේෂන්
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩො. 5,934,884.90 + ශ්‍රීලරු 165,833,566.49
ආරම්භ කළ දිනය : 01.02.2019
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 සැප්තැම්බර්
පොම්පාගාර ධාරිතාවය : 10 m3/s, ධාරිතාවය 5m3/s වන පොම්ප 2කින් සමන්විත වේ

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ගේට්ටු පුනරුත්ථාපනය කිරීම
- නව පොම්පාගාරයක් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් අවශ්‍ය උපකරණ සමඟ පොම්ප සවි කිරීම
- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම

1.15. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම අදියර I

කොන්ත්‍රාත්කරු : E&C - RR JV
කොන්ත්‍රාත් වටිනාකම : රු.859,487,036.93
ආරම්භ කළ දිනය : 01.02.2019
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය: 2020 ජූලි

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ගොතටුව බැම්ම හරහා සහ කොලොන්නාව - ගොතටුව ප්‍රධාන මාර්ගයට යටින් මීටර් 15 පළල සතරැස් බෝක්කුවක් ඉදිකිරීම
- එක් ගේට්ටුවක් මීටර් 5.0 පළල x මීටර් 3.5 උස වූ සිරස් ගේට්ටු තුනක් ස්ථාපිත කිරීම
- නඩත්තු හා මෙහෙයුම් මාර්ග සහ පැති කාණු සමඟින් ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම

1.16. කොලොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය - අදියර III

කොන්ත්‍රාත්කරු : E & C – RR JV
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 1004
ආරම්භ කළ දිනය : 23.10.2018
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 පෙබරවාරි

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- නඩත්තු හා මෙහෙයුම් මාර්ග සහ පැති කාණු සමඟින් ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- හරස් සතරැස් බෝක්කු සහ කුඹහ බෝක්කු ඉදිකිරීම
- ඇළ මාර්ගය හැරීම

1.17. කොලොන්නාව ඇළ මාර්ගය හැරවුම් යොජනා ක්‍රමය IV

කොන්ත්‍රාත්කරු : E&C - RR JV
කොන්ත්‍රාත් වටිනාකම : රු.1,431,682,105.43
ආරම්භ කළ දිනය : 01.02.2019
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය : 2020 ඔක්තෝබර්

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- කළු පාලම අසල කිත්තම්පහුව ඇළ මාර්ගය හරහා ගේට්ටු ව්‍යුහ ඉදිකිරීම සහ එක් ගේට්ටුවක් මීටර් 6 පළල x මීටර් 4.5 උස සිරස් ගේට්ටු 3ක් ස්ථාපිත කිරීම
- කළු පාලම අසල සේදවත්ත-අඹතලේ මාර්ගය ඔස්සේ පවතින පාලම ඉවත් කර ඒ වෙනුවට මීටර් 18ක් පළල පාලමක් ස්ථාපිත කිරීම
- CPC ට අයත් ගේට්ටු ව්‍යුහය කඩා ඉවත් කර සපත්තු පලමක් ඉදිකිරීම
- CPC පරිශ්‍රය අසල ඇළ මාර්ග පත්ල පෝරුව
- නඩත්තු හා මෙහෙයුම් මාර්ග සහ පැති කාණු සමඟින් ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම

1.18. දෝර ගේට්ටු ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු : DGES-RR-INDOEAST JV
කොන්ත්‍රාත් වටිනාකම : ශ්‍රීලරු 609,618,238.99
ආරම්භ කළ දිනය : 01.03.2019
සම්පූර්ණ කිරීමට අපේක්ෂික : 2020 මැයි

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ;

- ප්‍රධාන ඇළ පද්ධති හරහා පහත ස්ථානවලදී ගේට්ටු ව්‍යුහ තුනක් ඉදිකිරීම;
  - යක්බැද්ද පාලම (කොලොන්නාව ඇළ මාර්ගය)
  - ශ්‍රී ජයවර්ධනපුර මාවත පාලම (හීන්-ඇළ ඇළ මාර්ගය)
  - වරාය පිවිසුම් මාර්ග බෝක්කුව (ප්‍රධාන කාණුව)
- එක් එක් ස්ථානයේ සිරස් ගේට්ටු ස්ථාපිත කිරීම
- ගේට්ටු ව්‍යුහයන්ට යාබදව ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්



1.19. කත්‍ය කාල පාලන පද්ධතිය (RTC)

ඉංජිනේරු ඇස්තමේන්තුව	:	රු. මිලියන 414
ආරම්භ කළ දිනය	:	2017 ජූලි
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය	:	2020 සැප්තැම්බර්

අරමුණු

1. ඒකාබද්ධ ගංවතුර පාලන හා ජල කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම
2. කොළඹ පුරවර ප්‍රදේශයට පූර්ව අනතුරු ඇඟවීමේ සහාය ලබා දීම
3. ගබඩා කළ හැකි ධාරිතාවයද සැළකිල්ලට ගනිමින් පොම්ප සහ ගබඩා පහසුකම් වැනි සඳහා ප්‍රශස්ත මෙහෙයුම් නීති රීති සකස් කිරීම සහ ප්‍රසන්න නාගරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජලය භාවිතා කිරීම
4. නාගරික සංවර්ධනයෙන් මෙන්ම දේශගුණික විපර්යාසයන්ගෙන් මහානගරය වෙත වර්තමාන හා විකාශනය වන අනාගත ජල සම්බන්ධ අවදානම් තක්සේරු කිරීම

විෂය පථය සහ ක්‍රියාකාරකම්

1. වන්දිකා වර්ෂාපතන නිරීක්ෂණ, සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි සහ වැසි මිනුම්වලින් කරනු ලබන නිරීක්ෂණ වැනි පවත්නා ප්‍රභවයන් භාවිතා කරමින් වර්ෂාපතන දත්ත ඒකාබද්ධ කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම.
2. කොළඹ පුරවර ප්‍රදේශය සඳහා වර්ෂාපතන නිරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම.
3. ඇළ මාර්ග/ගංගා/පොකුණුවල ජල මට්ටම් අධීක්ෂණ මිනුම් සකස් කිරීම සහ ඇළ මාර්ග ගැලීම මැනීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.
4. අධීක්ෂණ උපකරණවල සිට ගංවතුර පාලන හා ජල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සන්නිවේදන සම්බන්ධතා ඇති කිරීම.
5. වර්ෂාපතනය ඒකාබද්ධ කිරීම, ජල විද්‍යාත්මක පුරෝකථන ආකෘතිය, ජලයෙන් යටවීම පුරෝකථනය සඳහා ජල ගතික ආකෘතිය ඇතුළත් ගංවතුර පුරෝකථන පද්ධතියක් සංවර්ධනය කිරීම.
6. ගේට්ටු සහ පොම්පවල හොඳම ක්‍රියාකාරිත්වය ගණනය කිරීම සඳහා සියලු ආදාන භාවිතා කරමින් තීරණ ගැනීමේ සහාය පද්ධතියක් සංවර්ධනය කිරීම සහ තත්‍ය කාලීන මෙහෙයුම් සඳහා SCADA පාලන පද්ධතියක් සැකසීම.
7. දත්ත ඒකාබද්ධ කිරීම, තොරතුරු බෙදා හැරීම සහ කොළඹ පුරවර ප්‍රදේශය සඳහා ජල කළමනාකරණ සේවා සැපයීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
8. නාගරීකරණය සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන අවදානම් තක්සේරු කිරීම සහ පිළියම් යෝජනා කිරීම සඳහා අඛණ්ඩ පර්යේෂණ හා සංවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.

භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතිය

අන්තර්-ද්‍රෝණි හැරවුමක් පාදක කර ගනිමින් මාදිවෙල දකුණ හැරවුම් විකල්පය මීට පෙර තීරණය කර තිබිණි. කෙසේවෙතත්, එම හැරවුමෙහි පහත සඳහන් දෝෂ කිහිපයක් පවතී.

a) පන්නිපිටියේ ද්‍රෝණි මුදුන හරහා හැරවීමේ යෝග්‍ය ඉදිකිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව පවතින දුෂ්කරතාවය සහ ඉහළ ඉදිකිරීම් පිරිවැය
b) වේරස් ගඟ ද්‍රෝණියේ කළු ඇළට ඇති වියහැකි ජලවිද්‍යාත්මක බලපෑම්
c) අහිතකර සමාජීය සහ පාරිසරික ගැටලු.

ඉහත බාධාවන් හේතුවෙන්, විකල්පයන් දෙක සඳහා විකල්ප අධ්‍යයනයක් සිදු කර ඒ අනුව තීරකයන් සමඟ සහයෝගිත්වයෙන් සුදුසු විසඳුමක් පිළිබඳව අවසන් තීරණයක් ගැනීම සඳහා සඳහා ගබඩා කිරීමේ පොකුණු පද්ධතියක විකල්ප විසඳුමක් ඉදිරිපත් කර ඇත. එබැවින්, මෙම විකල්ප අධ්‍යයනය සඳහා ජල විද්‍යාත්මක ආදර්ශ අධ්‍යයනයක් පවත්වන ලදී. ප්‍රධාන වශයෙන් ගබඩා කිරීමේ පොකුණු පද්ධතිය ඉලක්ක කර ගනිමින් ගංවතුර ආදර්ශන කාර්යයන් සිදු කරන ලද අතර විකල්පයන් දෙක සඳහා ආර්ථික ඝඩා බැලීම සිදු කරන ලදී.

මැනුම් කාර්යයන්වලට අමතරව 2018 වර්ෂයේදී මූලික සැලසුම් කිහිපයක්ද සිදු කරන ලදී.



ඉදිකිරීම් අංශය

භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

1. කඩවත "සුවත උයන" නඩත්තු කාර්යයන්

ඉහත ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂය සඳහා වෙන් කර තිබූ මුළු මුදල රු.මිලියන 20 ක් වූ අතර නඩත්තු කටයුතු වසර පුරා සිදු කෙරිණි.

ඇළ මතුපිට පිරිසිදු කිරීම, ඇළ ඉවුරු පිරිසිදු කිරීම, ඇළ මාර්ග පරීක්ෂා කිරීම, තණකොළ කැපීම, අභ්‍යන්තර මාර්ග නඩත්තු කිරීම සහ පැටවීම, ප්‍රවාහනය සහ පැනිරීම ඇතුළුව තාවකාලික පස් ප්‍රවාහනය මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 22.55 වූ අතර 2019 වර්ෂ අවසානය දක්වා සිදු කරන ලද සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 22.55 කි.



2. රාගම බැසිලිකා වැවෙහි යෝජිත පුනරුත්ථාපනය

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 28.95 කි. මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මාසයේදී ආරම්භ වූ අතර 2020 ජනවාරි මස අවසන් වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය.

අඩි පාලම ඉදිකිරීම, දියවළවල් 11 ක් සහ මීටර් 272 ක් දිග රැඳවුම් බිත්ති ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 15.82 ක් වූ අතර 2019 අවසන් වනවිට සිදු කරන ලද වැඩවල සමුච්චිත වටිනාකම රු. මිලියන 15.82 ක් විය.



සේවාදායක ව්‍යාපෘති

සේවාදායකයා – මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

1. හොරණ බස් නැවතුම්පොළ සැලසුම් කිරීම සහ ඉදිකිරීම – අදියර III, IV සහ V

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිතපුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 139.45 ක් වන අතර, එයට බස් නැවතුම්පොළේ නිම කිරීමේ කටයුතු, යකඩ ආශ්‍රිත කාර්යයන්, විදුලි කාර්යයන්, වහළ සකස් කිරීමේ කාර්යයන් සහ වැසිකිලි ඉදිකිරීමේ කාර්යයන්, අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සහ බස් නැවතුම්පොළ පරිශ්‍රයේ ජොගුසුවා මල පිරිපහදු යන්ත්‍රාගාරයක් ඉදිකිරීම ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2018 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 අගෝස්තු වනවිට අවසන් කරන ලදී. 2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 41.84 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මිලියන.131.40 කි.



2. පාදුක්ක ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම – පියවර II

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය VAT බදු හැර රු. මිලියන 41.57 ක් වන අතර එයට ක්‍රීඩා පිටිය වැඩි දියුණු කිරීම, රථගාල්, මංතීරු, භූමි අලංකරණ කටයුතු, ජාල මනුකරණ පද්ධති සහ ඇඳුම් මාරු කිරීමේ කාමර ඉදිකිරීම ඇතුළත් වේ.

ව්‍යාපෘතිය 2018 ජූනි මාසයේදී ආරම්භ වූ අතර 2019 මැයි මස අවසන් වන විට නිම කරන ලදී.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 37.64 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු. මිලියන 38.18කි.



3. කළුතර දුම්රිය ස්ථානය සහ බස් නැවතුම්පොළ අතර වාණිජ සංවර්ධන ඉදිකිරීම – අදියර III

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 17.18 ක් වන අතර, එයට ව්‍යුහමය සහ නිම කිරීමේ කාර්යයන් ඇතුළුව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් මස ආරම්භ වූ අතර එය 2019 ජූනි මාසය වන විට නිම කරන ලදී. 2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන1.40 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු. මිලියන 17.60 කි.



4. කිරිමණ්ඩල මාවතේ තක්ෂා කාල ගංවතුර පාලන සහ ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ප්‍රතිශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 752.00 කි. මෙම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර එය 2020 මැයි මස වනවිට නිම කිරීමට නියමිතය.

HVAC පද්ධතිය, ගිනි නිවීමේ හා ආරක්ෂණ පද්ධතිය හා මගී විදුලි ඝෝපාන 02 ක් ආදිය සමඟ මහල් පහක (වර්ග මීටර් 3250) ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 181.66 ක් වූ අතර සිදු කරන ලද වැඩවල සමුච්චිත වටිනාකම රු. මිලියන 223.50 කි.



සේවාදායකයා – නාගරික සංවර්ධන අධිකාරිය

5. හෝමාගම යෝජිත ඉඩම් සංවර්ධන කාර්යයන්

නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. අවිනිශ්චිතතා සහ වැටි බදු හැරුණු විට ව්‍යාපෘති අවධියේ මුළු පිරිවැය රු.මිලියන 90.79 කි. ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු (අක්කර 1.5), මීටර් 75 ක් දිග ගේබියන් කාර්යයන්, මීටර් 62 ක් දිග ඇළ මාර්ග ඉදිකිරීම සහ මීටර 75 ක් දිග කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ.

මෙම ව්‍යාපෘතිය 2018 නොවැම්බර් මස ආරම්භ වූ අතර එය 2020 ජනවාරි වන විට අවසන් කිරීමට නියමිතය.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 65.50 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මිලියන 65.50 කි.



6. බෙරේ වැව රේඛීය උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 24.87 ක් වන අතර එයට අත් වැට, කොන්ක්‍රීට් කාණු, විදුලි වැඩ, දියවළ සහ සොරොව්ව ඉදිකිරීම සහ නැගෙනහිර බෙරේ වැවෙහි බස්නාහිර ඉවුර ඔස්සේ ඇළ මාර්ග ආරක්ෂක තාප්පයක් (දළ වශයෙන් මීටර් 86) ඉදිකිරීම අයත් වේ.

මෙම ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2020 ජනවාරි මස අවසන් වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 10.55 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මිලියන 10.55 කි.



7. පැලියගොඩ යෝජිත නිවාස ඒකක 600 සඳහා ගේබියන් බැම් ඉදිකිරීම සහ ඉඩම පිරවීම

නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. අවිනිශ්චිතතා සහ වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 217.34 කි. ඉඩම් පිරවීම (අක්කර 2) ගේබියන් බැම් (මීටර් 600), ඇළ මාර්ග වැඩි දියුණු කිරීමේ කාර්යයන් සහ බෝක්කුවක් ඉදිකිරීම මේ සඳහා ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2019 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද 2020 මැයි මාසය වනවිට අවසන් කිරීමට නියමිතය.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම මිලියන 8.21 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මිලියන 8.21 කි.



සේවාදායකයා – පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
‘පිබිදෙමු පොලොන්නරුව ”දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන

8. මැදිරිගිරිය දිස්ත්‍රික රෝහලේ වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිලධාරි නිල නිවාස– අදියර I සහ II

වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 260.67 කි. මෙම ව්‍යාපෘතිය 2016 අගෝස්තු මස ආරම්භ වූ අතර 2019 ඔක්තෝබර් වනවිට අවසන් විය.

සියලුම සිවිල්, යාන්ත්‍රික, විදුලි කාර්යය සහ මගී විදුලි සෝපාන 02 ක් සමඟ මහල් හතරකින් යුත් (වර්ග මීටර් 3250) ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 15.50 ක් වන අතර 2019 වර්ෂය දක්වා සිදු සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මිලියන 218.67 ක් විය.



9. වැලිකන්ද ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත බාහිර රෝගී අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල

වැටි බදු හැර ව්‍යාපෘතියේ මූළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 185.45 ක් විය. මෙම ව්‍යාපෘතිය 2016 අගෝස්තු මස ආරම්භ වූ අතර 2019 අප්‍රේල් වනවිට අවසන් විය.

සියලුම සිවිල්, යාන්ත්‍රික, විදුලි කාර්යයන් සහ වායු සම්කරණ කාර්යයන් ඇතුළුව මහල් දෙකකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් විය.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 9.78 ක් වූ අතර 2019 වර්ෂය දක්වා සිදු කරන ලද වැඩවල සමුච්චිත වටිනාකම රු.මිලියන 169.78 ක් විය.



ස්වයං ව්‍යාපෘති

1. අනුරාධපුර යෝජිත නිවාඩු නිකේතනය සහ සේවා ගොඩනැගිල්ල

නිවාඩු නිකේතනය සහ සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් සමන්විත මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය (වැටි බදු හැර) රු. මිලියන 108.90 කි.

මෙම ව්‍යාපෘතිය 2017 ජූලි මාසයේදී ආරම්භ කර 2019 මැයි මාසය වනවිට අවසන් කර ඇති අතර සේවා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු මස අවසන් වනවිට අවසන් කර ඇත.

2019 වර්ෂය තුළ සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම රු. මිලියන 4.30 ක් වූ අතර 2019 වර්ෂය අවසානය වනවිට සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 30.53 ක් විය.

2019 වර්ෂය අවසානයේදී නිවාඩු නිකේතනය සඳහා සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 48.25 ක් විය.



2. යෝජිත SLLDC වැඩපොළ මුතුරාජවෙල ප්‍රදේශයට රැගෙන යෑම හා සම්බන්ධ ඉදිකිරීම්

වැටී බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 239.67 ක් විය. මෙම ව්‍යාපෘතිය 2017 ජූලි මාසයේදී ආරම්භ වූ අතර 2020 ඔක්තෝබර් මස අවසානයෙදී සම්පූර්ණ කිරීමට නියමිතය.

සියලු සිවිල්, යාන්ත්‍රික හා විදුලි කාර්යයන් සමඟ දෙමහල් ගොඩනැගිලි (A, B සහ K කාණ්ඩ) ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 72.50 ක් වන අතර 2019 අවසන් වනවිට සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මිලියන 144.83 ක් විය.



3. කිරිමණ්ඩල මාවත යෝජිත ක්‍රීඩා සංකීර්ණය

10% අවිනිශ්චිතතාවයන් සහ වැටී බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 70.39 විය. මෙම ව්‍යාපෘතිය 2018 ජූනි මාසයේදී ආරම්භ වූ අතර 2020 ජූලි මස අවසන් වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය.

වානේ ව්‍යුහයක් සහිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 7.13 ක් වූ අතර 2019 අවසන් වන සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු. මිලියන 19.80 කි.



4. මුතුරාජවෙල යෝජිත කසළ අංගනය ඉදිකිරීම – අදියර I

වැටී බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 385.01 ක් විය. මෙම ව්‍යාපෘතිය 2017 ජූනි මාසයේදී ආරම්භ වූ අතර 2020 දෙසැම්බර් මස අවසන් වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය.

පෙරැදි කුළුණු ඉදිකිරීම සහ වානේ ව්‍යුහය, ලීචේට් ගබඩා ටැංකිය, නිෂ්පාදන කම්හල, රොක් වැටිය ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 112.71 ක් වූ අතර 2019 අවසන් වන විට සිදු කරන ලද සමුච්චිත කාර්යයන්හි වටිනාකම රු.මිලියන 250.44 ක් විය



5. රාගම ඉඩම් සංවර්ධන කාර්යයන්

මෙම ව්‍යාපෘතිය රාගම ඉඩම් සංවර්ධන කාර්යයන්වලින් සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය 2019 ජනවාරි මාසයේදී ආරම්භ වූ අතර 2020 දෙසැම්බර් මස අවසන් වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 23.89 ක් වන අතර 2019 අවසන් වන විට සිදු කරන ලද සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 23.89 ක් විය.



6. **රාජගිරිය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කාර්යයන්**

ඉඩම් හා සැපයුම් අංශය, මාධ්‍ය ඒකකය, තේ පැන්ට්‍රි කාමරය, සභාපතිවරයාගේ කාර්යාලය, සණසු ඒකකය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු 2019 දී අවසන් කර ඇත.

2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 7.29 ක් වූ අතර 2019 අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු. මිලියන 108.91 ක් විය.



7. **කෙරවළපිටිය වැලි සේදීමේ සහ හැලීමේ කම්හලක් ඉදිකිරීම**

ව්‍යාපෘතියේ ඇස්තෙම්න්තුගත පිරිවැය වැට් බදු හැර රු.මිලියන 184.56 කි.

වැලි සේදීමේ හා හැලීමේ කම්හල, පොකුණ, ට්‍රාන්ස්ෆෝමර් කාමරය සහ MDB කාමරය, මුහුදු වැලි ඇසුරුම් කම්හල සහ වැසිකිළි, අඳුම් මාරු කිරීමේ කාමරය, කාර්යාල කාමරය, රසායනාගාරය, RO කම්හල ඉදිකිරීම සහ වෙන් කිරීමේ කාර්යයන් මෙම ව්‍යාපෘතියට අයත් වේ.

මෙම ව්‍යාපෘතිය 2018 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 නොවැම්බර් මස අවසානය වනවිට අවසන් කරන ලදී. 2019 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන් වල වටිනාකම රු.මිලියන139.46 ක් වූ අතර 2019 අවසන් වන විට සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 178.57 ක් විය.





ඉඩම් සහ අළෙවිකරණ අංශය

ඉඩම් හා අළෙවිකරණ අංශය මෙම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරී අංශවලින් එකක් වන අතර පහත සඳහන් කාර්යයන් තුළින් සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වේ.

1. ජල රැඳවුම් කාර්යයන් සඳහා සහ සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

සංරක්ෂණ කලාපයේ ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම සහ ප්‍රදේශය අවට ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ තෙත්බිම් සංරක්ෂණය සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීම මෑතකදී ආරම්භ කරන ලදී.

මීට අමතරව, අදාළ ප්‍රදේශවල අනාගත සංවර්ධනයට පහසුකම් සැලසීමේ අරමුණින් සංචාරක බංගලා සහ ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම සඳහා අනුරාධපුර, ත්‍රිකුණාමලය සහ අම්පාර සහ මඩකලපුව යන ප්‍රදේශවල ඉඩම් කැබලි කිහිපයක් පවරා දීමට ඉඩම් හා අළෙවිකරණ අංශය කටයුතු කරමින් සිටී.

අදාළ ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සහ ජලාපවහන වැඩි දියුණු කිරීම පිණිස පහසුකම් සැලසීම සඳහා ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා රාගම, කොලොන්නාව සහ ඔලියමුල්ල යන ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව මූලික පියවර ගෙන තිබේ.

2. ඉඩම් අන්සතු කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුව ඉඩම් බැහැර කිරීම

කොළඹ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානයට ආසන්නව පිහිටා තිබීම හේතුවෙන්, මුතුරාජවෙල ප්‍රදේශය බස්නාහිර කලාපයේ ලොජිස්ටික් කලාපයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ. තවද කෙරවලපිටිය පිටත වටරවුම් අධිවේගි මාර්ග ව්‍යාපෘතියේ සංවර්ධනයත් සමඟ ලොජිස්ටික් හා සම්බන්ධ ව්‍යාපෘති සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම්වල ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, ලොජිස්ටික් නගර සංකල්පයට අනුකූලව සංස්ථාව මුතුරාජවෙල ප්‍රදේශයේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත.

ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තරහකාරී මිලක් ලබා ගැනීමෙන් පසු බහුකාර්ය ඒකාබද්ධ ලොජිස්ටික් ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම සඳහා අක්කර 34 ක පමණ භූමි ප්‍රමාණයක් හේමාස් ලොජිස්ටික්ස් (පෞද්.) සමාගම, පිරමිඩ් ලංකා (පෞද්) සමාගම, ඊස්ට් වෙස්ට් ක්ලියරින් ඇන්ඩ් ෆෝවර්ඩින් ලිමිටඩ්, ඩාර්ට් ග්ලෝබල් ලොජිස්ටික්ස් (පෞද්.) සමාගම සහ ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් (පෞද්.) සමාගමට වෙන් කර ඇත.

පසුගිය වර්ෂ කිහිපය තුළ මුතුරාජවෙල කාර්මික කලාපයේ ඉඩම් බොහොමයක් කර්මාන්ත කිහිපයක් සහ ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා බැහැර කර ඇත. ඛනිජ තෙල් ටැංකි අංගනය, ලිට්‍රෝ ගෑස්, ලංවිම බලාගාරය කලාපය තුළ පිහිටා ඇති වැදගත් ව්‍යාපෘති සමහරකි

කොළඹ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුව විසඳීම සඳහා සංස්ථාව විසින් මුතුරාජවෙල අක්කර 10 ක ඉඩමක්, වෙස්ටර්න් පවර් කම්පැනි (පෞද්.) සමාගමට වෙන් කර දී ඇත. මෙම අපද්‍රව්‍ය බලශක්ති ව්‍යාපෘතිය මඟින් ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 10-20ක් උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉඩම් හා අළෙවිකරණ අංශය දිගු කාලීන කල්බදු, කෙටිකාලීන කල්බදු, ඍජු විකුණුම් සහ තනි නිවාස සඳහා විකුණුම් මඟින් ඉඩම් බැහැර කිරීමේ නිරත වේ. ඉඩම් හා අළෙවිකරණ අංශය 2019 වර්ෂය තුළ විකුණුම්/කල්බදු වලින් දළ වශයෙන් රු.මිලියන 718ක මුදල් ප්‍රවාහයක් අත්කර ගෙන ඇත. 2020 වර්ෂය සඳහා විකුණුම් සහ කල්බදුවලින් ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 1168 කි.



3. තෙත් බිම් සහ ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම

මෑත අතීතයේ සංවර්ධනයේ නව මානයන් සමඟ සංස්ථාවේ විෂය පථය වඩාත් සංවර්ධන අරමුණු හා පරිසර සංරක්ෂණය උදෙසා වෙනස් කර ඇත. ගංවතුර පාලනය, තෙත් බිම් සංරක්ෂණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමෙන් ඇළ ඉවුර අලංකාර කිරීම සහ ඇළ ඉවුර ඔස්සේ ඇවිදීමේ මංතීරු ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වෙමින් පවතී.

ඉහත කාර්යයන් සඳහා සහාය වීම සඳහා ඉඩම් හා අළෙවිකරණ අංශය දිවයිනේ තෙත්බිම් අදියර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ නිරත වේ. සංස්ථාවේ අනෙකුත් අදාළ අංශ සමඟ සහයෝගිත්වයෙන් ඇළ මාර්ග සඳහා රක්ෂිත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරමින් පවතී.

ප්‍රකාශයට පත් කිරීමේ කාර්යයන් යටතේ බස්නාහිර, දකුණ සහ ඌව, මධ්‍යම සහ සබරගමුව සහ උතුරු මැද පළාත්වල තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම මේ වනවිට සම්පූර්ණ කර ඇත. නැගෙනහිර, උතුර, සහ වයඹ පළාත් වල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

බස්නාහිර පළාතේ ඇළ මාර්ග රක්ෂිත මේ වනවිටත් ප්‍රකාශයට පත් කර ඇති අතර දකුණු පළාතේ ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම සිදු කරමින් පවතී.

4. මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (GCFC&EIP) සඳහා අත් පත් කරගත් ජල රැඳවුම් ඉඩම් කළමනාකරණය කිරීම

සංස්ථාව ජලය රඳවා ගැනීමේ අරමුණු සඳහා GCFC&EI ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වගුරු බිම් නඩත්තු කිරීමද සිදු කරයි. වර්තමානයේ මෙම ඉඩම්, ඉඩම් හා අළෙවිකරණ අංශය විසින් සංස්ථාවේ නීති අංශයේ සහ ආරක්ෂක ඒකකයේ සහාය ඇතිව කළමනාකරණය කරනු ලැබේ.

5. අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කරවීම සහ ඔප්පු ලබා දීම

සංස්ථාව විසින් අත්පත් කර ගත් වගුරු බිම්වල අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානයක පදිංචි කිරීමට ඉඩම් හා අළෙවිකරණ අංශය කටයුතු යොදා ඇත. එවැනි ව්‍යාපෘති මුතුරාජවෙල, වෙදමුල්ල, පොකුණ පාර, දෙහිවල ප්‍රදේශවල පිහිටා ඇත. එවැනි පවුල්වලට මාරුවීම් ඔප්පු නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන අංශය

1. ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි හැරීම

කොන්ක්‍රීට් නිෂ්පාදනයේ අත්‍යවශ්‍යම අංග වන බැවින් සිමෙන්ති, වැලි සහ සමස්තයෙහි සැපයුම කෙරෙහි ප්‍රධාන අවධානයක් යොමු වන අතර ඉදිකිරීම් කර්මාන්තයේ ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම් කර්මාන්තය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෑත අතීතයේ ඉදිකිරීම් කර්මාන්තයේ විශාල වැඩිවීමත් සමඟ වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස වැඩි වී ඇති අතර වැලි සැපයුම අඛණ්ඩව සහතික කිරීම ප්‍රධාන ගැටලුවක් වී තිබේ. වැලි සැපයුමේ ප්‍රධාන ප්‍රභවය ගංගා වැලි කැණීම හරහා වුවද, ගංගා වැලි අධික ලෙස නිස්සාරණය කිරීමෙන් ඇති වන අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් රජය නීති රීති පනවා ඇත.



මෙම දීර්ඝකාලීන සැලකිය යුතු පාරිසරික බලපෑම් සැලකිල්ලට ගනිමින් රජය ගංගා වැලි කැණීම් සඳහා දැඩි සීමා පැනවුවා පමණක් නොව ඒ සඳහා විකල්ප විසඳුමක් සෙවීමද ආරම්භ කළේය. තවද හිහකම හේතුවෙන් ගංගා වැලි මිල ඉහළ ගොස් ඇති අතර යොදා ගත හැකි අඩු වියදම් විකල්පයක් සොයා ගැනීම විශාල අවශ්‍යතාවයක් විය.

අක්-වෙරළ වැලි යනු ගංගා වැලි සඳහා හොඳම ආදේශකයක් වන අතර එය අවශ්‍ය ප්‍රමාණයක් ඉතා සාධාරණ මිලකට ලබා ගත හැකි අතර වඩාත් පරිසර හිතකාමී ආකාරයෙන් ලබා ගත හැකිය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) 1993 වර්ෂයේ සිට අක්-වෙරළ වැලි කැණීම් හා පොම්ප කිරීමේ කටයුතුවල නිරතව සිටී. ආරම්භයේදී ගොඩකිරීම් කටයුතු සඳහා අක්-වෙරළ වැලි පොම්ප කරන ලද අතර වැලි සඳහා ඇති ඉල්ලුමේ පරතරය පියවා ගැනීම සඳහා SLLDC පමණක් 2013 වර්ෂයේ සිට ඉදිකිරීම් කර්මාන්තයට මුහුදු වැලි සපයා ඇත.

වර්ෂය	කොන්ත්‍රාත්කරු	පොම්ප කරන ලද ප්‍රමාණය
1994/1995	බොස්කලිස් ඉන්ටර්නැෂනල්, නෙදර්ලන්තය	ස.මී.මිලියන 5
2005/2007	රෝඩ නිල්සන් ඒඑස්/, ඩෙන්මාර්කය	ස.මී.මිලියන 3
2011/2013	ඩ්‍රෙජින් ඉන්ටර්නැෂනල්, බෙල්ජියම	ස.මී.මිලියන 3.8

SLLDC සතුව කෙරවලපිටිය ප්‍රදේශයේ වෙන් කරන ලද වැලි ලබා ගැනීමේ ඉඩමක් ඇත. වෙරළේ සිට ආසන්න වශයෙන් කි.මී. 15ක් ඔබ්බෙන් පිහිටි වැලි ලබා ගැනීමේ ඉඩමෙන් හාරනු ලබන වැලි කෙරවලපිටිය පිහිටි විශේෂිත සංචිතයට පොම්ප කරනු ලැබේ. මේ වනවිටත් ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි ඝන මීටර් මිලියන 2.5 කට වැඩි ප්‍රමාණයක් සැපයීමේ හැරීමේ සහ කැණීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

- ව්‍යාපෘතියේ විෂයපථය
- ඉඩම් ගොඩකිරීම සඳහා අක්-වෙරළ වැලි හැරීම සහ පොම්ප කිරීම – ඝන මීටර් මිලියන 1.5
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීමට මුහුදු අක්-වෙරළ වැලි හැරීම සහ පොම්ප කිරීම – ඝන මීටර් මිලියන 2.5
- කොන්ත්‍රාත් වටිනාකම - ඇ.ඩො. මිලියන 19.975
- කොන්ත්‍රාත්කරු – රෝඩ නිල්සන් ඒ/එස්, (පෞද්.) සමාගම
- ප්‍රගතිය
  - 2019.12.31 දිනට ස.මී. 2,899,334 හාරා ඇත

කෙරවලපිටියෙන් ලබාගත් අක්-වෙරළ වැලි, කෙරවලපිටියේ පිහිටි සේදීමේ හා හැළීමේ කම්හලේ සෝදා හළනු ලැබේ. වර්තමානයේ සේදීමේ හා හැළීමේ යන්ත්‍රාගාරය දිනකට කියුබ 750 කට වඩා සපයයි. මෙම අක්-වෙරළ වැලි "සංස්ථා වැලි" වෙළඳ නාමය යටතේ විකුණනු ලැබේ.

එහි මිල සහ ඉදිකිරීම් කටයුතු සඳහා වැලි වල යෝග්‍යතාවය පිළිබඳව මහජනයා අතර පවතින මතය වෙනස් වීම හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ මුහුදු වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස ඉහළ ගොස් ඇත.

කෙසේවෙතත්, 2019 අප්‍රේල් මාස ඇති වූ ත්‍රස්තවාදී ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස සමාජයේ හා ආර්ථිකයේ ඇති වූ කැළඹීම් හේතුවෙන් 2019 වර්ෂයේ වැලි අළෙවිය අඩුවීමක් ඇති විය.

පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් 2013 සිට වාර්ෂික අක්-වෙරළබඩ වැලි අළෙවි ප්‍රමාණය දැක්වේ.

2013 - 2019 දක්වා කාලය තුළ අක්-වෙරළ වැලි විකිණීමේ ප්‍රමාණය



අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සහ "සංස්ථා වැලි" දිවයිනේ සියලු පළාත්වල පැවතීම ඉහළ නැංවීම සඳහා, SLLDC විසින් පහත සඳහන් පියවර ගෙන ඇති අතර එය ඉදිරි වර්ෂවලදී ක්‍රියාත්මක වනු ඇත.

- *සේදීමේ සහ හැළීමේ නව යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම*
  නිෂ්පාදනයේ තත්ත්ව පාලන යාන්ත්‍රණය සහ අගය වැඩි දියුණු කිරීම සඳහා, හැළීම සහ සේදීමේ ක්‍රියාවලිය හඳුන්වා දෙන ලදී.

  ඇසෙට් ඉන්ජිනියරින් විසින් මෙහෙයවනු ලබන දිනකට කියුබ 500 ක ධාරිතාවයකින් යුත් යන්ත්‍රාගාරයක් 2017 ජුනි මාසයේදී ආරම්භ කරන ලද අතර දිනකට කියුබ 275 ක ධාරිතාවයකින් යුත් REDECO 2019 මැයි මාසයේදී ආරම්භ කරන ලදී.

- *වැලි ඇසුරුම් කිරීමේ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම*
  වෙළඳපොළ විනිවිද යාම වැඩි දියුණු කිරීම සඳහා කිලෝ 50 වැලි පැකට් වෙළඳපොළට හඳුන්වා දෙන ලදී. කුඩා ප්‍රමාණයන්ගෙන් වැලි අවශ්‍ය කුඩා පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සහ නිවාස ඉදිකරන්නන් ඉලක්ක කරන ලද ගනුදෙනුකරුවන් වේ.

අක්-වෙරළ වැලි විකිණීම

සංස්ථාවට වැඩිම ආදායමක් ලැබෙන්නේ අක්-වෙරළ වැලි අළෙවියෙනි. පසුගිය වසර කිහිපයට සාපේක්ෂව 2019 දී සංස්ථාවට කියුබ 128,087.12 ක විකුණුම් ධාරිකාවයක්

සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ආදායම අනුව එය රු. 1,068,742,230.92කි.

මුළු ආදායම (2019) : රු. මිලියන1,068.74

2019 වර්ෂයේදී මාසිකව අලෙවි කරන ලද අක්-වෙරළ වැලි ප්‍රමාණයන්



පහත දැක්වෙන ප්‍රස්තාර මගින් පසුගිය සිව් වසර තුළ විකුණුම් රටාව නිරූපණය කෙරේ

ප්‍රස්තාරය 01 – මාසිකව අලෙවි කරන ලද අක්-වෙරළ වැලි ප්‍රමාණයන්



ප්‍රස්තාරය 02 – මාසිකව අලෙවි කරන ලද අක්-වෙරළ වැලි ප්‍රමාණයන්



ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්

1. දියත උයන

දියවන්නා ඔය ඉවුරේ ඉදිකරන ලද දියත උයාන උද්‍යානය 2012 සැප්තැම්බර් මාසයේදී විවෘත කරන ලදී. ආරම්භයේ සිටම ආසන්නයේ ජීවත් වන ජනතාව පමණක් නොව දිවයින පුරා විසිරී සිටින සෑම තරාතිරමකම පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට එය සමත් වී තිබේ. වගුරු බිමක ඉදිකර ඇති මෙම උද්‍යානයට වාණිජ අගනගරයෙන් පහසුවෙන් ළඟා විය හැකිය. නගරයේ කළබලකාරී වටපිටාවෙන් මිදී යම් සහනදායී වටපිටාවක විවේකයෙන් ගත කිරීමට පවුල්වලට මෙය කදිම ස්ථානයකි. සංගීත ජල මලෙන් විහිදෙන වර්ණවත් ජල ධාරාවන් සමස්ත පසුබිමට විචිත්‍රත්වයක් එක් කරයි.

දියවන්නා ඔයේ ජලය සන්සුන්ව ගලා බසින වටපිටාවක සශ්‍රීක හරිත හා සාමකාමී වාතාවරණයක් තුළ, ඒ අසල ඇති වතුර මලට අමතරව, දවසේ ඕනෑම වේලාවක විවේකීව සිටීමට කදිම ස්ථානයක් මහජනයාට ලබා දී තිබේ.



දියවන්නා ඔය පසුකර යන විට විවේකීව සිටීමටත්, මදක් ගිමන් හැරීමට සහ වටපිටාව භුක්ති විඳීමටත් උපාය මාර්ගික ස්ථානවල තබා ඇති හරිත උද්‍යාන පුටු මහ හැර යෑමය කිසිවෙකු සමත් වේ යැයි සිතිය නොහැක.

නරඹන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ආහාර අලෙවිසැල් ද තිබේ. පැමිණෙන්නන්ට සෞඛ්‍ය සම්පන්න සහ සන්සුන් වාතාවරණයක් තුළ කෙටි කෑමක් හා පානයක් ලබා ගත හැකිය.

දියත උයන හි මින්මැදුර බොහෝ ළමයින් ආකර්ෂණය කර ගන්නා අතර සවස් කාලයේ රවුම් මින්මැදුර වටා සමූහයා එක්රැස් වන අතර එය නගර වැසියන්ගේ ජීවිතවලට මොහොතක සන්සුන් බවක් ලබා දෙයි.

ඔබේ ආදරණීයයන් සමඟ ඡායාරූප ගත හැකි බැවින් ත්‍රිමාණ සිතුවම් ප්‍රදේශය ප්‍රධාන ආගන්තුක ආකර්ෂණයකි.



ප්‍රදේශයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ;

- දියවන්නා ඔය ගං ඉවුරේ පිහිටි අලංකාර මල් වෙළඳසැල්
- ගං ඉවුරේ ඇවිද යෑමට හැකි වීම.
- ගංගා බෝට්ටු හෝ රුවල් බෝට්ටු සහ පදින බෝට්ටු සවාරියක් යෑමට හැකි වීම
- ශාක පත්‍රයක හැඩයෙන් යුත් බස් නැවතුම්පොළ
- සිමෙන්තු බංකු සහ මේස
- මධ්‍යයේ පිහිටි ජල මල
- වෙනස්වන වර්ණවලින් යුත් ජල මල
- ළමයින් සඳහා සෙල්ලම් කිරීමේ ප්‍රදේශය.
- නිස්කලංක පරිසරය – ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු වුවද සිදු කළ හැක
- ආහාර වෙළඳසැල් – කෙටි කෑමක් ලබා ගත හැකි වීම සහ දේශීය සහ විදේශීය පාන වර්ග පානය කිරීමට හැකි වීම
- බිම්ගල් ඇල්ලූ මංතීරු ඔස්සේ ඇවිදීම, දිව යෑම සහ බයිසිකල් පැදීම සිදු කළ හැකි වීම.
- ත්‍රිමාණ ඡායාරූප ලබා ගැනීමේ හැකියාව
- වක්‍රාකාර මින් මැදුර

සුදුසු අලෙවි සැල් හිමියන් ජාතික තරහකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තෝරාගෙන වසරක කාලයක් මාසික කුලී පදනම මත ප්‍රදානය කරනු ලැබේ, එක් වසරක කාලය වාර්ෂිකව වසර පහක් දක්වා අලුත් කරනු ලැබේ.

2019 අප්‍රේල් ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව සමාජ තත්ත්වයන් යථා තත්ත්වයට පත්වන තෙක් වෙළෙන්දන්ට සහන ලබා දීම හේතුවෙන් ආහාර වෙළඳසැල්වලින් ආදායම් උත්පාදනය අඩුවී තිබේ.

ආහාර වෙළඳසැල්	: රු.මිලියන 25.28
මල් වෙළඳසැල්	: රු.මිලියන 35.94
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 04.44
මුළු ආදායම (2019)	: රු.මිලියන 65.66

2. බෙල්ලන්විල



කොළඹ වැසියන් මෙම ස්ථානය ගැන හොඳින් දනිති. සෑම දිනකම සිය ගණනක් හෝ දහස් ගණනක් දිවීම, ඇවිදීම සහ බයිසිකල් පැදීම සඳහා මෙහි පැමිණේ. මෙම ස්ථානයට පැමිණීම රාත්‍රියේදී කොළඹදී කළ යුතු සිත්ගන්නා සුළු දෙයකි.

කොළඹ බොරලැස්ගමුවෙහි පිහිටා ඇති බෙල්ලන්විල උද්‍යානය, ශ්‍රී ලංකාවේ මේ දක්වා අප කතා කළ අනෙක් උද්‍යානවලට වඩා මදක් වෙනස් වේ.

ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් බෙලන්විල උද්‍යානය 2014 දී ‘‘චෙරස් ගහ’’ ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ඉදිකරන ලදී. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය, බයිසිකල් ධාවන පථය සහ ආහාර අළෙවි සැලයි. පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීම ඇත්තෙන්ම කදිම ස්ථානයකි

2019 අප්‍රේල් ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව සමාජ තත්ත්වයන් යථා තත්ත්වයට පත්වන තෙක් වෙළෙන්දන්ට සහන ලබා දීම හේතුවෙන් ආහාර වෙළඳසැල්වලින් ආදායම් උත්පාදනය අඩුවී තිබේ.

ආහාර වෙළඳසැල්	: රු.මිලියන 12.09
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 0.75
මුළු ආදායම (2019)	: රු.මිලියන 12.84



3. කිඹුලාවල



සාමාජිකයන් 103 දෙනෙකුගෙන් 2015.01.12 දින ආරම්භ කරන ලද ව්‍යායාම් ක්‍රියාකාරකම් මේ වනවිට පුද්ගලයින් 483 ක් දක්වා වී ඇති අතර එමඟින් පොදු ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවට අමතර වටිනාකමක් ලබා දේ.

ඵලදායී, කාර්යක්ෂම හා අභිප්‍රේරණය වන ව්‍යායාම වැඩසටහන් සැලසුම් කිරීමෙන් මෙම තත්ත්වය අත්පත් කරගෙන ඇත. අපගේ පුහුණුකරුවන් මනා සුදුසුකම්වලින් යුක්ත වන අතර කර්මාන්තයේ නව ප්‍රවණතා සමඟ කටයුතු කරයි.

වැදගත්ම දෙය නම්, ඔවුන් අලුතින් සම්බන්ධ වූ අත්දැකීම් අඩු සාමාජිකයන් පිළිබඳව ඉතා සැලකිලිමත් වීම සහ ඔවුන්ට සහාය වීමයි.

ව්‍යායාම් මධ්‍යස්ථානය	: රු.මිලියන 6.19
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 0.33
මුළු ආදායම (2019)	: රු.මිලියන 16.52



4. කෙළිමඩල

“බොරලැස්ගමුව - කෙලිමඩළ ළමා උද්‍යානය’’ කොළඹ - හොරණ පාරේ පිහිටා ඇත. කෙලිමඩළ උද්‍යානය 2018 දී "චෙරස් ගහ" ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇත. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ශ්‍රී ලංකාවේ පළමු ළමා උද්‍යානය මෙයයි. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය**,** ආහාර අළෙවි සැල සහ ළමා උද්‍යානයයි. එය සැබවින්ම පවුලේ අය හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීමට කදිම ස්ථානයකි.

ආබාධිත ළමුන් සඳහා නිර්මාණය කර ඇති විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් 21 ක් මෙහි ඇත. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට විශේෂ ආරක්ෂාවක් යටතේ හැකි තාක් දුරට සාමූහික ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට හැක.

සමාලෝචිත වර්ෂයේදී කෙලිමඩළ උද්‍යානයෙන් උපයන ලද ආදායම පහත පරිදි වේ

2019 අප්‍රේල් ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව සමාජ තත්ත්වයන් යථා තත්ත්වයට පත්වන තෙක් වෙළෙන්දන්ට සහන ලබා දීම හේතුවෙන් ආහාර වෙළඳසැල්වලින් ආදායම් උත්පාදනය අඩුවී තිබේ.

ආහාර වෙළඳසැල්	: රු.මිලියන 1.32
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 0.18
මුළු ආදායම (2019)	: රු.මිලියන 1.50



5. ප්‍රවර්ධන පුවරු සහ ඇළ මාර්ග රක්ෂිත

මුළු ආදායම (2019): රු.මිලියන 5.99

සමාගමේ එළිමහන් සලකුණු බොහෝ විට අනාගත ගනුදෙනුකරුවෙකු දකින පළමු දෙයයි. සමාගම් ලාංඡනය අවධානය ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් දීප්තිමත් හා කැපී පෙනෙන්නක් විය යුතු (අතිශය දීප්තිමත් නොවිය යුතුය) වන අතර අනාගත ගනුදෙනුකරුවන්ට එහි විකුණනු ලබන දේ පිළිබඳව දැන ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සහිත විය යුතුය. SLLDC පාලනය යටතේ ඇති ඇළ ඉවුරුවල සහ වෙනත් ස්ථානවල ඇති ඉඩ ප්‍රමාණය පෞද්ගලික පාර්ශ්වයන්ට ඔවුන්ගේ නිෂ්පාදනය, සේවාව හෝ සමාගම ප්‍රදේශයේ මහ නගර සභාවේ අවසරය ඇතිව ප්‍රචාරය කිරීම සඳහා ලබා දී ඇත.





6. ගාර්ටන්ස් ආර්ක් අවන්හල

ගාර්ටන්ස් ආර්ක් යනු නාවල නාගරික තෙත්බිම් උද්‍යානයට යාබදව පිහිටි දියවන්නා ඔයේ නිශ්චල ජලයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ විශාලතම යාත්‍රා අවන්හලයි. එය 2014 නොවැම්බර් මාසයේදී දියත් කරන ලදී. 2014 මෙම ක්‍රියාකාරකමෙන් මාසිකව රු. මිලියන 0.18 ක ආදායමක් උපයා ගනු ලැබේ.

2019 අප්‍රේල් ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව සමාජ තත්ත්වයන් යථා තත්ත්වයට පත්වන තෙක් වෙළෙන්දන්ට සහන ලබා දීම හේතුවෙන් ආහාර වෙළඳසැල්වලින් ආදායම් උත්පාදනය අඩුවී තිබේ.

මුළු ආදායම (2019)– රු.මිලියන 0.9



7. කොටුපළ බෝට්ටු සේවය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව පාර්ලිමේන්තු මාර්ගයෙන් ඇති වන වාහන තදබදය හේතුවෙන් සිසුන්ට කාලය අහිමිවීම මහහරවා ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට ශ්‍රීලඉගොසංස විසින් දියත උයනේ සිට රාජගිරියේ පාසල දක්වා කොටුපළ සේවාවක් ආරම්භ කර තිබේ. අවබෝධතා ගිවිසුමට අනුව SLLRDC සහ ශ්‍රී ලංකා නාවික හමුදාව ගාස්තුවක් අයකර බෝට්ටු සේවාව කළමනාකරණය කර ක්‍රියාත්මක කරනු ඇත. රාජගිරියේ ගේට්වේ විද්‍යාලයට මායිමව පිහිටි චෝටර්ස් එජ් සමඟ සම්බන්ධ වන අලංකාර ජල මාර්ගය හේතුවෙන් මෙම අනන්‍ය පියවර ගැනීමට හැකි වී ඇත.

මෙම සේවාව ආයතනයට අමතර ආදායමක් ලබා දෙනවා පමණක් නොව, ජාතික ප්‍රශ්නයක් වන කාර්යබහුල වේලාවන්හිදී රථවාහන තදබදයට හොඳ විසඳුමක් ලබා දීමට උපකාරී වන අතර එමඟින් ඇළ මාර්ග නඩත්තු පිරිවැය අඩු කරනු ඇත. මුළු ආදායම (2019): රු. මිලියන 0.73.





8. හංස බෝට්ටු සේවය

විවේකය සහ සන්සුන්භාවය දියවන්නා ඔයේ දායාදයන් වේ. පදින හංස බෝට්ටු මඟින් විනෝදාත්මක අත්දැකීමක් ලබා දෙන අතරම එහි වගුරුබිම් ඉවුර දිගේ බෝට්ටු සවාරිය නගර වැසියන්ට සොබාදහම සමඟ නැවත සම්බන්ධ වීමට උපකාරී වේ. මෙම පහසුකම මහජනයාට ලබා දීම සඳහා පෞද්ගලික අංශයට භාර දී ඇත.

මුළු ආදායම (2019): රු.මිලියන 0.34



පිරියත හා යන්ත්‍රෝපකරණ අංශය

පිරියත හා යන්ත්‍රෝපකරණ අංශයේ ප්‍රධාන කාර්යය

- පහත සඳහන් යන්ත්‍රෝපකරණ මෙහෙයුම් සහ නඩත්තු කිරීම
  - පස් කපා ඉවත් කිරීමේ/හැරීමේ උපකරණ
  - ටිපර් රථ, ට්‍රැක්ටර් සහ ට්‍රෙලර්
  - වෙනත් සැහැල්ලු සහ බර වාහන එසවීමේ සහ ප්‍රවාහනය කිරීමේ යන්ත්‍රෝපකරණ
- ඇළ මාර්ග, වැව් මීටර් 6ක් දක්වා හැරීම/මඩ ඉවත් කිරීම
- විශේෂයෙන් ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම
- සංස්ථාවේ සැහැල්ලු වාහන ඇණිය අලුත්වැඩියා කිරීම සහ සේවා සිදු කිරීම
- පිරිසැකසුම් සහ පැස්සුම් කාර්යයන්

පවතින යන්ත්‍රෝපකරණ වර්ග



මතු පිට සහ උපරි-මතුපිට පිරිසිදු කිරීම සඳහා වන පාවෙන ඩෝසරය



මඩ ඉවත් කිරීම/පිරිසිදු කිරීමේ මෙහෙයුම් සඳහා බත්තල මත නංවන ලද එක්ස්කැවේටර් යන්ත්‍ර



මඩ ඉවත් කිරීම/පිරිසිදු කිරීමේ මෙහෙයුම් ලෝන්ග් රීච් ආම් සොප්ට් ටෙරින් ඇම්ෆිබියස් එක්ස්කැවේටර් යන්ත්‍රය



මීටර් 6ක් දක්වා ගැඹුරට හැරිය හැකි අඟල් 12 කටර් ස්කෂන් ඩ්‍රෙජර් යන්ත්‍රය



අහල් 6 හෑරීමේ පොම්ප සම්බන්ධකයක් සහිත ඇම්ෆිබියස් සොෆ්ට් ටෙරින් එක්ස්කැවේටර් යන්ත්‍රය





බර වාහන ගොඩබිම ප්‍රවාහනය කිරීම



සැපයුම් අංශය

ක්‍රියාවලිය අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහා වෘත්තියභාවය ගෙන එන සැපයුම් හා ගබඩා අංශය.

අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වෘත්තීමය සේවාවක් සැපයීම සඳහා සැපයුම් අංශය SLLDC හි **වැඩිම ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් වෘත්තීය අංශය** වීමේ දැක්ම ඉදිරිපත් කළේය. එහි මෙහෙවර වන්නේ **"අවසාන පරිශීලකයාගේ අවශ්‍යතා ඵලදායී ලෙස, කාර්යක්ෂමව, ආර්ථික වශයෙන් හා පරිසර අවශ්‍යතාවයන්ට අනුකූලව සපුරාලීම සඳහා ද්‍රව්‍ය හා සේවා ප්‍රසම්පාදනය කිරීම"** වේ.

මෙම මෙහෙවර වෙනුවෙන් සැපයුම් කණ්ඩායම ව්‍යුහගත කර ඇත. 2019 වර්ෂය සඳහා සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම SLLDC සැපයුම් අංශය විශාල දායකත්වයක් ලබා දී ඇත. ප්‍රකාශිත ගුණාත්මකභාවයට අනුකූලව නියමිත වේලාවට නිෂ්පාදන හා සේවා ප්‍රසම්පාදනය කිරීම බොහෝ ව්‍යාපෘති නියමිත වේලාවට නිම කිරීමට දායක වී තිබේ. ප්‍රසම්පාදන ක්‍රියාවලියට පහත සඳහන් වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී. ප්‍රසම්පාදන දත්ත සමුදාය පිහිටුවීම එවැනි එක් ක්‍රියාකාරකමක් වන අතර එය සියලු අංශවලින් ලැබෙන මිලදී ගැනීමේ ඉල්ලීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයකින් සමන්විත වේ. පෙරටු කාලය අඩු කිරීමට සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට දත්ත සමුදාය දායක විය. තවද මෙම පහසුකම සේවා හා කොන්ත්‍රාත් අංශ වෙත ව්‍යාප්ත කරන ලද අතර අභ්‍යන්තර පාරිභෝගිකයින්ටද ප්‍රවේශය ලබා දෙන ලදී. සංස්ථාවේ අනෙකුත් අංශ අතර නිසි සන්නිවේදන මාර්ග සංවර්ධනය කරන ලද අතර ප්‍රධාන වශයෙන් මධ්‍යම වෙළඳසැල්, වැඩපොළ, ප්‍රවාහන අංශය සහ සැපයුම් අංශයේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා සම්මුහුර්ත කරන ලදී. ක්‍රියාවලි ඒකාබද්ධ කිරීම සහ පවතින අවහිරතා අවම කිරීම සඳහා අංශ ප්‍රගති රැස්වීම් ප්‍රයෝජනවත් විය. හඳුනාගත් ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම සඳහා සැපයුම් අංශයේ නියෝජිතයෙකු පත් කරන ලදී. සැපයුම් කළමණාකරුවෙකු බඳවා ගැනීම සැපයුම් දාම ක්‍රියාවලියට මහත් පිටුවහලක් වී ඇති අතර අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගේ, වැඩපොළ ඉංජිනේරුවන්ගේ මෙම පැසසුමටද ලක්විය. පාරිභෝගිකයාට වඩා හොඳ සේවාවක් ලබා දීම සඳහා අසුන් ගැනීමේ පිළිවෙළ ප්‍රතිසංවිධානය කරන ලදී. ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහනකට පසුව, ටෙන්ඩර් විවෘත කිරීමේ නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ටෙන්ඩර් විවෘත කිරීමේ තොරතුරු ලබා දී ඇත්තේ ටෙන්ඩර් විවෘත කිරීමේ කණ්ඩායමට සහ ඇගයීම් කණ්ඩායමට පමණි. මුද්‍රා තැබූ ලියුම් කවර සෘජුවම අදාළ ඇගයීම් අධිකාරි බලය සහිත නිලධාරීන් වෙත යවනු ලැබේ. ගබඩා පාලකයන්ට සහ සැපයුම් කාර්ය මණ්ඩලයට කළමනාකරණ තොරතුරු පද්ධතිය (SAP) හඳුන්වාදීම සැපයුම් දාම ක්‍රියාවලිය ඊළඟ මට්ටමට ගෙනයාම උදෙසා උපකාරී විය. පුහුණු වැඩසටහන් මාලාවක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) විසින් සිදු කරන ලදී. සියලුම ගබඩා පාලකයන්ට පරිගණක ලබා දෙන ලදී. ගබඩා භාරකරුවන්ගේ සංගමයේ නියෝජිතයන් දැනුම බෙදා ගැනීමේ සැසියක් සඳහා ටොයෝටා මෝටර් සමාගමේ සංචාරයක යෙදිණි. ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ගබඩා පහසුකම වැඩි දියුණු කිරීම සඳහා 10'x8', පරිවර්තනය කළ පෙට්ටි 6 ක් ඇණවුම් කර ගබඩා පාලකයන්ට ලබා දී. ඩීසල් ටැංකිය ස්ථාපිත කරන ලද අතර බෙදා හැරීම ආරම්භ කරන ලදී. මෙම ටැංකියේ ධාරිතාව ලීටර් 24,000 කි.

මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. මානව සම්පත් මෙහෙයුම් (පරිපාලනය)

- ප්‍රධාන මානව සම්පත් ක්‍රියාකාරකම්වල මනා මෙහෙයවීම සහ සේවකයන්ගේ සුබසාධනය සහතික කිරීම

2. මානව සම්පත් සංවර්ධනය

- පුද්ගල හා ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව තුළ මානව ප්‍රාග්ධනය නිසි ලෙස සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම

3. මානව සම්පත් පුහුණුව සහ සංවර්ධනය

- ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා සාක්ෂාත් කර ගැනීම සහ වැඩි දියුණු කිරීම

මානව සම්පත් මෙහෙයුම්		මානව සම්පත් සංවර්ධනයන්	මානව සම්පත් පුහුණුව
▪ සේවා අවශ්‍යතා මත වාර්ෂික මාරුවීම් සහ මාරුවීම් ▪ මිනිස්බල/දේපළ/වාහන/යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අනතුරු සහ හිමිකම් සමඟ වාර්ෂික රක්ෂණ හැසිරවීම ▪ විනය පරිපාලනය ▪ සේවක සුභසාධනය ▪ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ ▪ ආරක්ෂක අංශය, ප්‍රවාහන හා වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම ▪ එන සහ පිටතට යන තැපෑල	▪ වැටුප් හා වේතන පරිපාලනය ▪ වාර්ෂික වැටුප් වැඩිවීම් ▪ කාර්ය සාධන ඇගයීම සහ ප්‍රතිලාභ ▪ ව්‍යක්තීය සමිති කටයුතු කළමනාකරණය කිරීම ▪ බඳවාගැනීමේ යෝජනා ක්‍රියා පටිපාටිය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය ▪ කාල කළමනාකරණය ▪ අභ්‍යන්තර හා බාහිර චක්‍රලේඛ ▪ සේවක දූක්ගැනවිලි	▪ මානව සම්පත් සැලසුම් කිරීම ▪ බඳවාගැනීම සහ තෝරා ගැනීම ▪ උසස්වීම් ▪ මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය ▪ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තීරණ සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම ▪ ආයතනික සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කිරීම ▪ සංස්ථාව සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති සමඟ ගුණාත්මක ප්‍රතිපත්ති සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි සහ වගකීම් අධීක්ෂණය හා වැඩි දියුණු කිරීම ▪ LRDC සහ REDECO කටයුතු	▪ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම ▪ පූහුණු අවශ්‍යතා තක්සේරු කිරීම් පැවැත්වීම ▪ වාර්ෂික පූහුණු සැලැස්මක් සකස් කිරීම ▪ නම් කරන ලද පුහුණු වැඩසටහන් සඳහා පූහුණු කමිටු නිලධාරීන් හරහා තෝරා ගැනීම් සිදු කෙරේ ▪ ඇගයීමේ නිර්ණායකයක් මත පදනම්ව ප්‍රතිචාර එක්රැස් කිරීම ▪ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍යාධාර සැපයීම

බඳවාගැනීම් සහ තෝරා ගැනීම්

2019.01.01 සිට දක්වා සිදු කර ඇති 2019.12.31බඳවාගැනීම්	
සේවක වර්ගය	**2019**
ස්ථිර	47
කොන්ත්‍රාත්	15
පුහුණු	33
එකතුව	**95**
වදිනට මුළු සේවකයන් සංඛ්‍යා 2019.12.31	
ස්ථිර	1358
කොන්ත්‍රාත්	50
එකතුව	**1408**

මානව සම්පත් සැලසුම්කරණය - (2020 වර්ෂය සඳහා යෝජිත නව සේවක සංඛ්‍යාව)

තනතුර	වැටුප් ක්‍රේතය	අනුමත සේවක සංඛ්‍යාව	මේ වනවිට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	යෝජිත සේවක සංඛ්‍යාව
ප්‍රධාන කලමනාකරු	HM 2-2	01	01	-	01
අතිරේක සාමාන්‍යාධිකාරී	HM 2-1	02	02	-	02
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	HM 1-3	12	11	01	12
සහකාර සාමාන්‍යාධිකාරී	HM 1-1	16	14	02	16
කළමනාකාර කාණ්ඩය	MM 1-1	148	125	23	154
කණිෂ්ඨ කළමනාකාර කාණ්ඩය	JM 1-1	112	81	31	124
බලාත්මක කිරීමේ නිලධාරී	MA 5-1	06	02	04	09
මෙහෙයුම්/උපදේශාත්මක කාණ්ඩය	MA 04	-	01	(01)	-
සහකාර නිලධාරී කාණ්ඩය	MA 03	59	48	11	65
කළමනාකරණ සහකාර -තාක්ෂණ කාණ්ඩය	MA 2-2	213	153	60	251
කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන කාණ්ඩය	MA 1-2	210	177	33	210
ප්‍රාථමික මට්ටම කාණ්ඩය - පුහුණු	PL 03	325	317	08	419
ප්‍රාථමික මට්ටම කාණ්ඩය - අර්ධ පුහුණු	PL 02	114	72	42	116
ප්‍රාථමික මට්ටම කාණ්ඩය - නුපුහුණු	PL 01	508	404	104	452
යෝජිත නව තනතුරු නාම	-	-	-	-	25
	මුළු එකතුව	**1726**	**1408**	**318**	**1856**

පුහුණු සහ සංවර්ධනය

අලුතින් බඳවා ගත් සේවකයන් සඳහා නව සේවක මගපෙන්වීමක් පවත්වන අතර මෙය ශක්තිමත් සේවා යෝජක-සේවක සම්බන්ධතාවයක් ගොඩනැගීමේ අත්‍යවශ්‍ය පියවරක් ලෙස පවත්වාගෙන යනු ලැබීය. අධීක්ෂණ හා කළමනාකරණ කාර්යභාරයන් සඳහා අභිලාෂක නායකයින් සූදානම් කිරීම සඳහා සංස්ථාවේ සාධාරණ රැකියා භාවිතයන් සහ සේවක සංවර්ධනයට සහාය වන පුහුණුවක් ද මානව සම්පත් පුහුණු හා සංවර්ධන අංශය විසින් සපයනු ලැබේ. පූහුණු කමිටුවේ නිර්දේශය ඇතිව වඩාත් සුදුසු හා සුදුසුකම් ලත් අපේක්ෂකයින් වැඩසටහන් සඳහා නම් කරන ලදී

සේවකයින් අතර තරගකාරී වාතාවරණය පවත්වා ගැනීම පිණිස ඔවුන්ගේ අනාගත කාර්යභාරයන් හා වගකීම් සඳහා කුසලතා වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර නු ලැබේ.

තවද, රු. 3,768,607.30/=ක පිරිවැයක් යටතේ දේශීය පුහුණු වැඩසටහන් 60 ක් පවත්වා සේවකයින් 744 කට පමණ ප්‍රතිලාභ ලබා දී ඇති අතර රු. 5,369,529/=ක පිරිවැයකට විදේශ පුහුණු වැඩසටහන් 14ක් පවත්වා සේවකයින් 22 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.

තවද, 2019 වර්ෂය සඳහා එක් (01) විධායක නිලධාරියෙකු සඳහා උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් රු. 186,000/-ක මූල්‍යාධාර ලබා දී ඇත.

ඒ අනුව, 2019 වර්ෂයේ පූහුණු හා සංවර්ධනය සඳහා වැය කළ මුළු වියදම රු.මිලියන 9.324 කි.

ISO තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ සෞඛ්‍යය සහ ආරක්ෂාව

- **ISO 9001: 2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය**

2020.04.05 දින දක්වා 2017.04.06 දින නිකුත් කර ඇති සහතික අංක QSC 05194 මඟින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001: 2008 සිට ISO 9001: 2015 දක්වා පරිවර්තනය කරන ලදී.

ප්‍රවර්ධනය

ආයතනික අරමුණු සපුරාලීම, සේවකයෙකුගේ යුතුකම් සහ කාර්යයන් හඳුනා ගැනීම මත උසස්වීම් පදනම් වේ. ලබා දී ඇති සංකීර්ණතාව සහ වගකීම මත මෙය වෙනස් විය හැකිය. එබැවින් ඉහළ යන වගකීම් මට්ටම් මත වෙනස් වන තරාතිරම මත උසස්වීම් පදනම් වේ. උසස්වීම්වල අමතර ප්‍රතිලාභ ලෙස වඩා හොඳ කාර්ය සාධනය සඳහා දිරිගැන්වීමක්, චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීමක් සහ තනි තනි සාක්ෂාත් කර ගැනීමක සහ පිළිගැනීමක හැඟීමක් ඇති කරයි .

- සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාවේ ඇති පුරප්පාඩු මත සහ අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවක සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව උසස්වීම සඳහා සලකා බලන ලදී.

- අනුමත උසස්වීම් ක්‍රියා පටිපාටියේ දක්වා ඇති අවශ්‍යතා අනුව ශ්‍රේණියක සිට තවත් ශ්‍රේණියකට උසස්වීම් ලබා දෙන ලදී.

ඒ අනුව, 2019 වර්ෂය මුළුල්ලේ තනතුරු මත පදනම්ව අනුමත සේවක සංඛ්‍යාවේ ධූරාවලි තනතුරු සඳහා ශ්‍රේණි උසස්වීම් 55 ක් සහ උසස් කිරීමේ පත්වීම් 18 ක් පිරිනමනු ලැබිණි.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය සභාපතිවරයා යටතේ ස්වෛච්ඡුවම ක්‍රියාත්මක වන අතර සංස්ථාවේ මූල්‍ය හා වෙනත් මෙහෙයුම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිතාවය සහතික කිරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත. දෝෂ සහ වංචා වැළැක්වීම සහ හඳුනාගැනීම සඳහා යොදා ගන්නා අභ්‍යන්තර පරීක්ෂාවේ නිරවද්‍යතාවය සහ ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා මූල්‍ය හා වෙනත් මෙහෙයුම් ඇගයීමේ අරමුණින් අහඹු හා ස්වාධීන සමීක්ෂණ සිදු කිරීමෙහි අභ්‍යන්තර විගණන අංශය නිරත වී සිටී.

මෙම අංශය විවිධ මෙහෙයුම්වලට අදාළ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය සිදු කරන අතර අවම පිරිවැය යටතේ උපරිම ප්‍රතිලාභය රඳවාගැනීම සඳහා ඵලදායී තීරණ ගැනීමට ඉහළ කළමනාකාරිත්වයට සහාය වේ. අභ්‍යන්තර විගණන අංශය මගින් ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර පහත දැක්වේ;

- භෞතික හා මූල්‍ය කාර්ය සාධනය අනුව භාණ්ඩාගාර අරමුදල් සපයන ව්‍යාපෘති ඇතුළුව සංස්ථාව විසින් සිදු කරනු ලබන ව්‍යාපෘතිවල ශක්‍යතාව අධීක්ෂණය කිරීම.
- මුද්‍රා තැබූ ටෙන්ඩර් විවෘත කිරීම, ප්‍රසම්පාදන කමිටු (PC) රැස්වීම්වලට නිරීක්ෂකයෙකු ලෙස සහභාගි වීම, ප්‍රසම්පාදන පත්‍රිකා සහ තාක්ෂණික ඇගයීම් වාර්තා පරීක්ෂා කිරීම සහ NPA මාර්ගෝපදේශ නිසි ලෙස අනුගමනය කර ඇති බව සහතික කිරීම මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඵලදායිතාවය අධීක්ෂණය කිරීම.
- ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම තීරණය කිරීම සහ බර යන්ත්‍රෝපකරණ සහ වාහන කුලියට ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව ඇගයීම.
- ගෙවීම් පද්ධතිය හරහා සිදු කරන ලද ඉන්වොයිසි හා ගෙවීම් ඉල්ලීම් සැකසීමට අදාළ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ විවිධ ප්‍රභවයන්ගෙන් ආදායම එකතු කර ගැනීම සඳහා හොඳම භාවිතයන් හෝ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම.
- අලුතින් ක්‍රියාත්මක කරන ලද ERP පද්ධතිය සම්බන්ධයෙන්, ප්‍රවේශ පාලනය, පරිශීලක හැඳුනුම්පත් ඇගයීම, ව්‍යාපාර ක්‍රියාවලීන් හා සම්බන්ධ විනාශයන් ඇගයීම, අතුරු මුහුණත් සහ පෞද්ගලිකත්වය යනාදිය ඇගයීම.
- කාර්ය සාධනය සහතික කිරීම, ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම නිශ්චය කිරීම සහ ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව ඇගයීම සඳහා බර යන්ත්‍රෝපකරණ (සංස්ථාවට අයත් හා කුලියට ගත්) කාර්යයෙහි යෙදවීම අධීක්ෂණය කිරීම.
- සංස්ථාවේ අභිමතාර්ථ ව්‍යාපාර ආකෘතිය හා සංස්ථාවේ උපාය මාර්ග සමඟ සම්බන්ධ වී ඇති බව සහතික වීම.
- ඉන්වෙන්ටරි වාර්තාවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණභාවය සහතික කිරීම, ඉන්වෙන්ටරි ගනුදෙනු වල වගවීම සහතික කිරීම සහ ඉන්වෙන්ටරි ආරක්ෂා කිරීම සඳහා පාලනයන් වැඩි දියුණු කිරීම.
- චේරස් ගංගා වැනි ජල ජලාපවහනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය විගණනය කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින් අරමුණුවල විෂය පථය සාක්ෂාත් කරගනු ඇත්දැයි සොයා බැලීම.
- අනවසර ඉඩම් පිරවීම් හෝ ඉදිකිරීම් මුල් අවධියේදී හඳුනාගැනීම.
- ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහතික කිරීම මඟින් ඉඩම් තොගය කළමනාකරණය කිරීම සහ සත්‍ය ඉඩම් තොගය සත්‍යාපනය කිරීම සඳහා වාර්තා සහ දත්ත ඇගයීම.
- මුහුදු වැලි හෑරීමේ ක්‍රියාවලිය භෞතිකව නිරීක්ෂණය කිරීම සහ මුහුදු වැලි අළෙවියට අදාළ ලිපි ලේඛන පරීක්ෂා කිරීම වැනි මුහුදු වැලි ව්‍යාපෘතියට අදාළ මෙහෙයුම් සමාලෝචනය කිරීම හා ඇගයීම.
- පිරියන සහ යන්ත්‍රෝපකරණ අංශයේ බර යන්ත්‍රෝපකරණ සහ සැහැල්ලු වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව, මෙහෙයුම් පාලනයන් සහ ඉලක්ක සපුරා ගැනීම ඇගයීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව විගණන කමිටු රැස්වීම් කැඳවීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා එහි නිර්දේශයන් රැස්වීමේ කාර්ය සටහන් සමඟ කඩිනමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- බාහිර විගණනයට අදාළ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම සඳහා විගණකාධිපතිවරයා සමඟ සම්බන්ධීකරණය කිරීම.
- සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්වය විසින් පවරා ඇති විශේෂ පරීක්ෂණ පැවැත්වීම.

ඉහත කාර්යයන්ට අමතරව, මෙම අංශය අනුබද්ධිත සමාගම්වල අභ්‍යන්තර විගණනයන් ද සිදු කරයි; සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම සහ LRDC සර්විසස් පෞද්ගලික සමාගම.

නීති අංශය

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (SLLDC) පනත හා එහි තදනන්තර සංශෝධනයන් මඟින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

නීතිමය කාර්යයන්:

1. ඉඩම් සංවර්ධනය කිරීම්, නැවත පදිංචි කිරීම, ප්‍රජා උපදේශන සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම සහ අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා නීතිමය ආධාර සැපයීම.

2. සංස්ථාව මඟින් හා සංස්ථාවට එරෙහි නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

3. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

4. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩකරන්නන්ට එරෙහිව, 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත හා එහි සංශෝධනයන් මඟින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

5. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය.

6. සංශෝධන සඳහා වන යෝජනාවලට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී SLLDC පනත් කෙටුම්පත සකස් කර ඇති අතර ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහතිකය නිකුත් කර ඇත.

   ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අවසන් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අනුරූපී 3% ක පහත වැටීමේ අනුපාතයක් සමඟ රු. බිලියන 6.5ක පිරිවැටුමක් වාර්තා කර ඇත. පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ මුහුදු වැලි අලෙවිය පහත වැටීම සහ කෙරවලපිටියේ කොම්පෝස්ට් නිෂ්පාදන කර්මාන්ත ශාලාවෙන් ලැබෙන ආදායම අඩුවීමයි.

කර්මාන්තය මුහුණ දී ඇති සාර්ව මට්ටමේ අභියෝග තිබියදීත්, පෙර වර්ෂයේ රු.මිලියන 1,620 ක ලාභය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 752 බදු පෙර ලාභයක් ලබා ගැනීමට SLLDC සමත් විය.



2018 වසර හා සසඳන විට පොදු කාර්ය පිරිවැය 8% කින් පහත වැටී ඇත. කෙසේවෙතත් පාරිතෝෂික ප්‍රතිපාදන ඇතුළු පුද්ගල වියදම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස පරිපාලන වියදම් ඉහළ ගොස් තිබේ. තවද, පෙර වර්ෂයේ බොල් සහ අඩමාන ණය ලෙස සලකනු ලැබූ ණය අයකර ගැනීම හේතුවෙන් බොල් සහ අඩමාන ණය සඳහා කරනු ලැබූ වෙන් කිරීම හේතුවෙන් වෙනත් මෙහෙයුම් ආදායම රු. මිලියන 3 කින් ඉහළ ගොස් ඇත.

ප්‍රධාන වශයෙන් මුහුදු වැලි ණය පහසුකම් භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ පොලී වියදම් ශ්‍රීලරු. මිලියන 435 සිට ශ්‍රීලරු. මිලියන 592 දක්වා ඉහළ ගොස් ඇත.

ස්වයං ව්‍යාපෘති සඳහා වැඩි අරමුදල් යෙදවීම සහ මෙහෙයුම් හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා අනුබද්ධිත සමාගමෙහි අරමුදල් යෙදවීම හේතුවෙන් සංස්ථාවේ පොලී ආදායම ශ්‍රීලරු. මිලියන 541 සිට ශ්‍රීලරු. මිලියන 476 දක්වා අඩු විය.

2019 දෙසැම්බර් 31 දින වන විට, සංස්ථාව විසින් මෝටර් රථවල සාධාරණ වටිනාකම වෙළඳපොළ පදනම් කරගත් සාක්ෂිවලට අනුව ප්‍රත්‍යාගණන කරන ලදී. එබඳු ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලය මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇත්තේ එහි බලපැවැත්වෙන දිනය වන 2019.12.31 දිනට සිට වේ. ප්‍රත්‍යාගණනයෙන් පැන නගින ලද රු.මිලියන 2 .22 ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරන ලදී.



මූල්‍ය තත්ත්වය

ආයෝජන දේපල සඳහා අරමුදල් වැඩිපුර ආයෝජනය කිරීම හේතුවෙන් සංස්ථාවේ ජංගම නොවන වත්කම් 10% කින් ඉහළ ගොස් තිබේ. කෙසේවෙතත්, ණය සහ වෙනත් බැරකම් ආපසු ගෙවීම සඳහා සංස්ථාව කෙටිකාලීන ආයෝජන ඈවර කිරීම හේතුවෙන් ජංගම වත්කම් 2% කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ මුළු වත්කම් පදනම රු.බිලියන 17.7 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර සංස්ථාවේ ශුද්ධ වටිනාකම 2019 දෙසැම්බර් 31 වන විට රු.බිලියන 6.4 ක් විය.

සමූහ කාර්ය සාධනය

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම විසින් රු.මිලියන 45.2 ක ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර LRDC සර්විසස් (පෞද්.) සමාගම රු. මිලියන 55 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය. එබැවින් සමූහය බදු පෙර රු. මිලියන 555 ක ලාභයක් වාර්තා කළේය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2019 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන්, මෙහෙයුම් සමාලෝචනයේ සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක1 හි විස්තර කර ඇත

වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය

වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

පිරිවැටුම

2019 වර්ෂය තුළ සංස්ථාවේ පිරිවැටුම රුපියල් මිලියන 6,537කි. (2018: රු.මිලියන 7,097කි)

ලාභය

2018 වර්ෂයේ ලාභය වන රු.මිලියන 1,148 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ලාභය රු.මිලියන 456කි.

කටයුතුවල තත්ත්වය

සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ. (පිටුව 80)

දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් අංක 9හි දක්වා ඇත.

බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත සහ එකී පනතෙහි තදනන්තර සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 22 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සෑම මසකම අවම වශයෙන් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වනු ලැබේ. 2019 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 16ක් පවත්වා ඇත. එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව පහත පරිදි වේ

අධ්‍යක්ෂවරයාගේ නම	පත්වීම දිනය	සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
රොෂාන් ගුණවර්ධන මයා	31.12.2018	16	16
පිෘාකේ ගුණවර්ධන මය.ඒ.	31.12.2018	16	14
ජේවැලිගමගේ මිය .සී.	03.05.2018	16	16
ඉංජිමොහාන්රාජා මයා .එස්.	02.11.2017	16	12
ආචාර්ය ජගත් මුණසිංහ මයා	30.03.2016	16	13
ඉංජි ආර්ාගුණවර්ධන මය .එම්.බී.	30.01.2019	16	16
ඉංජි ඩීසජ්ජන ද සිල්වා මයා .	30.01.2019	16	15
ඉංජි ජීබෝගම්මන මයා .ඩී.බී.එම.	30.01.2019	16	13

අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයන් සම්බන්ධයෙන් සිදු කළ සියලු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

සේවක මණ්ඩලය

2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1,408 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත. (2018: 1432)

ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

අති විශේෂිත අයිතමයන්

වෙනම අනාවරණය කළ යුතු අසාමාන්‍ය/අති විශේෂිත ස්වභාවයේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මඟින් වාර්තා කර ඇත.

විගණකවරු

2019 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබනවා ඇත.

මණ්ඩලයේ අණ පරිදි,
අත්සන් කලේ,

එච්.කේ.කේ.ඩබ්ලිව්. ඒකනායක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2020 අගෝස්තු 27

විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. HUD/C/SLLRDC/1/19/19 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 අප්‍රේල් 28 දින

සභාපති
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගම්වල 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගම්වල 2019 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සාධාරණ අගය (Fair Value) මත ඉදිරිපත් කල යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 2,424.37 ක දේපල පිරියත උපකරණ වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) සංස්ථාවේ වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමේ කම්ටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි බව හඳුනාගත් පිරිවැය රු.මිලියන11.41 ක් වූ මෝටර් රථ ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 05 ට පටහැනිව තවදුරටත් ජංගම නොවන වත්කම් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු.මිලියන 715.67 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි, 36 වගන්තිය අනුව දේපළ පිරියත උපකරණවලට අදාළ යම් අයිතමයක් ප්‍රත්‍යාගණනය කරනු ලබන්නේ නම් එම අයිතමයට අදාළ වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව සතු පිළිවෙලින් රු. මිලියන 24.74 ක් හා රු. මිලියන 26.47 ක පිරිවැය වූ මෝටර් බයිසිකල් 160 ක් හා ජීප් රථයක් එලෙස ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය රු.මිලියන 158.28 ක් වූ ආයෝජන දේපල දෙකක සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු ඉඩම් ආයෝජිත දේපළ ලෙස වර්ගීකරණය කර ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් 6 කට අදාල ව්‍යාපෘති වල කල වැඩ භාහිර ඉංජිනේරුවරයෙකුගේ සහතික කිරීමකින් තොරව සේවාදායකයන්ට ඉදිරිපත් කළ බිල්පත් වල ඇතුලත් කළ වැඩ වටිනාකම පදනම් කරගෙන රු.මිලියන 266.76 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ආදායමට අදාළව කොන්ත්‍රාත් වියදම නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් 03 ක හඳුනාගත් ලාභය සියයට 100 ත් සියයට 1132 ත් අතර ප්‍රමාණයකින් විචලනය වී තිබුණි.

(ඊ) ගිණුම් ප්‍රතිපත්ති අංක 1.6 හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23 අනුව, ණය ගැනුම් පිරිවැය (Borrowing Cost) ණය මුදල් උපයෝජනය කර කරනු ලබන නිෂ්පාදනවල පිරිවැයෙහි කොටසක් ලෙස ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 1,323 ක් ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු මුහුදු වැලි තොග පිරිවැයට ඒ වෙනුවෙන් ලබාගත් ණය මුදලට අදාළ රු. මිලියන 261 ක ණය

ගැනුම් පිරිවැය ඇතුළත් නොවීම හේතුවෙන් මුහුදු වැලි තොග පිරිවැය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක කොන්ත්‍රාත් 02 කට අදාළව ස්ථාවර තාක්ෂණික කමිටුව (STC) මගින් රේටයන් සංශෝධනය කිරීම නිසා එම කොන්ත්‍රාත්තු වලින් රු. මිලියන 6.20 ක් සංස්ථාවට අහිමි වී තිබුණද එම සංශෝධනයන්ට අදාල ගැලපීම් ගිණුම්වල සිදු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කොන්ත්‍රාත් ආදායම එම වටිනාකම්න්ම වැඩියෙන් පෙන්නුම් කෙරුණි.

(ඌ) සංස්ථාව විසින් 2010 වර්ෂයේදී බවුසර් රථ ලෙස නවීකරණය කළ ට්‍රැක්ටර් ට්ලර් 10 ක වටිනාකම සහ 2012 වර්ෂයේ සිට භාවිතයට ගනු ලබන එක්ස්කැවේටර් යන්ත්‍රයක සහ බෝට්ටු 02 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර රු.1,620,000 කට තක්සේරු කර තිබුණු වාහන 3 ක වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති

බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඇ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	**විස්තරය**
(අ) 2006 අංක 35 දරණ සංස්ථා පනතේ 4 (අ) වගන්තිය	පනතේ අංක 3 හා 4 වගන්ති අනුව සංස්ථාව සතු ඉඩම් විකිණීමේදී ඒ සඳහා කර්මාන්ත, පළාත් පාලන අමාත්‍ය වරුන්ගේ නිර්දේශය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සමාගම විකුණන ලද රු. මිලියන 272.62 ක් වටිනා ඉඩමක් වෙනුවෙන් එලෙස නිර්දේශ ලබාගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය සංශෝධිත මුදල් රෙගුලාසි 139 (5)	මුදල් ගෙවීමට පෙර ආදායකයාගේ අනන්‍යතාවය නිවැරදිව තහවුරු කර ගැනීමකින් තොරව සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී විදේශ නීති ආයතනයකට කරන ලද ගෙවීම, බාහිර පුද්ගලයකුගේ ගිණුමකට බැර වීම හේතුවෙන් සංස්ථාවට සිදු වූ අලාභය රු. මිලියන 4.11 ක් විය.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	
(i) 2.2.2 වගන්තිය	සංස්ථාව සතු ඉඩමේ උප - කල් බදු ලබාදීමේදී උප කල් බදු ගාස්තු අය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii)	8.1.4 වගන්තිය	චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව සංස්ථාව සිය පරිපාලිත සමාගම වෙත මුහුදු වැලි පැකට් කර විකිණීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 200 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර මෙම ණය මුදල නැවත ගෙවීමට පරිපාලිත සමාගමට ඇති හැකියාව පිළිබඳවද සංස්ථාව ඇගයීමටක ලක් කර නොතිබුණි. තවද සංස්ථා පනතේ විධි විධාන ප්‍රකාරව සංස්ථාවට වෙනත් පාර්ශවයකට ණය ලබා දීමට ප්‍රතිපාදන ද නොතිබුණි.
(iii)	8.2.2 වගන්තිය	මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාලේචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථාවර හා කෙටි කාලීන තැන්පත් වල රු. මිලියන 2,981.47 ක් ආයෝජනය කර තිබුණි.
(ඇ)	2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 9.6 වගන්තිය	රාජ්‍ය නිලධාරීන් හට තමන් දරන තනතුරු අනුව සහනදායී බලපත්‍ර යටතේ මෝටර් රථ මිලට ගැනීම සඳහා ලබාගත් ණය මුදල්වල ඕළියෙන්, 2/3 ක කොටසක්ද චක්‍රලේඛ නියමයන්ට පටහැනිව නැවත ප්‍රතිපූර්ණය කර තිබුණි. සමාලේචිත වර්ෂයේදී සංස්ථාව එසේ ප්‍රතිපූර්ණය කර තිබුණු පොලිය රු.616,228 ක් විය.
(ඉ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) 3.8 වගන්තිය	ජාතික තරහකාරී මිල ක්‍රමය (NCB) යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී අවම වශයෙන් ලංසු කාලය දින 14 ත් 21 ත් අතර විවෘතව තැබිය යුතු වුවත්, සංස්ථාව සමාලෝචිත වර්ෂයේ සිදු කළ රු. මිලියන 35.70 වටිනා (වැට් බදු රහිත) කොන්ත්‍රාත් ප්‍රසම්පාදන කටයුතු 02 ක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 07 ක් පමණක් ලංසු කරුවන්ට ලබාදී තිබුණි.

(ii) 5.3.19 (ආ) වගන්තිය

ලංසු කරුවන්ට තිබිය යුතු පශ්චාත් සුදුසුකම් නිර්ණායක (Post Qualification criteria) පැහැදිලිව ලංසු ලියවිල්වල ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංස්ථාව රු.මිලියන 244.70 ක් වටිනා Cuter Section Dredger යන්ත්‍රයක් මිලට ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී, ලංසු ලියවිලිවල ඇතුළත් සැපයුම්කරුට තිබිය යුතු පශ්චාත් සුදුසුකම්, ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින්ද තොරව නැවත සංශෝධනය කර තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන කමිටුව සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කිරීමකින් තොරව සංස්ථාව මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කරද තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය** හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  (අ) සංස්ථාව 2010 ජූලි 14 දින නිකුත් කළ අංක 1662/17 දරණ ගැසට් නිවේදනය පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදංචි කරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

  (ආ) ජල ගැලීම් පාලනයට ප්‍රධාන වශයෙන් දායකවන සහ ඉහළ ජෛව විවිධත්වයකින් සමන්විත මුතුරාජවෙල අභය භූමියට ආසන්නව පිහිටි ජා ඇල, දැලතුර "සුහද" මාවතේ පිහිටි හෙක්ටයාර 6 ක පමණ පහත් බිම් ප්‍රදේශය ගොඩ කිරීමට එරෙහිව 2006 අංක 35 දරන සංස්ථා පනතේ 2 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) අංක අමප/19/1643/116/065 හා 2019 ජූලි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රොන්මඩ ඉවත් කිරීම මගින් බේරේ වැව පිරිසිදු කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද

ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 283.50 ක් වුවිද එම අනුමත ඇස්තමේන්තුගත පිරිවැයට වඩා රු. මිලියන 120.49 ක් වැඩියෙන් සංස්ථාව එම යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 02 පමණ ඉඩමක් රාජ්‍ය සමාගමකට රු. මිලියන 272.62 කට විකිණීමේදී ඉඩමේ වර්තමාන තක්සේරුව ලබානොගෙන 2017 වර්ෂයේ වෙනත් ඉඩමක් බදුපදනම් මත ලබා දීමේදී යොදාගත් තක්සේරුව පදනම් කරගෙන ඉඩම විකිණීමෙන් සංස්ථාවට සිදු වූ පාඩුව රු. මිලියන 12.10 ක් පමණ විය. එමෙන්ම මෙම ඉඩම "විකුණම් පදනම් මත" බැහැර කළද, "බදු පදනම් මත" ඉඩම් බැහැර කිරීමේදී පාදක කරගන්නා තක්සේරුවක් මත ඉඩම විකිණීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඇ) සංස්ථාව ඉකුත් වර්ෂයේදී රු. මිලියන 41 වටිනා Long Arum Excavator යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබූ අතර සැපයුම්කරු සංස්ථාව අපේක්ෂා කළ තාක්ෂණික පිරිවිතරවල (Technical Specification) සඳහන් Long Aram Excavator වෙනුවට Short Aram Excavator යන්ත්‍රවලට Long Aram කොටස් සවිකර සාවද්‍ය ලෙස සංස්ථාවට ලබාදී තිබුණු අතර එසේ තිබියදී භාණ්ඩ භාරගෙන සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් සිදුකරද තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සංස්ථාවේ කෙරවලපිටිය කසළ කළමනාකරණ අංගනය වෙත ආයතන 23 ක් බැහැර කරන ලද කසළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතුව පැවැති මුදල රු.මිලියන 238.11 ක් වූ අතර මෙයින් රු.මිලියන 119.9 ක් වර්ෂයකට අඩු කාලයක සිට සහ රු.මිලියන 118.21 ක් වර්ෂ එකත් තුනත් අතර කාලයක සිට නිහව පැවතුණි. සංස්ථාව විසින් අදාළ ආයතන සමඟ කසළ බැහැර කිරීමට අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබීම ණය අයකර ගැනීම් පමාවීමට බලපා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක ව්‍යාපෘති වලින් සංස්ථාවට ලැබිය යුතු මුදල රු. මිලියන 549.81 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වඩා වැඩි ශේෂය රු. මිලියන 71.37 ක් විය. එමෙන්ම විගණනය විසින් කැදවන ලද ණයගැති සනාථයන්ගේ වටිනාකම් රු. මිලියන 872 ක් වූ අතර ඉන් කිසිදු ණය ගැති ශේෂයක් සනාථ කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති රු. මිලියන 265 ක කෙන්ත්‍රාත් ණය හිමි ශේෂ වටිනාකම්න් වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට පැවත එන නිරවුල් නොවූ ණය හිමි ශේෂය රු. මිලියන 48 ක් විය. එමෙන්ම විගණනය විසින් කැඳවන ලද රු. මිලියන 67 ක ණය හිමි ශේෂ සනාථනයන් සඳහා ශේෂ සනාථ කිරීම් කිසිදු ණය හිමියකු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) කැළණිය, බියගම, වත්තල සහ පෑලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ සිදුවන ජල ගැලීම් වලදී එම ප්‍රදේශවල පදිංචි ජනතාවට සහ කර්මාන්තශාලාවලට සිදුවන හානි අවම කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,000 ක් යටතේ ප්‍රදේශයේ ඇති මුදුන් ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සංස්ථාව විසින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 43 ක් 56 ක් විය. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය අවසාන වන විට රු. මිලියන 1,456 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් වැයකර තිබුණු නමුත් 2021 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට අයවැය මඟින් මුදල් වෙන් කර නොතිබුණි. එම නිසා ඉදිරියේදී අදාල අරමුණු ඉටුකර ගැනීමෙන් තොරව මෙම ව්‍යාපෘතිය අත් හිටුවීමට සිදුවිය හැකි බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වෙළඳපලේ පැවති රු. මිලියන 1,453 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් සඳහා පමණක් තරගකාරී ලෙස ලංසු ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු කොන්ත්‍රාත්වක් සංස්ථාව වෙත හිමිකර ගැනීමට අපොහොසත්ව තිබුණි. සංස්ථාව ලංසු සඳහා ඉදිරිපත් කරන මිල ගණන් වෙළඳපල වල පවතින මිල ගණන්වලට වඩා ඉහළ අගයක පැවතීම මෙයට සෘජුව බලපා තිබුණි.

(ඉ) 1996 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය මෙහෙයවීම යටතේ පාර්ලිමේන්තු සංකීර්ණයට බටහිර මායිමේ පිහිටි අක්කර 1000 ක පමණ වූ පහත් බිම් ප්‍රදේශ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ආරක්ෂා කර ගැනීමට සහ පාලනය කිරීමට ඒ පිළිබඳ විශේෂඥ ආයතනය වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට පවරා තිබුණි. එසේ පැවරුණු ඉඩම් වල අනවසර පදිංචිවීම් හා අනවසර ගොඩකිරීම් ඉවත් කිරීමේ සම්පූර්ණ වගකීම (Sole Responsibility) සංස්ථාවට පැවරී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 63 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා තවත් අක්කර 82 ක් සංස්ථාව විසින් අවසතු කරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණු බව නිරීක්ෂණය විය. එසේම සංස්ථාව විසින් ඉකුත් වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම්

1324 ක් හඳුනාගෙන තිබුණු නමුත් එම හඳුනාගත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඊ) වර්තමානයේ සිදුවන අනවසර ඉඩම් ගොඩකිරීම් වලක්වාලීමට සංස්ථා පනතේ පවතින විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් එම වගන්ති නිවැරදි කර පනත සංශෝධනය සඳහා 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම පනතේ පවතින මෙවැනි අඩුපාඩු මත අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාවට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණු අතර සංස්ථාව පවරන ලද බොහොමයක් නඩුවලට ලැබුණු නඩු තීන්දුවලින් සංස්ථාවට අවාසි සහගත තත්ත්වයක්ද උද්ගතව තිබුණි.

(උ) සංස්ථාව විසින් ලංකාවේ පළාත් 6 ක පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ඉඩම් වල මායිම් ගැසට් කර තිබුණද එම ඉඩම් ප්‍රදේශ වල අනවසර ගොඩකිරීම, අනවසර පදිංචිවීම් හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර එම තත්ත්වයන් පරීක්ෂා කිරීම වෙනුවෙන් නිළධාරීන්ද අනුයුක්ත කර නොතිබුණි. මේ හේතුවෙන් අනාගතයේදී විවිධ සමාජයීය හා පාරිසරික ගැටළු වලට සංස්ථාවට සෘජුව මුහුණ දීමට සිදු නොවේ යැයි විගණනයේදී බැහැරකළ නොහැකි විය.

(ඌ) මුහුදු වැලි තොගවල යළි ඇනවුම් මට්ටම් තීරණය කර තොග පාලනයන් නොකිරීම නිසා වැලි තොග හිඟ වූ අවස්ථාවල අවශ්‍ය මුහුදු වැලි ලබා ගැනීමට මුතුරාජවෙල ප්‍රදේශයේ ලංකා විදුලි බල මණ්ඩලය වෙත සංස්ථාව විකුණන ලද ඉඩමකින් රු.මිලියන 351.3 ක වැලි කපා ඉවත් කර තිබුණු නමුත් වර්ෂ 5 කටත් අධික කාලයක සිට එය නැවත පිරවීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙලෙස සංස්ථාව විසින් වැලි ඉවත් කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට නැවත පිරවිය යුතු බිම් ප්‍රමාණය ඝ.මී.ටර් 1,034,846 ක් විය.

(එ) 2013 අගෝස්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වේරස්ගහ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 14,227 ක ණය මුදලක් මහා භාණ්ඩාගාර ඇපකරයක් මත ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2014 ජූලි 14 දින වසර 14 ½ කින් ණය මුදල ආපසු ගෙවීමේ එකඟතාව මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවත් 2017 දෙසැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු. මිලියන 14,227 ක් සඳහා එකඟ වූ ණය ගිවිසුම අහෝසි කර එදිනට ලබාගත් ණය මුදල වන රු. මිලියන 2,550 වෙනුවෙන් නව ණය ගිවිසුම එළඹීමට සහ අදාළ ණය වාරික හා පොලී ගෙවීමට අවශ්‍ය මුදල් හා ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාම සඳහා වන වියදම වාර්ෂික අයවැය මඟින්

ප්‍රතිපාදනය කරීමටද යෝජනා වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 ඔක්තෝබර් 24 දින නිමකිරීමට අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වසර 06 කට අධික කාලයක් ගත වීමෙන් පසුවද ලභා කරගෙන තිබුණු තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් විය. එසේ වුවත් ව්‍යාපෘතියේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් වලක්වා ගෙන කෙටි කාලයක් තුළ ව්‍යාපෘතිය නිම කළ හැකි නව වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් හඳුන්වාදීද නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය විසින් මාස 03 ත් මාස 06 ත් වැනි කෙටි කාලයක් තුල වැඩ අවසන් කල යුතු කොන්ත්‍රාත් වැඩ 18 ක් පැකේජ වශයෙන් උපකොන්ත්‍රාත් කරුවන්ට ලබාදී තිබුණු අතර ඒ සඳහා ලබා දී තිබූ සවලීකරණ (Mobilization) අත්තිකාරම්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.මිලියන89.17 ක් විය. මෙයින් ප්‍රමාද කාලය වසර ඉක්මවූ නොපියවූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 52.16 ක් විය.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුහුදු වැලි සෝදා පැකට් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් පරිපාලිත සමාගම රු. මිලියන 404.40 ක් වැය කර තිබුණු අතර මේ සඳහා සංස්ථාවෙන් රු.මිලියන 200 ක් සියයට 12 ණයක් ලෙසද රු. මිලියන 109 ක් අත්තිකාරම් ලෙස ද ලබාදී තිබුණු අතර ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සංස්ථාවට තවදුරටත් අයවිය යුතු මුදල රු. මිලියන 170.21 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට සමාගමෙන් අයවිය යුතු මුළු මුදල රු.මිලියන 479.21 ක් වූ අතර ඉන් කිසිදු මුදලක් ගෙවීමේ මූල්‍ය ශක්‍යතාවක් සමාගමට නොවුණි. එමෙන්ම මුහුදු වැලි පැකට් සඳහා වෙළඳපළ ඉල්ලුමක් ජනිත නොවීම මත මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළදි අත්හිටුවා තිබුණු අතර ඉදිරියේදි මෙම ණය මුදල් අයකර ගැනීමේ අවධානමක් සංස්ථාවට පවතින බව විගණනයේදි නිරීක්ෂණය විය.

(එ) සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මාදින්නාගොඩ අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂය අවසාන වන විට රු.මිලියන 112 ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළුකාරී තත්ත්වයන් මත ඉදිකිරීම් නවතා තිබුණි. මෙම නිසා ව්‍යාපෘතිය සඳහා දරන ලද උක්ත වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඕ) සංස්ථාව විසින් ඉකුත් වර්ෂයේදි රු.මිලියන 89.87 වියදම් කර ඉදිකරන ලද මුතුරාජවෙල කොම්පෝස්ට් ව්‍යාපෘතියට අයත් ගොඩනැගිල්ලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන ඌන උපයෝජිතව තිබුණි.

(ක) 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,875 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,407 ක් වීමෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 437 ක පුරප්පාඩු හා අතිරික්ත 31 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගම් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් හා එල් ආර් ඩී සී සේවා සමාගමෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්ථාවට බඳවාගත් කාර්ය මණ්ඩලය පිළිවෙලින් 102 ක් සහ 800 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය වෙනුවෙන් සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් වශයෙන් ගෙවන ලද වටිනාකම රු.මිලියන 486.86 ක් විය. තවද උක්ත සඳහන් කාර්ය මණ්ඩලයට අමතරව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් සිය වැඩ බිම්වල කටයුතු සඳහා දිනකට රු.750 ක දීමනාවක් යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සේවකයින් 175 දෙනෙකුගේ සේවයද ලබාගෙන තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත (Projects to be identified) රු. මිලියන 211 ක ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. එමෙන්ම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු. මිලියන 7,473 ක් වටිනා ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කර ද නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව දරන ලද වියදම් රු. මිලියන 89.32 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාළව මුලින් සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 553 ක ප්‍රතිපාදන වෙන්කිරීමට ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ච) සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 563.26 ක සේවාදායක ව්‍යාපෘතියක් වූ කිරිමණ්ඩල මාවත යෝජිත ගංවතුර පාලන සහ ජල සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරා තිබූ පිරිවැය රු. මිලියන 297.63 ක් වූ අතර ලැබූ සමුච්චිත අලාභය රු. මිලියන 108.57 ක් විය. සේවාදායක ආයතනය ගෙවීමට එකඟ වූ මිල ගණන් (BOQ Rate) වලට වඩා කළ වැඩ සඳහා සංස්ථාව වියදම් දැරීම මෙම තත්ත්වයට බලපා තිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂය අවසානයට මුල්‍ය ප්‍රකාශනතුළ ඇතුළත් රු. මිලියන 242.14 ක කෙරිගෙන යන වැඩ 07 ක් වර්ෂ 02 ත් වර්ෂ 03 ත් අතර කාලයක සිට පැවැති අතර මෙම ව්‍යාපෘති, කාලීනව අවසන් කිරීමට සංස්ථාව කටයුතු නොකිරීම තුළින් එම ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රතිලාභ සංස්ථාවට අහිමි වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ සංස්ථාව ක්‍රියාත්මක කළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 කින් ලැබූ සමුච්චිත අලාභය රු. මිලියන 125.84 ක් වූ අතර සංස්ථාවේ ස්ථිර සේවකයින් අක්‍රියව සිටියදී

ශ්‍රමය කුලියට (Manpower Hire) ලබා ගැනීම සහ කොන්ත්‍රාත් කළමණාකරන දුර්වලතා මෙම අලාභදායි තත්ත්වයට සෘජුව හේතු වී තිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ අවසන් කළ යුතු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 620.72 ක් වූ කොන්ත්‍රාත් 09 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. සංස්ථාව කොන්ත්‍රාත් වැඩ නිසි අධීක්ෂණයක් නොකිරීම, උප කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවයන් මෙයට හේතු වී තිබුණි.

(ට) සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 520.74 ක් වටිනා කොන්ත්‍රාත් 03 ක් කර ගෙන යාම සඳහා සේවා දායකගෙන් සවලීයකරණ අත්තිකාරම් (Mobilization advance) ලබාගෙන නොතිබුණු අතර සේවාදායක සමග විධිමත් ගිවිසුමකට හෝ එළඹ නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම කොන්ත්‍රාත් වල කළ වැඩ වටිනාකමින් රු.මිලියන 135.95 ක් සේවාදායකගෙන් ලැබිය යුතුව තිබුණු අතර රු.මිලියන 97.82 ක කළ වැඩ ප්‍රමාණයක් සේවාදායක විසින් තවදුරටත් සහතික කළ යුතුව තිබුණි. එමෙන්ම 2020 වර්ෂය අවසාන වන විටත් උක්ත කොන්ත්‍රාත් වෙනුවෙන් සේවාදායකගෙන් සංස්ථාවට රු. මිලියන 98.43 ක් අය විය යුතුව පැවතුණි.

(ඩ) නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බේරේ වැව බෝට්ටු සේවාව මගින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 3.48 ක අලාභයක් ලබා තිබුණි. මේ සඳහා පිරිවැය රු. මිලියන 40 ක නව බෝට්ටුවක් මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ අතර ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව දරන ලද මුළු පිරිවැය රු. මිලියන 41.02 ක් විය.

(ත) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 04 ක පමණ ඉඩමක් පෞද්ගලික සමාගමකට උප - කල්බදු දීමේදී (Sub lease) අයකළ යුතු උපකල්බදු ගාස්තුව වූ රු.මිලියන 56.60 ක් රු. මිලියන 2 ක් ලෙස ගණනය කර අයකිරීම හේතුවෙන් සංස්ථාවට සිදු වූ පාඩුව රු. මිලියන 54.60 ක් විය. තවද මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සමූහය 2019 රු 000	සමූහය 2018 රු 000	සංස්ථාව 2019 රු 000	සංස්ථාව 2018 රු 000
ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම	1	8,339,384	8,872,736	6,537,657	7,097,374
සෘජු පිරිවැය	2	(6,362,450)	(6,059,016)	(4,714,876)	(4,499,760)
දළ ලාභය		**1,976,934**	**2,813,720**	**1,822,781**	**2,597,614**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	147,623	114,347	100,237	97,069
දළ ලාභය සමඟ වෙනත් ආදායම්		**2,124,557**	**2,928,067**	**1,923,018**	**2,694,683**
පරිපාලන වියදම්		(1,141,960)	(1,131,173)	(970,431)	(969,537)
ක්‍රමක්ෂය වියදම්		(170,546)	(236,840)	(153,554)	(220,463)
ප්‍රවර්ධන වියදම්		(77,664)	(116,423)	(77,124)	(116,108)
වෙනත් මෙහෙයුම් වියදම්		(60,157)	(63,659)	(60,157)	(63,659)
මෙහෙයුම්වලින් ලක් ලාභය	4	**674,230**	**1,379,972**	**661,752**	**1,324,916**
මූල්‍ය පිරිවැය	5	(596,346)	(438,286)	(592,913)	(435,467)
මූල්‍ය ආදායම	6	470,990	552,475	476,910	541,258
විලම්බිත ආදායම ක්ෂය කිරීම	7	206,856	189,584	206,856	189,584
බදු පෙර ලාභය		**755,730**	**1,683,745**	**752,605**	**1,620,291**
බදුකරණය	8	(314,087)	(495,705)	(296,137)	(472,075)
වර්ෂය සඳහා ලාභය		**441,643**	**1,188,040**	**456,468**	**1,148,216**
ආරෝපණය කළ ලාභය:					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		440,387	1,179,432	456,468	1,148,216
පාලනය නොකරන පොළිය		1,256	8,608	-	-
වෙනත් විස්තීර්ණ ආදායම					
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	18	(15,151)	1,556	(18,209)	1,556
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය		212,430	-	212,430	-
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම්		**197,279**	**1,556**	**194,221**	**1,556**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**638,922**	**1,189,596**	**650,689**	**1,149,772**
ආරෝපණය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම :					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		637,054	1,180,988	650,689	1,149,772
පාලනය නොකරන පොලිය		1,868	8,608	-	-

පිටු අංක 83 සිට 97 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		සමූහය		සංස්ථාව	
දෙසැම්බර් 31 වැනි දිනට		**2019**	**2018**	**2019**	**2018**
	සටහන	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත සහ උපකරණ	9	2,887,981	2,760,452	2,424,370	2,671,811
අස්පෘශ්‍ය වත්කම්		4,232	5,031	3,575	4,034
දේපල ආයෝජන	10	2,489,809	1,893,358	2,489,809	1,893,358
අනුබද්ධිත ආයතනවල ආයෝජන	11	-	-	2,000	2,000
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්	14	-	-	203,500	128,250
විලම්බිත බදු වත්කම්		111,422	77,208	78,878	50,603
		5,493,444	**4,736,049**	**5,202,132**	**4,750,056**
ජංගම වත්කම්					
තොගය	12	3,122,019	2,486,950	3,024,762	2,417,199
වෙළඳ හා වෙනත්ලැබිය යුතු මුදල්	13	6,370,966	6,629,355	5,635,272	5,859,322
බදුකරණය		3,422	408	-	-
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්	14	-	-	341,011	78,105
කල්පිරීම් සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්		3,145,992	3,752,965	2,981,475	3,602,876
මුදල් හා මුදල්වලට සමාන දේ	15	706,097	980,606	546,896	795,025
		13,348,496	**13,850,284**	**12,529,416**	**12,752,527**
මුළු වත්කම්		**18,841,940**	**18,586,333**	**17,731,548**	**17,502,583**
සමාකොටස් හා බැරකම්					
ප්‍රාග්ධන හා සංචිත					
දායක ප්‍රාග්ධනය		1,000	1,000	1,000	1,000
ප්‍රාග්ධන සංචිත		13,461	13,461	13,461	13,461
වත්කම් ප්‍රතිස්ථාපන සංචිත		1,471	1,471	-	-
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		229,316	19,646	212,430	-
රඳවාගත් ඉපැයීම්		6,503,306	6,075,922	6,263,585	5,825,326
වෛද්‍ය අරමුදල		69,728	56,909	69,728	56,909
සුළු කොටස් හිමි අයිතිය		71,100	69,232	-	-
මුළු ප්‍රාග්ධන සංචිත		**6,889,382**	**6,237,641**	**6,560,204**	**5,896,696**
ජංගම නොවන බැරකම්					
අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි		200,482	212,363	200,482	212,363
විලම්බිත බදුකරණ බැරකම්		241,132	193,353	241,132	193,353
විලම්බිත ආදායම	16	796,795	863,205	796,795	863,205
පොලියක් දරන ණය සහ ලබා ගැනීම්	17	2,731,046	3,020,891	2,716,057	2,996,781
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	18	412,336	384,580	281,707	264,217
		4,381,791	**4,674,392**	**4,236,173**	**4,529,919**
ජංගම බැරකම්					
පොලියක් දරන ණය සහ ලබා ගැනීම්	17	1,474,442	685,452	1,466,859	678,859
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	19	2,023,016	2,735,424	1,286,905	2,086,510
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්	21	-	-	143,371	104,170
බදුකරණය		89,742	313,585	82,533	287,531
ඉඩම් ගොඩකිරීම් සඳහා වෙන්කිරීම්		557,993	534,805	557,993	534,805
ගෙවිය යුතු ලාභාංශ		910	910	-	-
ලැබූ අත්තිකාරම්	20	3,397,510	3,384,093	3,397,510	3,384,093
බැංකු අයිරා	15	27,154	20,031	-	-
		7,570,767	**7,674,300**	**6,935,171**	**7,075,968**
මුළු බැරකම්		**11,952,558**	**12,348,692**	**11,171,344**	**11,605,887**
මුළු සමාකොටස් සහ බැරකම්		**18,841,940**	**18,586,333**	**17,731,548**	**17,502,583**

පිටු අංක 83 සිට 97 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

අත්සන් කලේ

ජේ.ඒ.පී.කේ. ජයසිංහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

ඉංජි. ශ්‍රීමතී සේනාධීර
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සහ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුමත කර සහ අත්සන් කරන ලද්දේ:

මේජර් ජනරාල් (විශ්‍රාමික) එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා යූඑස්පී පීඑස්සී එම්එස්සී (ආරක්ෂක)
සභාපති

එන්.එච්.එන්.එල්. නවරත්න
අධ්‍යක්ෂ

2020 අගෝස්තු 27

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

විස්තරය	දායක ප්‍රාග්ධනය රු'000	ප්‍රාග්ධන සංචිත රු'000	වත්කම් ප්‍රතිෂ්ඨාපිත සංචිත රු'000	වත්කම් ප්‍රත්‍යාගණන සංචිත රු'000	රඳවාගත් ඉපැයීම් රු'000	වෛද්‍ය අරමුදල රු'000	පාලනය නොකරන පොලිය රු'000	එකතුව රු.000
2018.01.01 දිනට ශේෂය	1,000	13,461	1,471	22,501	4,892,079	44,631	60,624	5,035,767
2018 වර්ෂය සඳහා ලාභය	-	-	-	-	1,179,432	-	8,608	1,188,040
වෛද්‍ය අරමුදලේ වැඩි වීම	-	-	-	-	-	12,278	-	12,278
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය	-	-	-	-	1,556	-	-	1,556
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය				(2,855)	2,855	-	-	-
2019.01.01 දිනට ශේෂය	**1,000**	**13,461**	**1,471**	**19,646**	**6,075,922**	**56,909**	**69,232**	**6,237,641**
2019 වර්ෂය සඳහා ලාභය	-	-	-	-	440,387	-	1,256	441.643
වෛද්‍ය අරමුදලේ වැඩි වීම	-	-	-	-	-	12,819	-	12,819
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය	-	-	-	-	(15,763)	-	612	(15,151)
ප්‍රත්‍යාගණනය කළ වත්කම් බැහැර කිරීම	-	-	-	(2,760)	2,760	-	-	-
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය	-	-	-	212,430	-	-	-	212,430
2019.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**1,471**	**229,316**	**6,503,306**	**69,728**	**71,100**	**6,889,382**

සංස්ථාව

	දායක ප්‍රාග්ධනය රු.000	ප්‍රාග්ධන සංචිත රු.000	වත්කම් ප්‍රතිෂ්ඨාපිත සංචිත	රඳවාගත් ඉපැයීම් රු.000	වෛද්‍ය අරමුදල රු.000	එකතුව රු.000
2018.01.01 දිනට ශේෂය	1,000	13,461	-	4,675,554	44,631	4,734,646
2018 වර්ෂය සඳහා ලාභය	-	-	-	1,148,216	-	1,148,216
වෛද්‍ය අරමුදලේ වැඩි වීම	-	-	-	-	12,278	12,278
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය	-	-	-	1,556	-	1,556
2019.01.01 දිනට ශේෂය	**1,000**	**13,461**	**-**	**5,825,326**	**56,909**	**5,896,696**
2019 වර්ෂය සඳහා ලාභය	-	-	-	456,468	-	456,468
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය	-	-	212,430	-	-	212,430
වෛද්‍ය අරමුදලේ වැඩි වීම	-	-	-	-	12,819	12,819
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය	-	-	-	(18,209)	-	(18,209)
2019.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**212,430**	**6,263,585**	**69,728**	**6,560,204**

පිටු අංක 83 සිට 97 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය	සමූහය		සංස්ථාව	
	2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය)	755,730	1,683,745	752,605	1,620,291
ගැලපීම් ;				
ක්‍රමක්ෂය	371,400	164,038	357,118	143,844
විලම්බිත ආදායම් ක්‍රමක්ෂය කිරීම	(206,857)	(189,584)	(206,857)	(189,584)
අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම්	(74,936)	57,815	(42,688)	41,216
විදේශ විනිමය අලාභ	2,180	15,242	2,180	15,242
විදේශ විනිමය ලාභ	(3,063)	(60,999)	(3,063)	(60,999)
කපා හල බොල් ණය සහ අලාභ	20,994	1,630	-	-
කපා හල හිමිකම් නොපැ රදවාගැනීම්	(7,681)	(206)	(7,681)	(206)
මූල්‍ය පිරිවැය	595,499	437,439	592,066	434,619
මූල්‍ය ආදායම	(470,990)	(552,475)	(476,909)	(541,258)
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලත් ලාභය	(465)	(1,721)	(163)	(1,847)
සෙමින් සංසරණය වන තොග සඳහා වෙන්කිරීම්	(21,724)	(1,041)	(21,724)	(1,041)
වන්දි ගෙවීම් සඳහා වෙන්කිරීම්	847	847	847	847
අර්ථදැක්වූ ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම්	81,269	58,195	45,431	41,093
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**1,042,203**	**1,673,924**	**991,162**	**1,563,861**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්				
තොගය (වැඩිවීම) / අඩුවීම	(613,344)	(1,385,789)	(533,174)	(1,392,646)
ලැබූ අත්තිකාරම් (වැඩිවීම) / අඩුවීම	13,417	336,544	13,415	336,549
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම	330,867	102,349	269,802	368,171
සම්බන්ධිත පාර්ශවවලින් හිඟ මුදල් - වැඩිවීම / (අඩුවීම)	-	-	(233,372)	2,684
සම්බන්ධිත පාර්ශවවලට හිඟ මුදල් - වැඩිවීම / (අඩුවීම)	-	-	39,201	(17,594)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	(622,127)	392,201	(778,599)	306,324
මෙහෙයුම්වලින් ලක් මුදල්	151,016	1,119,229	(231,565)	1,167,349
ගෙවූ ආදායම් බදු	(519,010)	(565,966)	(466,951)	(551,341)
ගෙවූ පාරිතෝෂික	(68,664)	(51,676)	(46,150)	(37,006)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මුදල්	**(436,658)**	**501,587**	**(744,666)**	**579,002**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
දේපල පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	(814,818)	(579,981)	(407,449)	(528,285)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය	606,974	(826,255)	621,401	(806281)
ලැබූ පොළී ආදායම	455,893	545,134	448,349	435,644
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබීම්	4,606	29,521	4,305	2,220
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**252,655**	**(831,581)**	**666,606**	**(896,702)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය				
ගෙවූ පොලිය සහ වන්දි	(15,659)	(2,002)	(15,659)	(2,002)
ලබාගත් ණය	1,470,000	1,036,700	1,470,000	1,030,000
ණය නැවත ගෙවීම	(964,743)	(157,102)	(962,724)	(156,379)
අනුබද්ධිත සමාගම්වලට දුන් ණය	-	-	(81,250)	(118,750)
ණය සඳහා ගෙවූ පොළිය	(580,436)	(431,403)	(580,436)	(431,403)
ගෙවූ කල්බදු වාරික	(6,791)	(7,137)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය	**(97,629)**	**(439,056)**	**(170,069)**	**321,466**
මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම/(අඩුවීම)	(281,632)	109,062	(248,129)	3,766
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	960,575	851,513	795,025	791,259
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 15)	**678,943**	**960,575**	**546,896**	**795,025**

පිටු අංක 83 සිට 97 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංයුක්ත තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වන අතර ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. සංස්ථාව, 1968 අංක 15 දරන පනතින් 1968 වර්ෂයේ සැප්තැම්බර් මස 22 දින සංස්ථාගත කර ඇත.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2019 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනවලට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම් දෙකෙහි (එක්ව ගත්කළ "සමූහය" ලෙසින් හඳුන්වන) ගිණුම්වලින් සමන්විත වේ. සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතනයට දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට හඳුනාගත හැකි කිසිදු මව් සමාගමක් නොමැත. සමූහයෙහි අවසන් මව් සමාගම සංස්ථාව වේ.

1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

ආයතනයේ නම	ව්‍යාපාරවල ස්වභාවය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	අපවහන වැඩි දියුණු කිරීම්, ඉඩම් සංවර්ධනය කිරීම්, නාගරික භූමි අලංකරණ, තෙත් බිම් කළමනාකරණය, අක්-වෙරළ වැලි හැරීම සහ විකිණීම, කසළ කළමනාකරණය, සිවිල් ඉදිකිරීම සහ සම්බන්ධිත ඉංජිනේරු සේවාවන් සැපයීම
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම	සිමෙන්ති ගල් සහ පෙරැදි අයිතම නිෂ්පාදනය කිරීම, අක්-වෙරළ වැලි පැකට් කිරීම සහ අලෙවි කිරීම, සිවිල් ඉදිකිරීම්
LRDC සර්විසස් (පෞද්.) සමාගම	ආරක්ෂක සහ මිනිස්බල සේවා සැපයීම

සංස්ථාවේ පරිපාලිත සමාගම් දෙකම සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සමූහයේ ඒකාබද්ධ ගිණුම්කරණ ප්‍රකාශන සකස් කර ඇත.

2.1.2 අගය කිරීමේ පදනම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

2.1.3 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී මුදල් වර්ගය

සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

2.1.4 අනුකූලවීමේ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත.

2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව සහ එහි පරිපාලිත සමාගම් පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර මෙහෙයුම් ඈවර කිරීමට හෝ අඩු කිරීමට ඔවුන්ගේ අදහසක් නොමැත.

2.1.6 සංයුක්ත තොරතුරු

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත– LKAS 01 ට අනුකූලව සංස්ථාව සහ සමූහය විසින් පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරව යොදාගෙන ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

2.1.7 ද්‍රව්‍ය සමූහනය සහ හිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතයකින් අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් මිස වත්කම් සහ බැරකම්, ආදායම සහ වියදම් හිලව් කිරීම සිදු කරනු නොලැබේ.

එක් එක් අයිතම ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අදාළ වන්නේ නම් පමණක් සමාන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් එක් කර ඉදිරිපත් කරනු ලැබේ.

2.1.8 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වාර්තා කර ඇති ආදායම, වියදම්, වත්කම් සහ බැරකම් වටිනාකම් සහ අනාවරණය කිරීම් සඳහා බලපෑම් ඇති කරනු ලබන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ.

මෙම තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන හේතුවෙන් වත්කම් හා බැරකම්වල පවතින වටිනාකමට සිදුවන කවර හෝ සැලකිය යුතු ගැලපීමක් තදනන්තර මූල්‍ය වර්ෂයේදී සලකා බලනු ලැබේ.

2.2 ඒකාබද්ධ වීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2019 දෙසැම්බර් මස 31 වැනි දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත වේ. අත්පත් කරගත් දින සිට පරිපාලිත සමාගම් ඒකාබද්ධ වන අතර එදින සිට සමූහය විසින් පාලනය ලබා ගන්නා අතර එම පාලනය අවසන් වන දින දක්වා ඒකාබද්ධ වී සිටී.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට.,)

a) පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති ඍජුව පාලනය කිරීම සඳහා සමූහයට බලය පවතින සාමාන්‍යයෙන් ඡන්ද හිමිකමෙන් අඩකට වඩා වැඩි කොටස් හිමිකාරිත්වයක් දරන සියලු ආයතන වේ. සමූහය විසින් වෙනත් ආයතනයක් පාලනය කරනු ලබන්නේද යන්න ඇගයීමේදී, වර්තමානයේදී ක්‍රියාවේ යෙදවිය හැකි හෝ පරිවර්තනය කළ හැකි හව්‍ය ඡන්ද හිමිකාරිත්වයේ පැවතීම සහ බලපෑම සළකා බලනු ලැබේ. පාලනය සමූහයට මාරු කරන ලද දින සිට පරිපාලිත සමාගම් සම්පූර්ණයෙන් ඒකාබද්ධ වේ. එම පාලනය අවසන් වන දිනෙන් ඒවා ඒකාබද්ධතාවයෙන් ඉවත් වේ.

ආයතනයේ නම	ඵලදායී අයිතිය
ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO)	80%
LRDC සර්විසස් (පෞද්.) සමාගම	80%

සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ සහ අලාභ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත. සංස්ථාවේ මෙන්ම එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් සහ බැරකම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත.

b) සුළු කොටස් හිමි අයිතිය

සමූහයේ ශුද්ධ වත්කම්වල පිටස්තර කොටස් හිමියන්ගේ බැඳියාව සහ පිටස්තර කොටස් හිමියන් සඳහා යෙදිය හැකි බදු පසු ලාභයෙහි ප්‍රමාණය "සුළු කොටස් හිමි අයිතිය" යන මාතෘකාව යටතේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සහ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වෙන් වශයෙන් දක්වනු ලැබේ.

c) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු

අන්තර් සමූහ ගනුදෙනුවලින් පැන නඟින සියලු අන්තර් සමූහ ශේෂයන්, ආදායම සහ වියදම සහ උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

2.3 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

2.3.1 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගත් හෝ ඉදිකළ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂයට දක්වනු ලැබේ. එමඟින් අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ආරෝපණය කළ හැකි කවර හෝ පිරිවැයක් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට ඇතුලත් වේ.

ක්ෂයවීම

දේපල, පිරියත සහ උපකරණවල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීව කාලය තුළ සරල රේඛීය පදනමින් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් කර ඇති පරිදි ක්ෂයවීම සපයනු ලැබේ.

කල්බදු ඉඩම්	කල්බදු කාල පරිච්ඡේදය තුළ
ගොඩනැගිලි-ස්ථීර	වර්ෂ 20 තුළ
ගොඩනැගිලි-අර්ධ ස්ථීර	වර්ෂ 10 තුළ
සන්තකයේ ඇති ඉඩම් වල පවතින ව්‍යුහ	වර්ෂ 10 තුළ
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	වර්ෂ 10 තුළ
කාර්යාල උපකරණ	වර්ෂ 08 තුළ
සැහැල්ලු මගී වාහන	වර්ෂ 05 තුළ
පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	
- පස් ඉවත් කිරීමේ සහ හැරීමේ උපකරණ	වර්ෂ 10 තුළ
- ද්‍රව්‍ය හැසිරවීමේ උපකරණ	වර්ෂ 10 තුළ
වෙනත් පිරියත සහ යන්ත්‍රසූත්‍ර	වර්ෂ 4 තුළ
සන්නිවේදන උපකරණ	වර්ෂ 4 තුළ
පාපැදි සහ කුඩා වැඩපොළ උපකරණ	වර්ෂ 2 තුළ
කන්ටේනර් නිවාස	වර්ෂ 10 තුළ

සින්නක්කර ඉඩම්වල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂය කිරීම් සපයා නොමැත.

වත්කමක ක්ෂයවීම, වත්කම භාවිතයට ගැනීම සඳහා පවතින දින සිට ආරම්භ වන අතර වත්කම හඳුනා නොගන්නා දිනෙන් අවසන් වේ.

2.3.2 ආයෝජන දේපල

ආයෝජන දේපලක් යනු කුලී ආදායමක් උපයා ගැනීම සඳහා තබා ගන්නා දේපල වන අතර සාමාන්‍ය ව්‍යාපාරයක ලෙස අළෙවි කිරීමට හෝ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා හෝ භාවිතා කරනු ලබන ඒවා නොවේ. ආයෝජන දේපල අත්පත් කර පිරිවැය සහ තදනන්තර සංවර්ධන පිරිවැයට දක්වනු ලැබේ.

2.3.3 තොගය

යල් පිනු සහ සෙමින් සංසරණය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා වෙන් කිරීමෙන් පසු පිරිවැයට සහ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම අඩු කර තොගය තක්සේරු කරනු ලැබේ. සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික තොගය විකිණිය හැකි මිල ගණන ශුද්ධ උපලබ්ධි වටිනාකම වේ.

තොගය ඒවායේ වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, පහත සඳහන් පිරිවැය සම්කරණය යොදා ගනිමින් ගිණුම්ගත කරනු ලැබේ:-

සාමාන්‍ය තොග	-	FIFO පදනම මත මිලදී ගත් පිරිවැයට
මුහුදු වැලි තොග	-	හැරීමේ පිරිවැය එකතු කිරීම අපතේ යෑම සඳහා ප්‍රතිශතයට

2.3.4 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සිදු කෙරෙමින් පවතින දීර්ඝ කාලීන ව්‍යාපෘති හා සම්බන්ධ සිදු කෙරෙමින් පවතින වැඩ, ද්‍රව්‍ය සහ ශ්‍රමය සමන්විත වන ඍජු පිරිවැයට සහ ව්‍යාපෘති සඳහා ආරෝපණය කළ හැකි ඍජු පොදු කාර්ය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

2.3.5 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ

අගය අඩු වීම සඳහා වෙන් කිරීම් හැර ඉතිරි අගය ලබා ගැනීම සඳහා වෙළඳ ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කරන ලද වටිනාකමට ඒවා හඳුනාගනු ලැබේ. වෙනත් ලැබිය යුතු දෑ සහ සම්බන්ධිත පාර්ශවවලින් හිඟ මුදල් සාධාරණ අගය අඩු කිරීම අගය අඩු වීම සඳහා වෙන් කිරීමට හඳුනාගනු ලැබේ. ඒවායේ නැවත අයකරගත හැකි මට්ටම සලකා බලමින් බොල් සහ අවිනිශ්චිත ණය සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට.,)

2.3.6 මුදල් සහ මුදල් හා සමාන දෑ
දන්නා මුදල් ප්‍රමාණයක් සඳහා කඩිනමින් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනස් වීම සඳහා නොසළකා හැරිය හැකි මට්ටමේ අවදානමක් සහිත අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලීතාවයක් සහිත ආයෝජන මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස අර්ථ දක්වනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍යතාවය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ, අත ඇති මුදල් සහ බැංකු අයිරා හැර REPO සහ භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

2.3.7 රජයේ ප්‍රදාන
දීර්ඝ කාලීන වත්කම් ආකාරයෙන් ලැබෙන රජයේ ප්‍රදාන, විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර ප්‍රාග්ධන ප්‍රවේශය පදනම් කර ගනිමින් වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ආදායමක් ලෙස වාර්ෂිකව හඳුනාගනු ලැබේ.

මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂය තුළ ලැබුනු රජයේ ප්‍රදාන (දීර්ඝ කාලීන වත්කම් හැර) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සම්පූර්ණයෙන් හඳුනාගෙන ඇත. සේවා අංශයේ පිරිවැය ඇතුළුව සම්බන්ධිත පිරිවැය ප්‍රදානයට එරෙහිව සංස්ථාව විසින් වියදමක් ලෙස හඳුනාගැනේ.

රජයේ ප්‍රදානයන් හා සම්බන්ධිත කොන්දේසි සහ අවිනිශ්චිතතා සලකා බලනු ලබන අතර අනාවරණය කරනු ලැබේ.

2.4 බැරකම් සහ වෙන් කිරීම්

2.4.1 බැරකම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක කාලයක් තුළදී හිඟ තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ, වාර්තාකරණ දිනට වර්ෂයකට පසු කිසියම් අවස්ථාවකදී හිඟ වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අයිතම වේ.

2.4.2 ප්‍රතිලාභ බැදීම්

2.4.2.1 අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්- පාරිතෝෂික
LKAS 19- "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශිත ව්‍යාපෘති ඒකක බැර (PUC) ක්‍රමවේදය භාවිතා කරමින් ස්වාධීන ආයුගණකයන් විසින් වාර්ෂිකව ගණනය කරනු ලබන පරිදි අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් බැරකම, අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම වේ. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වන කාල පරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි සම්පූර්ණයෙන් හඳුනාගනු ලැබේ.

කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සේවකයෙකු සඳහා පාරිතෝෂික ගෙවීමේ බැරකම පැන නගින්නේ වර්ෂ පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් වේ.

2.4.2.2 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම
සේවකයන්, අදාල නීති සහ රෙගුලාසි ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ අර්ථ සාධක අරමුදලේ දායකත්වයට සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබයි.

(a) සේවා නියුක්තයන්ගේ අර්ථ සාධක අරමුදල
සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල සඳහා සංස්ථාව 12% කින් සහ සේවකයින් 10% කින්ද දායක වේ.

(b) සේවක භාරකාර අරමුදල
සේවකයන් වෙනුවෙන් සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක දායකත්වයක් දරයි.

2.4.3 බදුකරණය

a) ආදායම් බදු
මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා වෙන් කිරීම් ආදායම සහ වියදමෙහි මූලාවයව මත පදනම් වන අතර 2007 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධිත විධිවිධානවලට අනුකූලව ගණනය කර ඇත.

b) විලම්බිත බදු
මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සඳහා වාර්තාකරණ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් සහ ඒවායේ පවතින වටිනාකම අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්බිත බදු සඳහා වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

වාර්තාකරණ දිනට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවා ඇති බදු අනුපාත (සහ බදු නීති) පදනම් කර ගනිමින්, වත්කම උපලබ්ධි වූ විට හෝ බැරකම නිරවුල් වූ විට විලම්බිත බදු වර්ෂය තුළදී යොදා ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයට අගය කරනු ලැබේ.

2.5 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2.5.1 ආදායම්
කාර්ය සාධන බැඳීම් තෘප්තිමත් වන විට සමාගම ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත්වලින් ලැබෙන ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායකයන් භාවිතා කරනු ලැබේ.

a) භාණ්ඩ විකිණීම්
පොරොන්දු වූ භාණ්ඩ ගනුදෙනුකරුවකුට පැවරීමෙන් කාර්ය සාධන වගකීමක් ඉටු වූ බවට සංස්ථාව තෘප්තිමත් වනවිට භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

b) සේවාවන් සැපයීම
පොරොන්දු වූ සේවාවක් ගනුදෙනුකරුවකුට ලබා දීමෙන් කාර්ය සාධන වගකීමක් ඉටු වූ බවට සංස්ථාව තෘප්තිමත් වනවිට සේවාව ලබා දීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

c) ඉඩම් විකිණීමෙන් ලැබෙන ආදායම
ඉඩම් ටෙන්ඩර් මගින් හෝ වෙනත් ආකාරයකින් විකුණන විට, විකුණුම් ඔප්පුව ක්‍රියාත්මක වූ විට හෝ එසේ නොමැති නම් සියලු ගෙවීම් ලැබී තිබේ නම් සහ විකිණුම් ඔප්පුවකින් විකිණීම සිදු නොකිරීමේ සම්භාවිතාවක් නොමැති නම් විකුණුම් වටිනාකම සාමාන්‍යයෙන් ආදායමට ගනු ලැබේ.

d) ඉදිකිරීම් කොන්ත්‍රාත්
ඒවා ආදායමක් උත්පාදනය කරනු ඇති යැයි සහ විශ්වාසනීයව මැනිය හැකි යැයි යන ප්‍රමාණයට කොන්ත්‍රාත්තුවේදී එකඟ වූ මුල් වටිනාකම එකතු කිරීම කොන්ත්‍රාත් කාර්යයෙහි සිදු වූ කවර හෝ වෙනස්වීමක්, හිමිකම් සහ දිරි දීමනා ඉදිකිරීම් ආදායමට ඇතුලත් වේ.

SLRFS 15 ට අනුකූලව කාර්ය සාධන වගකීම්වල සම්පූර්ණ තෘප්තිභාවය උදෙසා ප්‍රතිදාන ක්‍රමය භාවිතා කරමින් කොන්ත්‍රාත්තුව සිදුකරන කාල සීමාව තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලින් ලැබෙන ආදායම සංස්ථාව හඳුනාගනී. කොන්ත්‍රාත් පිරිවැය සාමාන්‍යයෙන් ඒවා හා සම්බන්ධ කාර්යයන් සිදුකරන ලද ගිණුම්කරණ කාල පරිච්ඡේදයන් තුළ හඳුනාගනු ලබයි.

e) පොලී ආදායම්
පොලී ආදායම් උපචිත පදනම් මත හඳුනාගනු ලැබේ.

f) ලාභාංශ ආදායම්
ලාභාංශ ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම් හඳුනාගනු ලැබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට.,)

g) වෙනත් ආදායම්
වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලැබේ.

2.6 ණය ලබා ගැනීමේ පිරිවැය
එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ලබා ගැනීමේ පිරිවැය වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාල සීමාව තුළ වියදම් කරනු ලැබේ. ණය ගැනීමේ අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ආයතනයක් විසින් දරනු ලබන පොලී සහ වෙනත් වියදම්වලින් සමන්විත වේ.

2.7 අතිවිශේෂ අයිතම
අදාල සියලු විස්තර ගිණුම් සඳහා වන සටහන්වල අනාවරණය කර ඇත.

2.8 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය පසුව සිදු වන සිදු වීම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව සිදු වූන සියලු වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්වල යෝග්‍ය ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සමූහය		සංස්ථාව	
		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
1	**අදායම**				
	ගොඩකිරීම සහ හැරීමේ ආදායම	710,217	546,963	710,217	564,338
	ඉදිකිරීම් ව්‍යාපෘති ආදායම	848,209	877,634	799,972	699,616
	මුහුදුවැලි විකිණීම	1,088,490	1,873,126	1,070,742	1,873,126
	පෝර්ට් සිටි ව්‍යාපෘතිය සඳහා මුහුදු වැලි විකිණීම	-	257,223	-	257,223
	ඉඩම් විකිණීම්	272,622	171,000	272,622	171,000
	ඉඩම් කල්බදු	160,454	158,020	160,454	158,020
	උපදේශන සේවාවන්	38,102	18,672	38,102	18,672
	ඉඩම් නිරවුල් කිරීමේ ආදායම	36,905	26,812	36,905	26,812
	විවේක උද්‍යානය සහ විනෝදාත්මක ප්‍රදේශයෙන් ලත් ආදායම	105,493	129,983	105,493	129,983
	කසළ කළමනාකරණ අංගන ආදායම	460,685	742,287	460,685	742,287
	පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය	765,284	470,541	765,284	470,686
	වෙළඳ දැන්වීම් පුවරුවේ ආදායම	5,938	8,950	5,938	8,950
	කුලී ආදායම	43,407	32,407	42,905	31,837
	සේවා ස්ථානයේ ආදායම	33,977	24,683	33,977	24,683
	තෙත් බිම් කළමනාකරණ ව්‍යාපෘති ආදායම	12,991	-	12,991	-
	කුට්ටි සහ කුඹහ විකිණීම	53,726	57,351	-	-
	ආරක්ෂක සේවාවලින් ලත් ආදායම	1,681,514	1,557,681	-	-
	විවිධ ව්‍යාපෘති ආදායම	-	5,757	-	5,757
		6,318,014	**6,959,090**	**4,516,287**	**5,182,990**
	භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති ආදායම	1,514,163	1,347,990	1,514,163	1,348,728
	වෙරළ් ගහ ව්‍යාපෘතිවලින් ආදායම	1,272,981	1,018,265	1,272,981	1,018,265
		9,105,158	**9,325,345**	**7,303,431**	**7,549,983**
	අඩු කළා; අන්තර් අංශ ආදායම	(765,774)	-	(765,774)	-
		8,339,384	**8,872,736**	**6,537,657**	**7,097,374**
2	**විකුණුම් පිරිවැය**				
	ගොඩකිරීමේ සහ හැරීමේ පිරිවැය	372,310	289,565	508,182	378,995
	ඉදිකිරීම් ව්‍යාපෘති පිරිවැය	812,129	611,097	826,268	519,332
	විකුණූ මුහුදුවැලි පිරිවැය	737,434	883,605	752,711	883,605
	විකුණූ ඉඩම් පිරිවැය	21,021	79,039	21,021	79,039
	විවේක උද්‍යානය සහ විනෝදාත්මක ප්‍රදේශයේ පිරිවැය	73,539	71,726	73,539	71,726
	පිරියත සහ යන්ත්‍රසූත්‍ර අංශයේ පිරිවැය	878,380	568,082	878,380	568,082
	කසළ කළමනාකරණ පිරිවැය	181,955	222,026	181,955	222,026
	සේවා මධ්‍යස්ථානවල පිරිවැය	38,099	28,452	38,099	28,452
	ආරක්ෂක සේවා සැපයීමේ පිරිවැය	1,996,441	1,825,210	-	-
	උපදේශන සේවා පිරිවැය	27,891	8,223	27,891	8,223
	තෙත් බිම් කළමනාකරණ ව්‍යාපෘති පිරිවැය	9,698	-	9,698	-
	විවිධ ව්‍යාපෘති ආදායම	1,707	2,046	1,707	2,046
		5,150,604	**4,589,071**	**3,319,451**	**2,761,526**
	භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා පිරිවැය	1,185,673	1,291,332	1,369,252	1,559,621
	වෙරළ් ගහ ව්‍යාපෘති සඳහා පිරිවැය	788,515	631,222	788,515	631,222
		7,124,792	**6,511,625**	**5,477,218**	**4,952,369**
	අඩු කළා; අන්තර් අංශ ආදායම මත පිරිවැය	(762,342)	-	(762,342)	-
		6,362,450	**6,059,016**	**4,714,876**	**4,499,760**
3	**වෙනත් මෙහෙයුම් ආදායම**				
	දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය	464	3,014	163	1,847
	විනිමය ලාභය	3,063	60,999	3,063	60,999
	බොල් ණය සඳහා වැඩිපුර වෙන්කිරීම්	74,936	-	44,930	-
	සෙමින් සංචරණය වන වෙන්කිරීම්	21,723	1,041	21,723	1,041
	හිමිකම් නොපෑ ශේෂයන් කපා හැරීම	7,476	207	7,476	207
	ඇපකර මුදල් කිරීම	1,497	1,199	,497	1,199
	විවිධ ආදායම	38,464	47,887	21,385	31,776
		147,623	**114,347**	**100,237**	**97,069**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

		සමූහය		සංස්ථාව	
		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
4	**මෙහෙයුම්වලින් ලාභ/(අලාභ)**				
	පහත වියදම් ඇතුළුව සියලු වියදම් අයකිරීමෙන් පසුව ප්‍රකාශයට පත් කර ඇත.,:				
	අධ්‍යක්ෂවරුන්ගේ චේතන	3,405	3,056	3,036	3,529
	විගණකවරුන්ගේ චේතන	3,732	1,150	3,234	950
	අර්ථ දැක්වූ දායකත්ව සැලැස්ම පිරිවැය-EPF සහ ETF	179,666	186,274	161,986	175,497
	අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ පිරිවැය-විශ්‍රාම පාරිතෝෂික	81,269	56,639	45,431	39,538
	විනිමය අලාභ	2,179	15,241	2,179	15,241
	බොල් සහ අවිනිශ්චිත ණය සඳහා වෙන් කිරීම්	(74,936)	57,815	(44,930)	41,216
5	**මූල්‍ය පිරිවැය**				
	බැංකු ණය පොළී	592,066	434,891	592,066	434,620
	අත් පත් කර ගත් ඉඩම් සඳහා වන්දි මත පොළිය	847	847	847	847
	බැංකු අයිරා පොළිය	1,032	135	-	-
	කල්බදු මත මූල්‍ය ගාස්තු	2,401	2,413	-	-
		596,346	**438,286**	**592,913**	**435,467**
6	**මූල්‍ය ආදායම**				
	භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම් (REPO) ආයෝජන මත පොළී ආදායම	34,314	69,124	26,016	62,830
	ස්ථාවර තැන්පතු මත ආයෝජන ආදායම	412,138	446,657	402,236	436,050
	ඇ.ඩොලර් ගිණුමේ පොළී ආදායම	7,382	6,667	7,382	6,667
	සේවක ණය පොළිය	11,918	9,390	11,492	9,086
	සම්බන්ධිත පාර්ශව ණය මත පොළිය	-	-	24,546	5,988
	කල්බදු වාරික මත දඩ පොළිය	5,238	20,637	5,238	20,637
		470,990	**552,475**	**476,910**	**541,258**
7	**විලම්බිත ආදායම ක්‍රමක්ෂය කිරීම**				
	MCUDP යටතේ වන වත්කම් ක්‍රමක්ෂය කිරීම	112,699	130,097	112,699	130,097
	ලුනාව ව්‍යාපෘතිය යටතේ වන වත්කම් ක්‍රමක්ෂය කිරීම	22,020	13,404	22,020	13,404
	කිඹුලාවල ව්‍යාපෘතිය යටතේ වන වත්කම් ක්‍රමක්ෂය කිරීම	1,486	1,553	1,486	1,553
	වේරැස් ගඟ ව්‍යාපෘතිය යටතේ වන වත්කම් ක්‍රමක්ෂය කිරීම	11,322	14,360	11,322	14,360
	භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති ක්‍රමක්ෂය කිරීම	35,091	28,032	35,091	28,032
	ඩ්‍රෙජින් ඉන්ටනැෂනල් ක්‍රමක්ෂය කිරීම	90	90	90	90
	GCFC ව්‍යාපෘතිය ක්‍රමක්ෂය කිරීම	15,716	-	15,716	-
	කෙරවලපිටිය කසල උද්‍යාන වත්කම් ක්‍රමක්ෂය කිරීම	8,432	2,048	8,432	2,048
		206,856	**189,584**	**206,856**	**189,584**
8	**බදුකරණය සඳහා වෙන් කිරීම**				
	ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු සඳහා වෙන්කිරීම් (8.1)	167,809	476,223	150,303	451,512
	පසුගිය වර්ෂ සම්බන්ධයෙන් ඌන/(අතිරික්ත) වෙන්කිරීම්	(73,670)	22,127	(73,670)	22,127
	විලම්බිත බදු වෙන්කිරීම් / (ප්‍රතිවර්ත කිරීම)	19,948	(2,645)	19,504	(1,564)
	ඒකාබද්ධ අරමුදලට විශේෂ අය කිරීම	200,000	-	200,000	-
		314,087	**495,705**	**296,137**	**472,075**
8.1	**ආදායම් බදු**				
	බදු පෙර ලාභය /අලාභය	740,579	1,685,301	734,396	1,621,847
	එකතු කළා: අවසර දිය නොහැකි වියදම්	500,131	434,186	426,625	400,858
		1,240,710	**2,119,487**	**1,161,021**	**2,022,705**
	අඩු කළා: අවසර දිය හැකි වියදම්	(1,129,682)	(971,367)	(1,101,134)	(951,324)
	වෙළඳ ලාභය/(අලාභය)	111,028	1,148,120	59,887	1,071,381
	පොළී ආදායම	488,290	552,679	476,909	541,162
	හිලව් කළ අලාභ	-	-	-	-
	බදු අය කළ හැකි ආදායම/(අලාභය)	**599,318**	**1,700,799**	**536,796**	**1,612,543**
	සඵල බදු අනුපාතිකය	28%	28%	28%	28%
	ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු වෙන්කිරීම්	**167,809**	**476,223**	**150,303**	**451,512**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

9 අ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ (සමූහය)

	පිරිවැය හෝ තක්සේරු කිරීම						ක්‍රමක්ෂය						ශුද්ධ පොත් අගය	
වත්කම් කාණ්ඩය	01.01.2019 දිනට ශේෂය	ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම්	වර්ෂය තුළ එකතු කිරීම්	ගැලපීම්/ මාරු කිරීම්	වර්ෂය තුළ බැහැර කිරීම්	31.12.2019 දිනට ශේෂය	01.01.2019 දිනට ශේෂය	ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම්	වර්ෂය සඳහා ගාස්තුව	ගැලපීම්/ මාරු කිරීම්	බැහැර කිරීම් මත	31.12.2019 දිනට ශේෂය	31.12.2018 දිනට ශේෂය	31.12.2019 දිනට ශේෂය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
පිරිවැයට														
සින්නක්කර ඉඩම්	29,382	-	5,375	-	-	34,757	-	-	-	-	-	-	29,382	34,757
කල්බදු ඉඩම්	10,011	-	-	-	-	10,011	737	-	318	-	-	1,055	9,274	8,956
අයත් ඉඩම්වල පවතින ව්‍යුහයන්	38,607	-	-	-	-	38,607	13,668	-	4,663	-	-	18,331	24,939	20,276
සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි	822,557	-	144,791	-	(1,302)	966,046	192,020	-	43,989	-	(1,302)	234,707	630,537	731,339
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	2,226,028	-	54,853	-	(6,230)	2,274,651	1,213,533	-	205,603	-	(2,178)	1,416,958	1,012,495	857,693
මෝටර් වාහන	448,775	(45,575)	-	(304,460)	(1,000)	97,740	284,848	(258,006)	47,089	(2,070)	(1,000)	70,861	163,927	26,879
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	65,573	-	3,193	-	(945)	67,821	24,698	-	6,020	-	(903)	29,815	40,875	38,006
කාර්යාල උපකරණ	31,518	-	4,095	-	(1,145)	34,468	22,834	-	2,408	-	(1,117)	24,125	8,684	10,343
පරිගණක උපාංග	93,729	-	14,725	-	(1,645)	106,809	53,243	-	15,835	-	(1,641)	67,437	40,486	39,372
ඇදීම් සහ මැනුම් උපකරණ	18,723	-	1,986	-	-	20,709	7,898	-	3,733	-	-	11,631	10,825	9,078
පාංශු විද්‍යාගාර උපකරණ	65,400	-	8,964	-	-	74,364	39,806	-	10,781	-	-	50,587	25,594	23,777
වැඩපොළ උපකරණ	49,665	-	3,032	-	(263)	52,434	44,433	-	4,763	-	(263)	48,933	5,232	3,501
සුබසාධන උපකරණ	4,118	-	187	-	(105)	4,200	2,851	-	487	-	(101)	3,237	1,267	963
කන්ටේනර නිවාස	89,271	-	14,154	-	-	103,425	23,075	-	9,774	-	-	32,849	66,196	70,576
පාපැදි	1,566	-	1,085	-	(44)	2,607	1,224	-	597	-	(44)	1,777	342	830
පැලටි	3,565	-	-	-	-	3,565	3,564	-	-	-	-	3,564	1	1
ඉලෙක්ට්‍රෝනික උපකරණ	2,767	-	8	-	-	2,775	1,589	-	286	-	-	1,875	1,178	900
බෝට්ටු සහ එන්ජින්	38,865	-	47,071	-	(194)	85,742	26,198	-	8,026	-	(194)	34,030	12,667	51,712
ව්‍යායාම් උපකරණ	18,187	-	1,762	-	-	19,949	6,544	-	1,931	-	-	8,475	11,643	11,474
මුළුතැන්ගෙයි උපකරණ	22,123	-	-	-	-	22,123	17,576	-	4,546	-	-	22,122	4,547	1
ආරක්ෂක උපකරණ	2,926	-	752	-	-	3,678	2,900	-	83	-	-	2,983	26	695
තොගය	6,635	-	995	-	(1,090)	6,540	5,612	-	472	-	(1,078)	5,006	1,023	1,534
තක්සේරු කරමින් පවතින														
මෝටර් වාහන	16,100	-	-	302,390	-	318,490	5,274	-	-	-	-	5,274	10,826	313,216
එකතුව	**4,106,091**	**(45,575)**	**307,028**	**(2,070)**	**(13,963)**	**4,351,511**	**1,994,125**	**(258,006)**	**371,404**	**(2,070)**	**(9,821)**	**2,095,632**	**2,111,966**	**2,255,879**
තක්සේරු කරමින් පවතින මෙවලම්													27,539	24,054
සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්													620,947	608,048
													2,760,452	**2,887,981**

9අ.1 2011.12.31 දින වන විට සංස්ථාවට අයත් මෝටර් වාහනවල සාධාරණ වටිනාකම යාන්ත්‍රික ඉංජිනේරුවන්, ප්‍රවාහන කළමනාකරු, විගණන නිලධාරි, ගණකාධිකාරි සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්වාධීන තක්සේරුකරුවෙකුගෙන් සමන්විත කමිටුවක් විසින් වෙළඳපොළ පදනම් කරගත් සාක්ෂි මත ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කිරීමෙන් නිශ්චය කරන ලදී. එය බලාත්මක වන 2019.12.31 වැනි දින සිට එවැනි ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. ප්‍රත්‍යාගණනය කිරීමෙන් පැන නගින ලද අතිරික්තයෙන් විලම්බිත බදු අඩු කර ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරන ලදී..

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

9 ආ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ (සංස්ථාව)

		පිරිවැය හෝ තක්සේරු කිරීම					ක්‍රමක්ෂය						ශුද්ධ පොත් අගය	
වත්කම් කාණ්ඩය	**01.01.2019 දිනට ශේෂය**	**ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම්**	**වර්ෂය තුළ එකතු කිරීම්**	**ගැලපීම්/ මාරු කිරීම්**	**වර්ෂය තුළ බැහැර කිරීම්**	**31.12.2019 දිනට ශේෂය**	**01.01.2019 දිනට ශේෂය**	**ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම්**	**වර්ෂය සඳහා ගාස්තුව**	**ගැලපීම්/ මාරු කිරීම්**	**බැහැර කිරීම් මත**	**31.12.2019 දිනට ශේෂය**	**31.12.2018 දිනට ශේෂය**	**31.12.2019 දිනට ශේෂය**
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
පිරිවැයට														
සින්නක්කර ඉඩම්	8,172	-	-	-	-	8,172	-	-	-	-	-	-	8,172	8,172
කල්බදු ඉඩම්	10,011	-	-	-	-	10,011	737	-	318	-	-	1,055	9,274	8,956
අයත් ඉඩම්වල පවතින ව්‍යුහයන්	38,607	-	-	-	-	38,607	13,668	-	4,663	-	-	18,331	24,939	20,276
සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි	807,095	-	130,723	-	(1,302)	936,516	185,056	-	41,354	-	(1,302)	225,108	622,039	711,408
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	2,215,776	-	9,326	-	(6,230)	2,218,872	1,205,129	-	198,079	-	(2,178)	1,401,030	1,010,647	817,842
මෝටර් වාහන	399,384	(45,575)	-	(304,460)	-	49,349	267,828	(258,006)	31,226	(2,070)	-	38,978	131,556	10,371
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	59,696	-	2,676	-	(945)	61,427	22,279	-	5,497	-	(903)	26,873	37,417	34,554
කාර්යාල උපකරණ	18,726	-	1,212	-	(1,138)	18,800	13,421	-	1,775	-	(1,110)	14,086	5,305	4,714
පරිගණක උපාංග	84,831	-	13,618	-	(1,645)	96,804	49,927	-	14,816	-	(1,641)	63,102	34,904	33,702
ඇදීම් සහ මැනුම් උපකරණ	18,723	-	1,986	-	-	20,709	7,898	-	3,733	-	-	11,631	10,825	9,078
පාංශු විද්‍යාගාර උපකරණ	65,400	-	8,964	-	-	74,364	39,806	-	10,781	-	-	50,587	25,594	23,777
වැඩපොළ උපකරණ	49,665	-	3,032	-	(263)	52,434	44,433	-	4,763	-	(263)	48,933	5,232	3,501
සුබසාධන උපකරණ	4,118	-	187	-	(105)	4,200	2,851	-	487	-	(101)	3,237	1,267	963
කන්ටේනර නිවාස	89,271	-	14,154	-	-	103,425	23,075	-	9,774	-	-	32,849	66,196	70,576
පාපැදි	1,566	-	1,085	-	(44)	2,607	1,224	-	597	-	(44)	1,777	342	830
බෝට්ටු සහ එන්ජින්	38,865	-	47,071	-	(194)	85,742	26,199	-	8,026	-	(194)	34,031	12,666	51,711
ව්‍යායාම උපකරණ	18,187	-	1,762	-	-	19,949	6,544	-	1,931	-	-	8,475	11,643	11,474
මුළුතැන්ගෙයි උපකරණ	22,123	-	-	-	-	22,123	17,576	-	4,546	-	-	22,122	4,547	1
ආරක්ෂක උපකරණ	2,874	-	-	-	-	2,874	2,874	-	-	-	-	2,874	-	-
තොගය	6,635	-	995	-	(1,090)	6,540	5,612	-	472	-	(1,078)	5,006	1,023	1,534
තක්සේරු කරමින් පවතින														
මෝටර් වාහන	-	-	-	302,390	-	302,390	-	-	-	-	-	-	-	302,390
එකතුව	**3,959,725**	**(45,575)**	**236,791**	**(2,070)**	**(12,956)**	**4,135,915**	**1,936,137**	**(258,006)**	**342,838**	**(2,070)**	**(8,814)**	**2,010,085**	**2,023,588**	**2,125,830**
තක්සේරු කරමින් පවතින මෙවලම්													27,276	19,681
සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්													620,947	278,859
													2,671,811	**2,424,370**

9ආ.1 2011.12.31 දින වනවිට සංස්ථාවට අයත් මෝටර් වාහනවල සාධාරණ වටිනාකම යාන්ත්‍රික ඉංජිනේරුවන්, ප්‍රවාහන කළමනාකරු, විගණන නිලධාරි, ගණකාධිකාරි සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්වාධීන තක්සේරුකරුවෙකුගෙන් සමන්විත කමිටුවක් විසින් වෙළඳපොළ පදනම් කරගත් සාක්ෂි මත ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කිරීමෙන් නිශ්චය කරන ලදී. එය බලාත්මක වන 2019.12.31 වැනි දින සිට එවැනි ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. ප්‍රත්‍යාගණනය කිරීමෙන් පැන නගින ලද අතිරික්තයෙන් විලම්බිත බදු අඩු කර ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරන ලදී

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

		සමූහය		සංස්ථාව	
		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
10	**ආයෝජන දේපල**				
	වර්ෂය ආරම්භයේදී ශේෂය	1,893,358	1,361,098	1,893,358	1,361,098
	ඉන්වෙන්ටරිවලින්/(වලට) මාරු කිරීම්	596,451	532,260	596,451	532,260
	වර්ෂය අවසානයේදී ශේෂය	**2,489,809**	**1,893,358**	**2,489,809**	**1,893,358**

10.1 ආයෝජන දේපල සඳහා සංස්ථාව ගිණුම්කරණ පිරිවැය ආකෘතිය යොදා ගනු ලැබේ.

10.2 2019.12.31 දිනට සංස්ථාව සතුව පවතින ආයෝජන දේපලවල විස්තර පහත පරිදි වේ.

දේපල	ප්‍රමාණය			පිරිවැය රු.000	ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම රු.000
මුතුරාජවෙල පිහිටි ඉඩම	352A	3R	34.22P	1,937,724	18,372,476
ලේක් ඩ්‍රයිව් ඉඩම	1A	0R	12P	3,081	**
වෙදමුල්ල පිහිටි ඉඩම	14A	3R	73.99P	139,994	928,046
අම්බලන්ගොඩ පිහිටි ඉඩම	13A	3R	30.6P	22,640	278,825
කිරිමණ්ඩල මාවත ඉඩම	17A	8R	128.01P	169,152	17,424,055
අත්තිඩිය පිහිටි ඉඩම	3A	6R	56.64P	3,585	408,296
නාරාහේන්පිට ආදර්ශ ගොවිපොළ ඉඩම	1A	1R	39.5P	5,326	1,317,250
මුදුන් ඇළ ඉඩම	139A	3R	39.14P	38,425	223,455
කෝට්ටේ වැනි මාවත ඉඩම 9	5A	3R	29.09P	14,685	640,803
රාගම පිහිටි ඉඩම	51A	1R	33P	155,197	**
එකතුව				**2,489,809**	

ඉහත ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම් ප්‍රධාන තක්සේරුකරු විසින් ප්‍රදේශයේ ඉඩම් පිළිබඳව සිදු කර ඇති තක්සේරු කිරීමට අනුව තීරණය කර ඇත.
** රාගම ඉඩම සහ ලේක් ඩ්‍රයිව් ඉඩම සඳහා තක්සේරු කිරීම් නොමැත.

		සමූහය		සංස්ථාව	
		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
11	**අනුබද්ධිත සමාගම්වල ආයෝජන**				
	ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සමාගම	-	-	2,000	2,000

11.1 සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සතු වේ.

12	**තොගය**				
	පොදු තොගය	316,072	345,191	280,690	321,972
	මුහුදු වැලි තොගය	1,323,335	-	1,323,335	-
	විකිණීම සඳහා ඇති ඉඩම්	261,976	363,794	261,976	363,794
	කෙරෙමින් පවතින වැඩ - ස්වයං ව්‍යාපෘති	1,170,108	1,529,927	1,148,241	1,529,927
	කෙරෙමින් පවතින වැඩ - සේවාදායක ඉදිකිරීම් ව්‍යාපෘති	103,436	322,671	63,428	276,139
		3,174,927	**2,561,583**	**3,077,670**	**2,491,832**
	සෙමින් සංසරණය වන තොග සඳහා වෙන් කිරීම්	(52,908)	(74,633)	(52,908)	(74,633)
	මුහුදු වැලි තොගය	**3,122,019**	**2,486,950**	**3,024,762**	**2,417,199**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

		සමූහය		සංස්ථාව	
		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
13	**වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ**				
	වෙළඳ ණයගැතියන්	1,762,250	1,984,818	1,131,294	1,304,554
	භාණ්ඩාගාර අරමුදල් ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු	1,513,890	1,248,728	1,513,890	1,248,728
	වේරැස් ගහ ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු	2,406,577	2,780,210	2,406,577	2,780,210
	කොන්ත්‍රාක්කරුවන්ට ගෙවූ සේවයේ යෙදවීමේ අත්තිකාරම්	246,878	285,598	220,395	269,326
	කාර්ය මණ්ඩල ණයගැතියන්	327,520	300,803	309,378	293,011
	සුදු නෙළුම්පුර නිවාස සංකීර්ණයෙන් ලැබිය යුතු වාරික	26,332	24,149	26,332	24,149
	වෙනත් ණය ගැතියන්	320,806	368,258	232,116	252,341
	තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම්	187,108	129,664	179,336	113,739
		6,791,361	**7,122,228**	**6,019,318**	**6,286,058**
	බොල් සහ අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම්	(420,395)	(492,873)	(384,046)	(426,736)
		6,370,966	**6,629,355**	**5,635,272**	**5,859,322**
14	**සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් (ජංගම)**				
	REDECO වෙත ලබා දුන් සඳහා තාවකාලික ණය (14.1)	-	-	22,557	15,196
	REDECO සඳහා කෙටි කාලීන ණය (14.2)	-		25,397	3,224
	REDECO වෙතින් ලැබිය යුතු වෙනත්	-	-	287,622	57,907
	LRDC සර්විසස් (පෞද්.) සමාගම	-	-	5,435	1,778
		-	-	**341,011**	**78,105**
	සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් (ජංගම නොවන)				
	REDECO වෙත ලබා දුන් සඳහා තාවකාලික ණය (14.1)	-	-	3,500	9,500
	REDECO සඳහා කෙටි කාලීන ණය (14.2)	-	-	200,000	118,750
		-	-	**203,500**	**128,250**

14.1 සංස්ථාව විසින් 2017 වර්ෂයේදී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමට (REDECO) 13% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 25 ක තාවකාලිකව ණයක් ලබා දී ඇත. පසුව පොලී අනුපාතය 2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 11.5% දක්වා අඩු කරන ලදී. 2017.04.21 දින සිට ආරම්භ කර මසකට රු.500,000/- ක+- සමාන වාරික 50 කින් ණය ආපසු ගෙවිය හැකිය.

14.2 මුහුදු වැලි ඇසිරීමේ සහ විකිණීමේ ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීම සඳහා සංස්ථාව 12% ක වාර්ෂික පොලී අනුපාතයකට ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සමාගමට (REDECO) රු.මිලියන 200ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා දී ඇත. ප්‍රාග්ධන මුදල ආපසු ගෙවීම සඳහා වසර 2 ක සහන කාලයක් සහිතව මෙම ණය මුදල වසර 12 කින් ආපසු ගෙවිය හැකිය. මසකට රු.1,666,666.67 බැගින් වූ සමාන වාරික 120 කින් ණය මුදල ආපසු ගෙවිය හැක.

		2019 රු.000	2018 රු.000	2019 රු.000	2018 රු.000
15	**මුදල් සහ මුදල් හා සමාන දේ**				
	බැංකුවේ ඇති මුදල්	677,181	698,618	531,241	657,555
	අතේ ඇති මුදල්	11,392	7,003	2,022	2,496
	භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම් (REPO) ආයෝජන	-	126,467		126,467
	රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	9,039	8,507	9,039	8,507
	ආන්තික තැන්පතු ගිණුම්	4,594	-	4,594	-
	සංසරණයේ පවතින මුදල්	3,891	140,011	-	-
		706,097	980,606	546,896	795,025
	බැංකු අයිරා	(27,154)	(20,031)	-	-
	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ	**678,943**	**960,575**	**546,896**	**795,025**
16	**විලම්බිත ආදායම**				
	විලම්බිත ආදායම (GCFC&EIP)	93,587	109,303	93,587	109,303
	විලම්බිත ආදායම (LEI&EIP)	46,258	68,278	46,258	68,278
	විලම්බිත ආදායම (ලෝක බැංකුව)	417,360	521,923	417,360	521,923
	විලම්බිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන	81,974	111,440	81,974	111,440
	විලම්බිත ආදායම භාණ්ඩාගාර ප්‍රදාන - කිඹුලාවල	7,175	8,661	7,175	8,661
	විලම්බිත ආදායම වේරැස් ගහ ව්‍යාපෘතිය	11,841	20,408	11,841	20,408
	විලම්බිත ආදායම කෙරවලපිටිය කසල අංගනය	138,600	23,192	138,600	23,192
		796,795	**863,205**	**796,795**	**863,205**

16.1 රජය විසින් පවරා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දිගුකාලීන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් මඟින් විලම්බිත ආදායම නියෝජනය වේ. ශේෂ පත්‍රයේ දිනට අනුව මෙම ප්‍රදාන සඳහා සම්පූර්ණ නොකළ කොන්දේසි හෝ වෙනත් අවිනිශ්චිතතාවයන් නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

17 පොලියක් දරන ණය සහ ලබා ගැනීම්

17අ	සමූහය	2019 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල	2019 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු මුදල	2019 එකතුව	2018 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල	2018 1 වන වර්ෂයෙන් පසුව ගෙවිය යුතු මුදල	2018 එකතුව
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
	මූල්ය කල්බදු (17A.1)	6,243	11,415	17,658	6,593	17,856	24,449
	බැංකු ණය (17A.2)	1,468,199	2,719,631	4,187,830	678,859	3,003,035	3,681,894
		1,474,442	**2,731,046**	**4,205,488**	**685,452**	**3,020,891**	**3,706,343**

17.අ.1	මූල්ය කල්බදු	31.12.2018 දිනට රු.000	නව කල්බදු රු.000	ආපසු ගෙවීම් රු.000	31.12.2019 දිනට රු.000	31.12.2019 දිනට ජංගම රු.000	31.12.2019 දිනට ජංගම නොවන රු.000
	දළ බැරකම	29,956	-	9,642	20,314	6,973	13,341
	අනාගත කාල පරිච්ඡේද සඳහා වෙන්කළ මූල්ය ගාස්තු	(5,507)	-	(2,851)	(2,656)	(730)	(1,926)
	ශුද්ධ බැරකම	**24,449**	**-**	**6,791**	**17,658**	**6,243**	**11,415**

17.අ.2	බැංකු ණය	31.12.2018 දිනට රු.000	ලබා ගත් ණය රු.000	ප්‍රාග්ධනීකරණ පොලිය රු.000	ආපසු ගෙවීම් රු.000	31.12.2019 දිනට රු.000
	(NSB) කෙටි කාලීන ණය	2,668,590	-	-	266,859	2,401,731
	(BOC) කෙටි කාලීන ණය	1,007,050	1,470,000	-	695,865	1,781,185
	(BOC-REDECO) කෙටි කාලීන ණය	6,254	-	679	2,019	4,914
		3,681,894	**1,470,000**	**679**	**964,743**	**4,187,830**

17අ.2.1 සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) ඩබල් කැබ් රථ දෙකක් මිලදී ගැනීම සඳහා ලංකා බැංකුවෙන් 6,700,000/- ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගත්තේය. 2018.08.29 දින සිට ආරම්භ කර මසකට රු. 111,667/- බැගින් වූ සමාන වාරික 50 කින් ණය මුදල ආපසු ගෙවිය හැක. අදාළ පොලී අනුපාතය මාසිකව 12.65% කි.

17ආ	සංස්ථාව	2019 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල	2019 1 වන වර්ෂයෙන් පසුව ගෙවිය යුතු මුදල	2019 එකතුව	2018 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල	2018 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු මුදල	2018 එකතුව
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
	බැංකු ණය (17B.1)	1,466,859	2,716,057	4,182,916	678,859	2,996,781	3,675,640
		1,466,859	**2,716,057**	**4,182,916**	**678,859**	**2,996,781**	**3,675,640**

17ආ.1	බැංකු ණය	2018.12.31 දිනට රු.000	ලබා ගත් ණය රු.000	ප්‍රාග්ධනීකරණ පොලිය රු.000	නැවත ගෙවීම් රු.000	2019.12.31 දිනට රු.000
	කෙටි කාලීන ණය (NSB) (17 B.1.1)	2,668,590	-	-	266,859	**2,401,731**
	කෙටි කාලීන ණය (BOC) (17 B.1.2)	1,007,050	1,470,000	-	695,865	**1,781,185**
		3,675,640	**1,470,000**	**-**	**962,724**	**4,182,916**

17ආ.1.1 වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අරමුදල් සැපයීම සඳහා සංස්ථාව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.මි.14,227ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගන්නා ලදී. 2017 දෙසැම්බර් 31 වැනි දිනට එම ණය මුදලින් භාවිතා කර ඇති මුදල රු.මි. 2,802කි. බැංකුව සමඟ ඇති කරගත් මුල් එකඟතාවය අනුව 2016.10.23 දින සිට රු.මි. 593ක් වූ ද්වි වාර්ෂික වාරික 24කින් ණය මුදල ආපසු ගෙවිය යුතු වේ. මෙම ණය පහසුකමෙන් තවදුරටත් ණය ලබා ගැනීමට සංස්ථාව අදහස් නොකරන බැවින් ණය පහසුකම රු.මිලියන 2,802කට සීමා කරමින් 2018 වර්ෂයේදී මෙම ණය නැවත සකස් කරන ලදී. නැවත සකස් කරන ලද ණය ගිවිසුමට අනුව, 2018.10.24 දින සිට රු.133,429,531.80 ක් බැගින් වූ ද්වි වාර්ෂික වාරික 21කින් ණය මුදල ආපසු ගෙවිය යුතු වේ. මෙම ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද රු.මිලියන 3,500ක භාණ්ඩාගාර ඇපකරකින් සුරක්ෂිත කර ඇත. මෙම ණය මුදල සඳහා අදාල පොළිය මාස හයක AWPLR + 2.5% වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

17ආ.1.1 කෙරවලපිටිය ගොඩකිරීම් කාර්යයන් සහ තොග සංචිත කිරීම සඳහා අක්-වෙරළ මුහුදු වැලි ඝන මීටර් 4,000,000 ක් කැණීම සහ පොම්ප කිරීම සඳහා මුදල් යෙදවීමට සංස්ථාව විසින් ලංකා බැංකුවෙන් රු.මිලියන 4,000 ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගත්තේය. මෙයින් 2019 දෙසැම්බර් 31 දිනට ලබා ගෙන ඇති මුදල රු.මිලියන 1,030 කි. ණය මුදල මාස 36 කින් ආපසු ගෙවිය යුතු වන අතර සහන කාලය මාස 06කි. අදාළ පොලිය මාසිකව AWPLR + 2.5% වේ. මෙම පහසුකම සඳහා ලබා දී ඇති සුරක්ෂණ සටහන් අංක 23 හි දක්වා ඇත.

.

18 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

	සමූහය		සංස්ථාව	
	2019	**2018**	**2019**	**2018**
	රු 000	**රු 000**	**රු 000**	**රු 000**
වර්ෂය ආරම්භයේදී	384,580	379,617	264,217	261,685
වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම් (18.1)	96,420	56,639	63,640	39,538
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(68,664)	(51,676)	(46,150)	(37,006)
වර්ෂය අවසානයේදී	**412,336**	**384,580**	**281,707**	**264,217**
18.1 වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම්				
වර්තමාන සේවා පිරිවැය	37,722	30,717	15,046	13,616
පොලී පිරිවැය	43,547	27,478	30,385	27,478
	81,269	58,195	45,431	41,094
ශුද්ධ ආයුගණක (ලාභය)/ අලාභය	15,151	(1,556)	18,209	(1,556)
වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම්	**96,420**	**56,639**	**63,640**	**39,538**

18.2 පාරිතෝෂික වෙන් කිරීමේ ආයුගණක තක්සේරු කිරීම් සඳහා යොදා ගත් උපකල්පන

i). මරණ අනුපාතිකය

සේවය යෙදී සිටියදී: ලන්ඩන්හි ආයුගණක ආයතනය විසින් නිකුත් කර ලද A67/70 මරණ අනුපාත වගුව. මෙම වගුවෙහි දක්වා ඇති අගයන් මහින් දී ඇති කවර හෝ වයසක එක් වර්ෂයකදී සිදු විය හැකි මරණවල සම්භාවිතාවන් නියෝජනය වේ.

ii). කාර්ය මණ්ඩල පිරිවැටුම

මෙම තක්සේරු කිරීමේදී යොදා ගන්නා කාර්ය මණ්ඩල පිරිවැටුම් අගයන් සංස්ථාවේ කාර්ය මණ්ඩල පිරිවැටුම් සංඛ්‍යාලේඛන මත පදනම් වේ.

iii). විශ්‍රාම ගැන්වීමේ වයස

සංස්ථාව විසින් දක්වා ඇති පරිදි වර්ෂ 60කි. සඳහන් කර ඇති විශ්‍රාම ගැන්වීමේ වයසට වඩා වයසින් වැඩි සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයන්හිදී විශ්‍රාම යනු ඇතැයි උපකල්පනය කර ඇත.

iv). වට්ටම් අනුපාතය

වර්ෂයක් සඳහා 9.50%ක වට්ටම් අනුපාතයක් ආයුගණකයින් විසින් භාවිතා කරනු ලැබේ.

v). වැටුප් වැඩි කිරීම්

තක්සේරුකරුවන් විසින් මීළඟ වැටුප් වර්ධකය ලැබිය යුතු දින සමඟ මූලික වැටුප, වැටුප් පරිමාණ සංශෝධන සහ ජීවන වියදම් දීමනා (COLA) සංශෝධන භාවිතා කරනු ලැබේ.

මූලික වැටුප : වර්ෂයකට 0.00%,
වැටුප් පරිමාණය සංශෝධනය කිරීම : 2021 සිදු කිරීමට නියමිත මීළඟ වැටුප් සංශෝධනය සමඟ වර්ෂ තුනකට වතාවක් 20.00%ක සහ සේවක ශ්‍රේණියේ උසස්වීම් හේතුවෙන් වර්ෂ 6කට වරක් 25.00% ක වැඩිවීමක්.
COLA : 2019 ලැබීමට නියමිත මීලඟ වැටුප් වර්ධකය සමඟ වාර්ෂිකව 10.00%

18.3 ආයුගණක තක්සේරු සඳහා යොදා ගත් උපකල්පනවල සංවේදීතාවය

සේවක ප්‍රතිලාභ බැරකම් ඇගයීමේදී ස්ථාවරව පවත්වා ගත් අනෙකුත් සියලු විචල්‍යයන් සමඟ ඒ සඳහා යොදා ගත් ප්‍රධාන උපකල්පනවල සිදු විය හැකි වෙනස්කම් සඳහා සංවේදීතාවය පහත වගුවෙහි දක්වා ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංවේදීතාවය යනු වර්ෂය සඳහා සේවක ප්‍රතිලාභ බැඳීම් මත වට්ටම් අනුපාතය සහ වැටුප් වර්ධක අනුපාතයන්හි උපකල්පිත වෙනස්කම්වල බලපෑම් වේ.

වට්ටම් අනුපාතයේ වැඩිවීම්/ (අඩුවීම්	**වැටුප් වැඩිවීමේ අනුපාතයේ වැඩිවීම්/(අඩුවීම්)**	**සේවක ප්‍රතිලාභ බැඳීම් මත බලපෑම්**	
		සංස්ථාව	
		2019	**2018**
		රු.000	**රු.000**
+1%	*	264,963	250,809
-1%	*	300,831	279,345
*	+1%	289,003	270,117
*	-1%	275,382	259,036

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

18.4 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම, සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්.) සමාගම මඟින් සිදු කරන ලද ආයුගණක තක්සේරු මත පදනම් වේ. LKAS 19 මඟින් නිර්දේශ කර ඇති පරිදි විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම් තීරණය කිරීම සඳහා ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය සංස්ථාව විසින් යොදා ගෙන ඇත.

18.5 සංස්ථාව, පාරිතෝෂික වගකීමට බාහිරව අරමුදල් සපයා නොමැත. කෙසේවෙතත්, අනාගත පාරිතෝෂික ගෙවීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ස්ථාවර තැන්පතු ආයෝජන පවත්වාගෙන යනු ලැබේ.

		සමූහය		සංස්ථාව	
		2019	2018	2019	2018
		රු.000	රු.000	රු.000	රු.000
19	**වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ**				
	වෙළඳ ණය හිමියන්	63,192	210,553	31,011	180,056
	කොන්ත්‍රාත් ණය හිමියන්	732,489	1,420,887	718,871	1,389,747
	උපචිත වියදම් ඇතුළු විවිධ ණයහිමියන්	1,024,809	938,176	365,177	342,676
	විවිධ තැන්පතු සහ ආරක්ෂක තැන්පතු	121,942	95,535	91,262	95,510
	දීර්ඝ කාලීන ණය සඳහා ගෙවිය යුතු පොළිය	80,584	70,273	80,584	78,521
		2,023,016	**2,735,424**	**1,286,905**	**2,086,510**
20	**ලැබුණු අත්තිකාරම්**				
	කල්බදු ඉඩම් සඳහා ලැබුණු අත්තිකාරම්	2,450,078	2,282,012	2,450,078	2,282,012
	ඉඩම් විකිණීමේ අත්තිකාරම්	493,657	493,175	493,657	493,175
	ලැබුණු සේවයේ යෙදවීමේ අත්තිකාරම්	385,230	413,814	385,230	413,814
	ලැබුණු වෙනත් අත්තිකාරම්	68,545	195,092	68,545	195,092
		3,397,510	**3,384,093**	**3,397,510**	**3,384,093**
21	**සම්බන්ධිත පාර්ශවයන්ට හිඟ**				
	ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව	-	-	49,342	32,564
	LRDC සේවා (පෞද්.) සමාගම	-	-	94,029	71,606
		-	**-**	**143,371**	**104,170**

22 . සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු/ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැදියාව

22.1 ඉඩම් ගොඩකිරීමේ හා සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) සංස්ථාවේ අනුබද්ධ සමාගමකි. රොෂාන් ගුණවර්ධන මහතා (2019.11.15 දක්වා), මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එම්.ආර්.ඩබ්ලිබ්. ද සොයිසා මහතා USP psc MSc (Defence)(2019.12.01 සිට) සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් වන අතර සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරුන් වන කේ. රාජපක්ෂ මහතා (2019.12.04 දක්වා) සහ එම්.ඒ.එස්.එම්.කේ.සේනාධීර මහතා, (2020.01.21 සිට) REDECO හිද අධ්‍යක්ෂවරුන් වේ.

2019 වර්ෂය තුළදී REDECO සමඟ සංස්ථාවට පහත සඳහන් ගනුදෙනු තිබුණි.

- රු. 11,016,746/44 (2018 - රු. 9,309,207/61) ක වටිනාකමකට සිමෙන්ති බ්ලොක් සහ කොන්ක්‍රීට් නිෂ්පාදන මිලදී ගැනීම
- රු. 85,491,706/55 (2018 - 60,936,629/80) ක ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීම
- කාර්යාල ගොඩනැගිල්ල සහ කිරිමණ්ඩල මාවතේ පිහිටි ඉඩම් කැබලි දෙකක් කුලියට දීම. 2019 වර්ෂය සඳහා ලැබුණු ලීසිං කුලිය රු. 600,000/- (2018 - රු.600,000/-)
- ප්‍රදානය කරන ලද ණය සඳහා පොලිය රු.24,545,648/- (2017: රු.5,988,699/-)
- සංස්ථාව විසින් REDECO හි සේවකයන් කුලී පදනමින් සේවයේ යොදවනු ලබන අතර වර්ෂය තුළදී පහත සඳහන් මුදල් REDECO ට ප්‍රතිපූර්ණය කර ඇත.
  - සේවක පඩි ලැයිස්තු පිරිවැය රු. 48,082,503/18 (2018: රු. 54,647,942/48)
  - කළමනාකරණ පිරිවැය රු. 3,806,554/56 (2018: රු. 4,140,664/80)
- මුහුදු වැලි ඇසිරීමේ සහ විකිණීමේ ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීම සඳහා සංස්ථාව 12% ක වාර්ෂික පොලී අනුපාතයකට රු.මිලියන 200ක කෙටි කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර ඇත. ප්‍රාග්ධන මුදල ආපසු ගෙවීම සඳහා වසර 2 ක සහන කාලයක් සහිතව මෙම ණය මුදල වසර 12 කින් ආපසු ගෙවිය හැකිය. තවද, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රු.මිලියන 40 ක පොලී රහිත අත්තිකාරම් ගෙවීමක් සිදු කර ඇත..

22.2 LRDC සර්විසස් (පෞද්.) සමාගම සංස්ථාවේ අනුබද්ධ සමාගමකි. රොෂාන් ගුණවර්ධන මහතා (2019.11.15 දක්වා), මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එම්.ආර්.ඩබ්ලිබ්. ද සොයිසා මහතා USP psc MSc (Defence)(2019.12.01 සිට) සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් වන අතර සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරුන් වන කේ. රාජපක්ෂ මහතා (2019.12.04 දක්වා) සහ එම්.ඒ.එස්.එම්.කේ.සේනාධීර මහතා, (2020.01.21 සිට) LRDC සර්විසස් (පෞද්.) සමාගමෙහිද අධ්‍යක්ෂවරුන් වේ.

2019 වර්ෂය තුළදී LRDC සර්විසස් (පෞද්.) සමාගම සමඟ සංස්ථාවට පහත සඳහන් ගනුදෙනු තිබුණි.

- රු. 52,552,166/17 (2018: රු. 47,286,973/92) ක වටිනාකමක් සඳහා ආරක්ෂක සේවා ලබා ගන්නා ලදී
- රු. 435,067,354/77 (2018: රු. 399,860,746/87/-) ක මිනිස්බල සේවාවන් ලබා ගන්නා ලදී.
- සංස්ථාවට අයත් දේපල භාවිතා කිරීම වෙනුවෙන් ලැබුනු කුලිය රු.240,000/- (2018: රු. 240,000/-)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

22.3 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ගනුදෙනු

සංස්ථාවේ ප්‍රධාන කළමනාකරුවන් වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සාමාන්‍යාධිකාරිවරයා සහ අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් දෙදෙනා වේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ගනුදෙනු පහත දැක්වෙන පරිදි වේ.

	සංස්ථාව	
	2019	**2018**
	රු.000	**රු.000**
ගෙවන ලද කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	10,676	9,916
ගෙවූ රැස්වීම් දින ගාස්තු	3,036	2,329

23. ඇපයට තබා ඇති වත්කම්

- රු.මිලියන 500ක් දක්වා බැංකු ඇපකර සහ ණයවර ලිපි ලබා ගැනීම සඳහා මෙම සංස්ථාව සහ ලංකා බැංකුව එකඟත්වයකට පැමිණ ඇත. සංස්ථාවට අයත් රු.මිලියන 500ක ස්ථාවර තැන්පතු මෙම මෙම පහසුකම ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස තබා ඇත.

- ගොඩකිරීම සඳහා සහ තොග සංචිත කිරීම සඳහා අක්-වෙරළ මුහුදු වැලි සහ මීටර් 4,000,000 ක් කැණීම සහ පොම්ප කිරීම සඳහා මුදල් යෙදවීමට සංස්ථාව විසින් 2018 පෙබරවාරි මස ලංකා බැංකුවෙන් රු.මිලියන 4,000 ක දිගු කාලීන ණය පහසුකමක් ලබා ගත්තේය. මෙම ණය සඳහා සුරක්ෂණයක් ලෙස පහත සඳහන් වත්කම් ඇපයට තබා ඇත.
  - සැලසුම් අංක 4336/SLLRDC/1 හි කැබලි අංක 5,6,7 සහ 8 හි මූලික උකස්කරය (උකසෙහි වටිනාකම රු.මිලියන 2,000)
  - රු.මිලියන 1,054.22ක සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පත්
  - මුතුරාජවෙල මුහුදු වැලි සංචිතය (උකස් වටිනාකම රු.මිලියන1,000)

24. පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව මූල්‍ය ප්‍රකාශනවල වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

25. බැඳීම් සහ අවිනිශ්චිතතා

25.1 අවිනිශ්චිතතා බැරකම්

අලාභහානි සහ වන්දි සඳහා ඉල්ලීම් කරමින් 2019.12.31 වැනි දින වනවිට සංස්ථාවට එරෙහිව ගොනු කරන ලද නඩු දහයක් (10) විභාගයට ගැනීමට නියමිතව තිබුණි. විස්තර පහත පරිදි වේ.

අ) රු. 1,409,425/-ක චෙතන ඉල්ලම්න් සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරිවරයෙකු විසින් ගොනු කරන ලද නඩුව.
ආ) අනතුරු සඳහා වන්දි ඉල්ලම්න් සංස්ථාවට එරෙහිව නඩු දෙකක් (2) ගොනු කර ඇත. මුළු හිමිකම්පෑම රු. 15,000,000/-කි.
ඇ) ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ඉල්ලම්න් සංස්ථාවට එරෙහිව ගොනු කරන ලද නඩු හතක් (7) විභාගයට ගැනීමට නියමිතව පවතී. මුළු හිමිකම්පෑම රු. 460,618,875/-කි.

ඉහත සඳහන් කළ මුදල් ප්‍රමාණයන් පැමිණිලිකරුවන් විසින් ඉල්ලා සිටින ලද මුදල් ප්‍රමාණයන් වන අතර සත්‍ය හිමිකමක් තිබේ නම්, එම මුදල අධිකරණය විසින් තීරණය කරනු ඇත.

25.2 බැඳීම්

2019 දෙසැම්බර් 31 දින වනවිට සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලට අනුෂංගිකව දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 398.25ක් වටිනා මිලදී ගැනීමේ බැඳීම් සඳහා සංස්ථාව ගිවිසුම්ගත වී ඇති නමුත් ඒ සඳහා වෙන් කිරීම් සිදු කර නොමැත.

26. සංසන්දනාත්මක තොරතුරු

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම සමඟ සැසඳීම සහතික කිරීම සඳහා පෙර වර්ෂය තුළ (2018) වාර්තා කර ඇති පහත සඳහන් අයිතමයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබේ.

	සමූහය	**සංස්ථාව**
	රු.000	**රු.000**
අ) වෙනත් මෙහෙයුම් ආදායම		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	113,306	96,028
පරිපාලන ව්‍යයම්වලින් මාරු කරන ලද සෙමින් සංසරණය වන වැඩිපුර වෙන් කිරීම	1,041	1,041
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**114,347**	**97,069**
ආ) පරිපාලන ව්‍යයම්		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	1,155,465	993,829
වෙනත් මෙහෙයුම් ආදායමට මාරු කරන ලද සෙමින් සංසරණය වන වැඩිපුර වෙන් කිරීම	1,041	1,041
පරිපාලන ව්‍යයම්වලින් විකුණුම් සහ ප්‍රවර්ධන ව්‍යයම්වලට මාරු කරන ලද පුවත්පත් දැන්වීම්	(668)	(668)
පරිපාලන ව්‍යයම්වලින් විකුණුම් සහ ප්‍රවර්ධන ව්‍යයම්වලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බදු	(24,347)	(24,347)
පරිපාලන ව්‍යයම්වලින් ක්‍රමක්ෂයට මාරු කරන ලද කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම	(318)	(318)
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**1,131,173**	**969,537**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

	සමූහය	සංස්ථාව
	රු.000	රු.000
ඇ) විකුණුම් සහ ප්‍රවර්ධන ව්‍යයදම්		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	91,408	91,093
පරිපාලන ව්‍යයදම්වලින් මාරු කරන ලද පුවත්පත් දැන්වීම්	668	668
පරිපාලන ව්‍යයදම්වලින් මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බදු	24,347	24,347
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**116,423**	**116,108**
ඈ) ක්‍රමක්ෂය		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	236,522	220,145
පරිපාලන ව්‍යයදම්වලින් මාරු කරන ලද කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම	318	318
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**236,840**	**220,463**
ඉ) විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	386,811	266,448
වෙළඳ සහ ගෙවිය යුතු වෙනත් දෑ වෙත මාරු කරන ලද හිමිකම් නොපැ පාරිතෝෂික වටිනාකම	2,231	2,231
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**384,580**	**264,217**
ඊ) වෙළඳ සහ ගෙවිය යුතු වෙනත් දෑ		
2018 වාර්ෂික වාර්තාවෙහි පෙර වාර්තා කළ මුදල	2,733,193	2,084,279
වෙළඳ සහ ගෙවිය යුතු වෙනත් දෑ වෙත මාරු කරන ලද විශ්‍රාමිකයන් සඳහා හිමිකම් නොපැ පාරිතෝෂික	2,231	2,231
සංසන්දනාත්මක අගයන් වර්තමානයේදී සකස් කිරීම	**2,735,424**	**2,086,510**

සංස්ථාවේ මූල්‍යමය විශේෂතා

	2019	2018	2017	2016	2015	2014	2013	2012
	රු.මි	රු.මි	රු.මි	රු.මි	රු.මි	රු.මි	රු.මි	රු.මි
ලාභ සහ අලාභ								
භාණ්ඩාගාර අරමුදල් සැපයූ ව්‍යාපෘති ආදායම	2,787	2,367	2,969	5,629	1,306	1,620	1,025	926
වෙනත් ව්‍යාපෘති සහ ප්‍රභවවලින් ලත් ආදායම	4,516	5,183	4,780	2,420	1,572	2,545	1,742	2,388
අන්තර්ඛණ්ඩ ආදායම	(766)	(453)	(406)	(239)	(362)	(459)	(264)	(214)
මුළු ආදායම	**6,537**	**7,097**	**7,343**	**7,810**	**2,516**	**3,706**	**2,503**	**3,100**
සෘජු පිරිවැය	(4,715)	(4,499)	(4,966)	(5,602)	(2,224)	(3,247)	(2,192)	(2,750)
දළ ලාභය	**1,822**	**2,598**	**2,377**	**2,208**	**292**	**459**	**311**	**350**
වෙනත් මෙහෙයුම් ආදායම	100	96	190	50	61	48	54	60
පොදු කාර්ය පිරිවැය	(1,260)	(1,369)	(1,224)	(926)	(1,010)	(676)	(430)	(574)
මෙහෙයුම් ලාභය/(අලාභය)	661	1,325	1,338	1,333	(657)	(169)	(65)	(164)
ශුද්ධ මූල්‍ය ආදායම	91	296	162	144	503	600	183	196
බදු සහ අයකිරීම් පෙර ලාභය	**752**	**1,621**	**1,500**	**1,476**	**(154)**	**431**	**118**	**32**
බදුකරණය	(96)	(472)	(359)	(283)	(3)	(85)	(14)	(100)
ඒකාබද්ධ අරමුදල සඳහා විශේෂ අයකිරීම	(200)	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	**456**	**1,149**	**1,141**	**1,193**	**(157)**	**346**	**104**	**(68)**
මූල්‍ය තත්ත්වය								
මුළු වත්කම්	17,731	17,502	14,733	13,100	9,181	8,393	6,369	5,662
ප්‍රාග්ධන සහ සංචිත	6,560	5,896	4,690	3,572	2,373	2,544	2,106	2,002
ජංගම නොවන බැරකම්	4,236	4,529	1,551	2,486	1,320	1,217	2,250	1,268
ජංගම බැරකම්	6,935	7,075	8,492	7,041	5,487	4,632	3,013	2,392
මූල්‍ය ප්‍රවාහය								
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය	(745)	1,467	579	2,272	444	231	(303)	(2,260)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය	667	(1,025)	(1,646)	5	(245)	(98)	797	(53)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය	(170)	(438)	(386)	(301)	(10)	(2)	(28)	(10)
මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම/(අඩුවීම)	**(248)**	**04**	**(1,453)**	**1,976**	**189**	**130**	**465**	**(2,325)**
වෙනත් තොරතුරු								
සේවකයන් සංඛ්‍යාව	1408	1432	1448	1432	1411	1477	1315	1150